ISSN 1391 - 1031
2016 ජුනි
22 වෙළුම 03 කලාපය

ආධාරය රු 30/=

# නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

පුවත්පතක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී

"එබඳු අලුත්, දුෂ්කර සහ ශ්‍රේෂ්ඨ කටයුත්තකදී අඩුපාඩුකම්, දුර්වලකම්, වැරදීම් සිදුවීම වැළැක්විය හැකි නොවේ. සමාජවාදය ගොඩනැගීමේ දුෂ්කරතාවයන්ට බිය වන අය, ඒවායින් තමන් බිය වැදීමට ඉඩ තබන අය, බලාපොරොත්තු සුන් කර ගන්නා සහ බියගුළු ලෙස විමති වන අය, සමාජවාදීහු නොවෙති."

**ලෙනින්**
**තෝරාගත් කෘති,**
**10 වෙළුම,**
**129 පිටුව**

**05 ආණ්ඩුව ණය...**




රටේ ආර්ථිකය පිළිබඳව වත්මන් ආණ්ඩුව අනුගමනය කරන ක්‍රියාමාර්ග මුළුමනින්ම අතාර්කික හා පරස්පර...

**07 යුග පෙරළි...**




ක්‍රමයෙන් සිදුවූ නිෂ්පාදන උපකරණයන්ගේ වර්ධනයට වැඩවසම් නිෂ්පාදන සම්බන්ධතා බාධා...

**09 විකිණීමේ අලුත්...**




යළි නව මුහුණුවරකින් විකිණීමට පණ දීමට ඉදිරිපත් වී ඇත්තේද ඔවුන්මය. ඒ, එ.ජා.ප.යට විකිණීම සඳහා වන...

**11 අසත්‍යයට එරෙහිව...**



විශේෂයෙන්ම මිත්‍යාවන් විශ්වාස කිරීමට ඉතිහාසයක් තුළ පුරුදු ජනතාවකට සත්‍යය පැවසීමට වඩා...

සංවාදය.......................... 03
තරුණ.......................... 04
ආවර්ජනා.......................... 06
කාන්තා.......................... 10
ජාත්‍යන්තර .......................... 12
වේදිකාව .......................... 13
විශේෂාංග.......................... 14


# බදුබරට එරෙහි සටන දිගටම

02 පිටුවට

## මනුෂ්‍යත්වයේ මහ ශ්‍රම මෙහෙයුම...



**යුක්තිගරුක දේශයක්! සාධාරණ සමාජයක්!! නිවහල් මිනිසෙක්!!!**



# වැඩ බිම

## බෝගල පතලේ සේවකයෝ ඉල්ලීම් දිනති



අන්තර් සමාගම් සේවක සංගමයේ නායකත්වයෙන් බෝගල පතලේ සේවකයින් විසින් පසුගියදා ආරම්භ කළ වැඩ වර්ජනය තුළින් සියලු ඉල්ලීම් දිනාගනිමින් ජයග්‍රාහීව අවසන් කළ බව එම සංගමයේ සභාපති වසන්ත සමරසිංහ සහෝදරයා පවසයි.

ඒ අනුව, සේවකයින්ගේ ඉල්ලීම් වන ජනවාරි සිට හිඟ වැටුප්ද සමගින් රු. 5000/= කින් වැටුප් වැඩිවීමක් ලබාගැනීම, වෛද්‍ය නිවාඩු දින 21 ලබාගැනීම, පැය 09 වැඩ දිනය වෙනුවට පැය 08 වැඩ දිනය දිනාගැනීම, නිලඇඳුම් ලබාගැනීම, සේවකයෙකු විශ්‍රාම යනවිට ත්‍යාගයක් ලබාදීම, වාර්ෂික විනෝද චාරිකාව ලබාගැනීම, අවුරුදු නිවාඩු ලබාගැනීම ඇතුළු ඉල්ලීම් 11ක් දිනාගැනීමට මෙම සේවකයෝ සමත් වූහ.

මෙම වැඩවර්ජනයට බෝගල පතලේ සියලු සේවකයින් එක්ව සිටි අතර, අඩි 1670 ක් පොළොව යට සත්‍යග්‍රහයක් කිරීමට සේවකයින් පිරිසක් එක්ව සිටියේ ඉල්ලීම් ලබාදෙන තෙක් පොළොව මතුපිටට ඒම ප්‍රතික්ෂේප කරමිනි.

## ආයුර්වේද සේවකයෝ උද්ඝෝෂණයේ



තමන්ගේ දීමනා ලබා දෙන ලෙස බලකරමින් ආයුර්වේද රෝහල් සේවකයින් විසින් පසුගියදා බොරැල්ල ආයුර්වේද රෝහල ඉදිරිපිට උද්ඝෝෂණ ආරම්භ කළ අතර ප්‍රතිචාර නොලැබුණු හෙයින් ඔවුහු ඊට පසුදින නැවත කොමසාරිස් කාර්යාලය වටලමින් නාවින්න ආයුර්වේද දෙපාර්තමේන්තුව ඉදිරිපිටදී සේවක උද්ඝෝෂණයක් පැවැත්වූහ.

මෙම උද්ඝෝෂණය අතරතුර කොමසාරිස්තුමා සමග පැවති සාකච්ඡාවේදී ඉල්ලීම් ලබාදෙන බවට වන එකඟතාවය සහිතව උද්ඝෝෂණය තාවකාලිකව අත්හිටුවනු ලැබිණි. 2015 ජූනි මාසයේ සිට අනුමත රු. 1000/-ක විශේෂ දීමනාව සහ 2016 ජනවාරි සිට අතිකාල දීමනාව ලබා නොදීමට එරෙහිව මෙලෙස සේවකයෝ විරෝධතා ක්‍රියාමාර්ගවල නිරත වූහ.

## කුමන්ත්‍රණ පරාදයි - නියෝජිතයින් 317න් 291ක් ලංකා ගුරුසේවා සංගමයට




පසුගියදා පැවති අධ්‍යාපන සමුපකාර නිලවරණයෙන් ලංකා ගුරුසේවා සංගමයේ 'අපේ කණ්ඩායම'ට ඉතා විශිෂ්ට ජයග්‍රහණයක් ලැබුණි. ඒ අනුව රට පුරා පත්වී ඇති නියෝජිතයින් 317න් 291ක් ලංකා ගුරුසේවා සංගමයේ අපේ කණ්ඩායමට ලැබී ඇත. ඒ අතරින් ජයවර්ධනපුර, පිළියන්දල, හෝමාගම, මහනුවර, ගම්පහ ආදී බොහෝ කලාපවල සියලුම නියෝජිතයින් ගුරු සේවා සංගමයේ නියෝජිතයින්ගෙන් තේරී පත් වී ඇත. 2008ට වසරේ පැවති නිලවරණයෙන් ලංකා ගුරු සේවා සංගමය 2/3 ක විශිෂ්ට ජයග්‍රහණයක් ලබා ගැනීමෙන් පසු රාජපක්ෂ ආණ්ඩුව නීති විරෝධීව එහි පාලනය සියතට ගත් අතර ඉන්පසු මේ දක්වා එය ඉතා දූෂිත ආයතනයක් බවට පත් වී තිබුණි.

ලංකා ගුරුසේවා සංගමයේ අඛණ්ඩ මැදිහත්වීමෙන් නැවත නිලවරණය ලබා ගැනීමට හැකිවූ අතර එහිදී 2008ට වසරටත් වඩා වැඩි නියෝජිතයින් පිරිසක් ජයග්‍රහණය කර තිබීම විශේෂත්වයකි. ඒ අනුව නිලවරණය සඳහා ඉදිරිපත් වූ ශ්‍රී ලංකා, එ.ජා.ප. පක්ෂ හා සම්බන්ධ නියෝජිතයින් පරාජයට පත් වී ඇත. මේ සම්බන්ධයෙන් අදහස් දක්වන ලංකා ගුරුසේවා සංගමය පවසන්නේ, පැවති රාජපක්ෂ ආණ්ඩුවේත් වර්තමාන හවුල් ආණ්ඩුවේත් දූෂිත පාලනය පිළිබඳ නිවැරදි අවබෝධයක් සමුපකාර සාමාජිකයා අත්විඳීමේ ප්‍රතිඵලය විසින් මෙවැනි නිවැරදි තීරණයක් ලබාදීමට සාමාජිකයා දිරිගන්වා ඇති බවයි.

## රාජකාරී කප්පාදුවට එරෙහිව උපාධිධාරීහු උද්ඝෝෂණයේ



රට පුරා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 332ක ග්‍රාමසේවා වසම්වලට අනුයුක්තව රාජකාරී කරන සංවර්ධන නිලධාරීන් ප්‍රමාණය 16,000කට ආසන්න ප්‍රමාණයකගේ රාජකාරී කප්පාදුවට එරෙහිව පසුගියදා කොළඹදී දැවැන්ත උද්ඝෝෂණයක් පවත්වනු ලැබිණි.

රැකියාලාභී උපාධිධාරීන්ගේ සංගමය මගින් සංවිධානය කරන ලද මෙම දැවැන්ත උද්ඝෝෂණය සඳහා රට පුරා සංවර්ධන නිලධාරීහු දහස් ගණනක් සහභාගි වූහ. කොළඹ කොටුව දුම්රියපොළ ඉදිරිපිටදී පවත්වන ලද උද්ඝෝෂණයෙන් අනතුරුව අග්‍රාමාත්‍ය කාර්යාලය දක්වා පාගමනක් පැවැත්වූ අතර පොලිස් බාධක හේතුවෙන් එම පෙළපාලිය අතරමගදී නැවැත්වීමට සිදුවිය. කෙසේ වුවද මෙම විරෝධතා ක්‍රියාමාර්ග යෙන් පසුව අග්‍රාමාත්‍ය ලේකම්වරයා ඇතුළු නිලධාරීන් සමග පවත්වන ලද සාකච්ඡාවෙන් පසු නැවත සියලු සංවර්ධන නිලධාරීන් අදාළ රාජකාරීවල පිහිටුවීමට තීරණය කිරීමෙන් සටන ජයග්‍රහණය කරන ලදී.

මෙහිදී රැකියාලාභීන්ගේ උපාධිධාරීන්ගේ සංගමයේ ලේකම් චන්දන සූරියආරච්චි සහෝදරයා පැවසූයේ උපාධිධාරීන්ට රැකියා අහිමි කළ යුගයක දැවැන්ත අරගල හරහා රැකියා ලබාගැනීමෙන් ජයග්‍රහණ අත්කරගත්තා සේම හිමිව තිබෙන රාජකාරී කප්පාදුවට එරෙහිවත් සිදු කළ දැවැන්ත අරගලය හේතුවෙන් මෙම ජයග්‍රහණය අත් කර ගත හැකි වූ බවය.

## බදුබරට එරෙහි...

මුල් පිටුවෙන්

පසුගිය සියලු ආණ්ඩුවල වැරදි ආර්ථික ප්‍රතිපත්තිවල ප්‍රතිඵලයක් ලෙස උත්සන්න වී ඇති ආර්ථික අර්බුදයේ සමස්ත බර වත්මන් මෛත්‍රී-රනිල් හවුල් ආණ්ඩුව විසින් ජනතාව මත පැටවීමට ගනු ලබන උත්සාහය පරාජය කරලීම සඳහා අඛණ්ඩ අරගලයක් දියත් කිරීමට ජනතා විමුක්ති පෙරමුණ විසින් තීරණය කර තිබේ.

මේ වන විට ආණ්ඩුව විසින් අධ්‍යාපන, සෞඛ්‍ය, දුරකථන ඇතුළු අත්‍යාවශ්‍ය සේවා හා සිල්ලර වෙළඳාම මතද වැට් බදු ඉහළ නැංවීමට කටයුතු කර ඇති අතර සියලු පාරිභෝගික භාණ්ඩ හා සේවාවන්හි මිල ගණන් විශාල ලෙස ඉහළ ගොස් ඇත. මේ හේතුවෙන් ජනතාව විශාල අසීරුතාවයකට පත්ව සිටියෙදී වත්මන් ආණ්ඩුවේ මැති ඇමතිවරු පැවති පාලනයන් මෙන්ම සුපුරුදු පරිදි ජාතික ධනය නාස්තිකාරී ලෙස වියදම් කරමින් සිටිති.

මේ තත්වයට එරෙහිව ජනතා විමුක්ති පෙරමුණ අසාධාරණ වැට් බදු හකුළාගන්නා ලෙස බලකරමින් පසුගිය 30වැනිදා ජනතාව දැනුවත් කිරීමේ පත්‍රිකාවක් බෙදාහරිමින් ජනතාව වෙනුවෙන් සටන් ක්‍රියාමාර්ග ආරම්භ කළේය. එහි මීළඟ පියවර වශයෙන් ජූනි 03වැනිදා බදුබරට එරෙහිව කොළඹදී ජනතා උද්ඝෝෂණයක් කැඳවීමටද කටයුතු කර තිබේ. මීට අමතරව පවතින ආර්ථික අර්බුදයේ සැබෑ තත්වය හා ඊට සැබෑ විසඳුම් සෙවිය හැකි ආකාරය පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා එහි ආරම්භයක් ලෙස 'බදුබර හා බිඳවැටෙන ආර්ථිකය' නමින් ප්‍රාදේශීය මට්ටමින් සම්මන්ත්‍රණ 100ක් පැවැත්වීමට ජ.වි.පෙ. තීරණය කර තිබේ.

රාජ්‍ය සම්පත් පෞද්ගලීකරණය හා රට තව තවත් ණය බරක ගිල්වීම හැරෙන්නට ආර්ථික වශයෙන් වෙනත් සැලසුමක් නොමැති මේ ආණ්ඩුවද අනුගමනය කරමින් සිටින්නේ, මෙම තත්වයට රට ඇදවැට්ටවූ බංකොලොත් නව ලිබරල් විවෘත ආර්ථික පිළිවෙතමය. මෙම තත්වය තුළ ආණ්ඩුවේ අසාධාරණ බදුබරට හා නාස්තියට එරෙහිව ජනතාව පෙළගැස්වීමට මෙන්ම ජනතාවාදී නව ආර්ථික ක්‍රමයක අවශ්‍යතාවය පිළිබඳ සංවාදයක් ඇතිකර ගැනීමටද අපේක්ෂා කරන බව නියමුවා කරන ලද විමසුමකට පිළිතුරු දෙමින් ජ.වි.පෙ. ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා පැවසීය.

16 පිටුවෙන්

## මේ අයුක්තිය...

කරන තෙක් වෙහෙස නොබලා ඉදිරියට යනවා. සියලු ධනපති පක්ෂ බංකොළොත් වී තිබෙනවා. ජනතාවට තමන්ගේ පක්ෂය ලෙස අභිමානයෙන් කිව හැකි එකම පක්ෂය ජනතා විමුක්ති පෙරමුණයි. සහතික ලෙසම අපේ පරම්පරාව විසින් ජනතාව ජයග්‍රහණය කරවනවා. අපේ තරුණ ශිෂ්‍ය කම්කරු කාන්තා සමිති ඒ ඒ ක්ෂේත්‍රවල පුළුල්ම ජනතාව ඒකරාශී කරගත් ඒවා බවට පත්විය යුතුයි. මේ මැරතන් තරඟය අපි ජයග්‍රහණය කළ යුතුයි. මීට වඩා හොඳ අවස්ථාවක් තවත් නැහැ. අපි සියලු දෙනා කලින්ට වඩා වෙහෙස වී වැඩි කැපකිරීමක් කරමු. මේ සටන ජයග්‍රහණයෙන් කෙළවර කරමු."

## මේ කෘතියේ සෑම...

ගසමින් වැඩෙනවා. ඒ ජනතා විමුක්ති පෙරමුණයි.




**ජවිපෙ සත්‍යයේ අවිවලින් කරන සටන අනිවාර්යෙන් දිනනවා!**

**ජ.වි.පෙ. ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා**

මතවාදයෙන් සටන් කිරීමට නොහැකි අය අවලාදවල, මඩවල අවිය අතට ගන්නා බව පැවසූ ජ.වි.පෙ. ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා, අවලාදවලට අවලාදවලින් හෝ මඩවලට මඩවලින් නොව අදහස්වලින් සටන් කිරීමට ජ.වි.පෙ.ට ශක්තිය ඇති බවත් ජවිපෙ සත්‍යයේ අවිවලින් සටන් කරන බවත් අනිවාර්යෙන් ඒ සටන දිනන බවත් සත්‍යය ජයගන්නා බවත් අවධාරණය කළේය.

'71 අප්‍රේල් නඩු විභාගය; විජේවීරගේ හෘදය සාක්ෂිය' නැමති කෘතිය එළිදැක්වීමේ උත්සවයේදී අදහස් දැක්වූ ටිල්වින් සිල්වා සහෝදරයා වැඩිදුරටත් මෙසේද ප්‍රකාශ කළේය.

"70 දශකයේ ලෝකය පුරා විප්ලවවාදී රැල්ලක් ඇතිවුණා. සන්නද්ධ අරගලය ලෝක මාදිලිය වුණා. කියුබාව සන්නද්ධ අරගලයක් කළා. බොලිවියාව සන්නද්ධ අරගලයෙන් පරාජය වුනා. නිකරගුවාව, අප්‍රිකානු රටවල්, වියට්නාමය තුළ කාම්බෝජය, ලාඕසය වැනි රටවල විමුක්ති අරගල පැනනැගුණා. ඒවා 71ට බලපෑමක් කළා. දැන් සන්නද්ධ අරගලය වලංගු නැහැ. දැන් තිබෙන්නේ මතවාදී අරගලයක්. අදහස්වලින් සටන් කරන යුගයක්. ෆේස්බුක්වලින් සටන් කැඳවන කාලයක්. අපි කරන්නේ අදහස්වලින් කරන සටනක්. එම සටන දිනන්න පුළුවන් කියලා අපි විශ්වාස කරනවා.

වමේ ව්‍යාපාර මර්දනයේදී පාලක පංතිය වමෙන් පලාගිය සහ පන්නා දැමූවන් යොදා ගන්නවා. ජර්මන් කොමියුනිස්ට පක්ෂය තහනම් කිරීමේදී මලයානු කොමියුනිස්ට් පක්ෂය විනාශ කිරීමේදී මේ උපක්‍රම භාවිතා කරගත්තා. ජවිපෙටත් ඒ අත්දැකීම තිබෙනවා. ජවිපෙන් ගිය විවිධ අය ජවිපෙට අවලාද බොරු ප්‍රචාර යවනවා. ධනපති පාලකයින් නිර්ධන පංති පක්ෂ අතුගා දමන්නට උත්සහ කිරීම අලුත් දෙයක් නෙවෙයි. මර්දනය කරන්න බැරිවන විට කුලියට ලියන්නන් පාවිච්චි කරලා මඩ අවලාද ගොතනවා. ඒ සියල්ල පරාජය කරලා සමාජ ව්‍යාපාරය ඉදිරියට යනවා. එවැනි වටපිටාවක තමයි අද මේ කෘතිය එළිදකින්නේ."

## වංචා-දූෂණ සම්බන්ධ...



ඔහු මේ බව පැවසුවේ, ජනතාවට වැට් බදු පනවා තිබියෙදී ආණ්ඩුව විසින් අයවැයෙන් සම්මත නොකරන ලද විශාල මුදල් ප්‍රමාණයක් ආණ්ඩුව විසින් තමන්ගේ පරිභෝජනයට වෙන්කරගෙන තිබීම සම්බන්ධයෙන් පැහැදිලි කිරීම සඳහා පසුගිය 10වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පවත්වන ලද මාධ්‍ය සාකච්ඡාවකදීය. මෙම මාධ්‍ය හමුව සඳහා ජ.වි.පෙ. නායක අනුර දිසානායක සහෝදරයාද එක්ව සිටියේය.

දේශපාලනඥයින් සොරා කන්නේ මහජන මුදල්. ජනතාව විසින් පත්කරගන්නා ආණ්ඩුව ජනතා මුදල් කොල්ලකනවා නම් ඒ අවනඩුව කියන්න වෙන්නේත් ජනතාවටමයි. දූෂිතයන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සිදුකළ යුත්තේ නීතිපතිවරයා, අධිකරණය, අල්ලස් කොමිසම වැනි ආයතනයි. ඒ ආයතනත් කටයුතු කරන්නේ දේශපාලනඥයන්ගේ වුවමනාවට නම් ඒ සම්බන්ධයෙන් තීරණ ගතයුතු වන්නේ ජනතාවයි. ඒ නිසා අපි යෝජනා කරනවා, කෝප් කමිටුව සහ අනෙකුත් ගිණුම් කාරක සභා මාධ්‍යයට විවෘත කරන්න කියලා. බොහෝ රටවල්වල ඒ ක්‍රමය ක්‍රියාත්මක වෙනවා. ඒ සඳහා නීතිමය තත්වය වෙනස් කරන්න කියලා අපි කථානායකවරයාගෙන් ඉල්ලනවා. මෙම ගිණුම් කාරක සභාවල විමර්ශන, මාධ්‍ය හරහා ජනතාවට හෙළිදරව් කරන්න ඕනෑ." හඳුන්නෙත්ති සහෝදරයා වැඩිදුරටත් කියා සිටියේය.

නියමුවා
ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත
464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com

# ගංවතුරින් අනාථ වූ ආණ්ඩුව

පසුගිය දිනවල ඇදහැලුණු මහා වැසි නිසා ලංකාවේ ප්‍රදේශ කිහිපයක ගංවතුර ගැලීම නිසාත් කඳු නායයාම නිසාත් ගස් කඩාවැටීම නිසාත් විශාල ජනතාවක් පීඩාවට පත්වූහ. අරණායක ගම්මානයක්ම වැළලී ගිය අතර කොළඹ හා ගම්පහ දිස්ත්‍රික්කවල කැළණි ගඟ ආශ්‍රිතව විශාල ගංවතුර ආපදාවක් ඇතිවිය. මෙය ස්වභාවික විපතක් නිසා ආණ්ඩුවට බැණීමෙන් ඵලක් නැතැයි ඇතැමුන් සිතන අතර ගංවතුරටත් ආණ්ඩුව පලිදැයි ආණ්ඩුවේ සමහරු අසති.

සැබැවින්ම ස්වභාවික ක්‍රියාකාරකම්වලට ආණ්ඩුව සෘජුව වගකිවයුතු නැත. එහෙත් මේ ස්වභාවික විපත්ම නොව දිගුකාලීනව සිදුවූ පරිසර විනාශය, අක්‍රමවත් ඉදිකිරීම් විසින් කැඳවා ගත් විපත්ය. මහා වැස්සක් ජනතාවට ජීවිත, නිවාස හා ඇඳිවත පවා අහිමිකරන ව්‍යසනයක් වීම ගැන ධනවාදයේ සියලු ආණ්ඩුවලට වගකීමක් ඇත. මෙහිදීද තමන්ගේ ඇඟ බේරාගැනීමට උත්සාහ කරන ආණ්ඩුවේ සමහරු අනවසර ඉදිකිරීම් ගැන, අනතුරු ඇඟවීම් නොසලකා ගෙදර සිටීම ගැන, ජනතාවටම දොස් කියති. මේවාට වගකිව යුත්තේ ජනතාවම නම් ආණ්ඩුව කුමකටද යන ප්‍රශ්නයද මතුවේ.

මෙම ස්වභාවික විපතෙන් ආණ්ඩුවද අනාථ විය. ආපදාවකදී මැදිහත්වීමට ගොඩනැගූ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය පුවත්පත් නිවේදනවලට පමණක් සීමා විය. එයද ආපදාවට ලක්ව තිබේ. සන්නද්ධ හමුදා මැදිහත්කළ තැන්වල හැර මෙහිදී රාජ්‍ය යාන්ත්‍රණය හා ආණ්ඩුවේ පරිපාලන යාන්ත්‍රණය මුළුමනින්ම අකර්මණ්‍ය වී තිබුණි. පොදු ජනතාවගේ ස්වේච්ඡා මැදිහත්වීම් නොවන්නට බත් පැකට්ටුවක් හෝ දීමට ආණ්ඩුවේ යාන්ත්‍රණය දැක්වූ අසමත්කම නිසා ජනතාවට කුසගින්නේ සිටීමට ඉඩ තිබුණි. ආණ්ඩුවේ නායකයෝ මාධ්‍ය නිවේදනවලට හා ගංවතුර නැරඹීමට පමණක් සීමාවූහ. බිමේ හදිසි ආපදාවකදී සක්‍රීය කළ හැකි යාන්ත්‍රණයක් ආණ්ඩුවට නොවීය. එවැන්නක් තිබුණේ ජ.වි.පෙ.ටය. ඒ, 'රතු තරුව සහන සේවා බලකාය'ය.

මෙම බරපතළ ස්වභාවික විපතට ආණ්ඩුවේ මැදිහත්වීමේ සැලැස්මක් නොමැතිකම හා මන්දෝත්සාහීකම පසෙක තැබුවත් මෙවන් ව්‍යසන පිටුපස වන වගකීමෙන් ධනවාදයටත් ධනවාදය තුළ මෙරට පාලනය කළ සියලු පාලකයන්ටත් ගැලවිය නොහැක. තදවැසිවලදී උස් කඳු, දුර්වල කඳු නාය යන බව සැබෑය. ඒවා හඳුනාගැනීමට රජයේ ආයතන තිබේ. එහෙත් නාය යන වර්ගයේ කඳුමුදුන්වලත් කඳු පාමුලත් නිවෙස් අටවාගෙන ජනතාවට ජීවත්වීමට සිදු ව ඇත්තේ ඇයි? එසේම හැම වැස්සකටම රටේ කඳු නාය යන්නේ ඇයි? පාලකයන් පිළිතුරු දිය යුතු ප්‍රශ්න ඒවාය. ඉවක් බවක් නැතිව පරිසරය විනාශ කිරීමේත් අධික බෑවුම් සහිත කඳු එළිපෙහෙළි කර ඉදිකිරීම් කිරීමේත් ප්‍රතිඵල නායයාම්ය. ගංවතුර ඉක්මනින් බැස නොයාමටද හේතුව වී ඇත්තේ සැලසුමකින් තොරව සිදුකර ඇති ඉදිකිරීම්, පහත්බිම් ගොඩකිරීම් හා වතුර බැසයන මාර්ග අවහිර කිරීම්ය. මේවාට ජනතාවට දොස් පවරා ඇඟ බේරා ගැනීමට පාලකයන්ට නොහැක. සැලසුම් සහගතව කටයුතු කිරීමට තනි තනි මිනිසාට නොහැක. ආණ්ඩුවක පාලනයක් අවශ්‍ය වන්නේ ඒවාටය. අනතුරුදායක නොවන ස්ථානවල ජනතාවට නිවාස තනාදීමේ හෝ නිවාස තනා ගැනීමට උපදෙස් හා උදව් වීමේ ජාතික වැඩපිළිවෙළක් අපේ රටේ කවදාවත් තිබී නැත. මිනිස්සු ජීවත්වත්වීමට අවශ්‍ය නිසා තමන්ට හැකි තැන්වල හැකි ලෙස නිවාස සදා ගනිති. එය එසේ වන්නේ පාලනයේ සැලැස්මක් නැතිකම නිසාය. පහත්බිම්වල අනවසර ඉදිකිරීම්ද එසේය. සමහර 'අනවසර' ඉදිකිරීම් ඡන්ද ගැනීම සඳහා දේශපාලකයන් විසින්ම ධෛර්යය දී ඉදිකළ ඒවාය. එම නිසා මෙම විපත් පිටුපස ඇත්තේ සැලැස්මක් නැතිකමේ, ජාතික ප්‍රතිපත්ති නැතිකමේ ප්‍රතිඵලය මිස අන් යමක් නොවේ.

කඳු හා වනාන්තර සංරක්ෂණය කිරීමේ ප්‍රතිපත්තියක් හා විද්‍යාත්මක වැඩපිළිවෙළක්, නිවාස ඉදිකිරීමේ, මාර්ග තැනීමේ, ඇළවේලි, ගංගා නඩත්තු කිරීමේ පොදු වැඩපිළිවෙළක්, ලංකාවේ ක්‍රියාත්මක වන්නේ නැත. මේ සඳහා වූ ආයතනද, අමාත්‍යාංශද, ඇමතිවරුද දුසිම් ගණන් සිටියද සියල්ල සිදුවී ඇත්තේ අක්‍රමවත්වය; අවිද්‍යාත්මකවය; සැලසුම් රහිතවය. ජනතාව මේ වන්දි ගෙවන්නේ, පාලකයින්ගේ වැරදිවලටය. මෙය නිවැරදි වනු ඇතැයි සිතිය නොහැක. මේ ගංවතුරෙන් පසුද ජනතාව හිටපු තැන්වලට පදිංචිවනු ඇත. යළි කඳු පාමුලටම යනු ඇත. අවතැන් වූවන්ට ගෙවල් ඉදිකරදීම සිදු නොවනු ඇත. මීරියබැද්දේ ජනයාගේ ගැටලුව ඊට නිදසුන්ය. ධනවාදය මිනිසුන්ට ජීවත්විය හැකි පරිසරයක් හැදීමට අසමත් බව යළි යළිත් පෙන්වා ඇත.

පරිසර විනාශය නිසා සිදුවන මේ ව්‍යසනය මීට වසර 50කට පෙරද දුටු එකම දේශපාලන නායකයා රෝහණ විජේවීර සහෝදරයාය. මේ ව්‍යසනය සඳහා ඔහු සතුව විසඳුමක්ද තිබිණි. එහෙත් ධනපති පංතිය ඊට ඉඩ දුන්නේ නැත. දැන්වත් මෙරට ජනතාව මේ පිළිබඳව සිතා බැලිය යුතුය.

විද්‍යාත්මක වැඩපිළිවෙළක් මත පිහිටා ජනතාවගේද සහාය ලබාගෙන රට අලුතෙන්ම නිර්මාණය කළ යුතුය. එයට තරමක් කලක් ගතවිය හැකි වුවද මෙවැනි විපත් නවතා ගැනීමේ එකම මඟ එය වේ. විපතක් වූ විට ආහාරපාන ටිකක් බෙදාදී ප්‍රශ්නය අමතක කර දමනවා වෙනුවට දැන් අවශ්‍යව ඇත්තේ, මෙවැනි විපත් නවතාලීම සඳහාවූ විධිමත් වැඩපිළිවෙළකි.

ගංවතුරක් ගැලූ පසු අවතැන්වන ආණ්ඩුවලට, ගංවතුර උවදුර විකුණා විදේශලින් ආධාර ගැනීමට පමණක් බලා සිටින ආණ්ඩුවලට, මාධ්‍ය නිවේදනවලින් එහා ප්‍රායෝගික ක්‍රියාකාරිත්වයක් නැති ආණ්ඩුවලට රටක් ඉදිරියට ගෙනයා නොහැක. 2004 සුනාමියේදීද මෙම අත්දැකීමම ජනතාවට ලැබුණි. එහෙත් ඉන් ජනතාව ඉගෙනගත් බවක් පෙනුණේ නැත. එබැවින් දැන්වත් මෙම තත්වය වෙනස් කිරීමට ජනතාව තීරණයක් ගත යුතුය. ස්වභාවික විපත් අස්වාභාවික ඛේදවාචක බවට පත්කොට ඇති පාලනයක් වෙනුවට ස්වාභාවික විපත් අවම කළ හැකි හා ඉන් ජනතාව මුදාගත හැකි පාලනයක් සඳහා අලුතින් සිතිය යුතු කාලය පැමිණ ඇත.

# නව සමාජයක් වෙනුවෙන් ජනතා බලය ගොඩනැගීමට අප සමඟ එක්වන්න



ජ.වි.පෙ. ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා

***නියමුවා:- මේ වනවිට රටේ දේශපාලනය පෙළගැසෙමින් තිබෙන ආකාරය ඔබ දකින්නේ කොහොමද?***

***ටිල්වින් සිල්වා සහෝදරයා:-*** මේ වනවිට නිර්මාණය වෙමින් පවතින රටේ දේශපාලන පෙළගැස්මට බලපාන ප්‍රධාන සාධක කිහිපයක් තිබෙනවා. එකක් තමයි රට මුහුණ දී තිබෙන විශාලතම මූල්‍ය අර්බුදය. අනික තමයි, ආණ්ඩුවේ අභ්‍යන්තර ප්‍රතිවිරෝධය හා ආණ්ඩුවේ පක්ෂ තුළ ඇති ප්‍රතිවිරෝධතා විසින් නිර්මාණය කරන ආණ්ඩුවේ අභ්‍යන්තර අර්බුදය. ඒ වගේම ආණ්ඩුවේ නොහැකියාව, අසමත්කම නිසා, ජනතා ගැටලුවලට විසඳුම් නොලැබීම හා ජනතාව මත බදුබර පැටවීම නිසා ඇතිවන ආණ්ඩු විරෝධය. මෙම අර්බුදයන් විසින් රට තුළ මීට පෙර නොතිබූ දේශපාලන පෙළ ගැස්මක් නිර්මාණය කරනු ලබමින් තිබෙනවා.

***නියමුවා:-ඔබ මූල්‍ය අර්බුදයක් ගැන සඳහන් කළා. මොකක්ද මේ මූල්‍ය අර්බුදය?***

***ටිල්වින් සිල්වා සහෝදරයා:-*** ලංකාවේ ධනපති ක්‍රමය තුළ එය මුහුණ දෙන පොදු ආර්ථික අර්බුදය උත්සන්න වෙලා තිබෙනවා. එය මේ මොහොතේ ප්‍රකාශයට පත්වන්නේ මූල්‍ය අර්බුදයක් ලෙස. ඒ කියන්නේ ආණ්ඩුවට මුදල් නැහැ. ආදායම් නැහැ. ඒ නිසා අත්‍යවශ්‍ය වියදම් පියවා ගැනීමට පවා නොහැකි වෙලා. මේකට ප්‍රධාන හේතුව පසුගිය කාලය පුරාම රට පාලනය කළ ආණ්ඩු නිෂ්පාදන මාර්ග දියුණු කරනවා වෙනුවට ණය මත ජීවත්වීමට පුරුදුවීම හා රජය සතුව තිබූ නිෂ්පාදන මාර්ග හා සම්පත් විකුණා දැමීමයි. ඒ වගේම මේ ආණ්ඩුවලට දැක්මක්, සැලැස්මක් තිබුණේ නැහැ. ඔවුන් විශාල වශයෙන් මහජන මුදල් නාස්ති කළා. හොරකම් කළා. අනාගත පරපුර උගස් කර ණය ගත්තා. දැන් රට ණය උගුලක සිරවෙලා. එය කොතරම්ද කියනවා නම් අගමැතිවරයා පාර්ලිමේන්තුවේදී ප්‍රකාශ කළ පරිදි නිල හා නිල නොවන රාජ්‍ය ණය රුපියල් බිලියන 10,000ක් පමණ වෙලා. 2015 අග වනවිට රටේ ණය ප්‍රමාණය දළ දේශීය නිෂ්පාදිතයෙන් 76%ක් වෙලා. මේ නිසා තව තවත් ණය ගැනීමට ආණ්ඩුවට සිදුවෙලා. බදුබර වැඩිකිරීමට සිදුවෙලා. මෙහි කෙළවරක් නැහැ.

***නියමුවා:-හොඳයි, මෙම ණය අර්බුදයට ආණ්ඩුවට විසඳුම් තිබෙනවාද? මෙය ජනතාවට බලපාන්නේ කොහොමද?***

***ටිල්වින් සිල්වා සහෝදරයා:-*** පැහැදිලිවම මෙම මූල්‍ය අර්බුදයට ධනපති ආණ්ඩුවලට විසඳුම් නැහැ. මේ සඳහා තිබෙන එකම විසඳුම නිෂ්පාදන මාර්ග වැඩිකිරීම හා නිවැරදි ආර්ථික කළමනාකරණයයි. ඒත් මේ අයට එය කළ නොහැකියි. ඒ නිසා ආණ්ඩුව එක් අතකින් තව තවත් ණය ගන්නවා. මේ වනවිට ආණ්ඩුව ආසියානු සංවර්ධන බැංකුවෙන්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින්, ඉන්දියාවෙන් ගත්තු ණය එකතු කළාම ඩොලර් බිලියන 4.6ක් පමණ වෙනවා. ඒත් නිෂ්පාදිතයේ පැත්තට කිසිම මැදිහත්වීමක් නැහැ. තියෙන නිෂ්පාදිතයත් නැතිවන වර්ගයේ ගිවිසුම් අත්සන් කරගෙන යනවා. එට්කා ගිවිසුම එවැන්නක්. අනෙක් අතට රාජ්‍ය ආයතන පුද්ගලික අංශයට බාරදී නිදහස් වෙන්න හදනවා. ඒ වගේම ජනතාව මත දැවැන්ත ලෙස බදුබර පටවනවා, ජනතාවට අයවැයෙන් පොරොන්දු වූ සමහර සහන පවා ලබාදීම මඟහරිනවා. මෙහි ප්‍රතිඵලය වන්නේ, රට තව තවත් ණය උගුලේ හිරවීමත් ජනතාව මත තව තවත් බර පැටවීමත් ඒ නිසාම ජනතා විරෝධයකට මුහුණදීමට ආණ්ඩුවට සිදුවීමත් තමයි.

***නියමුවා:-ආණ්ඩුවේ අභ්‍යන්තර අර්බුද මේ දේශපාලන තත්වයට බලපාන්නේ කුමන ආකාරයකින්ද?***

***ටිල්වින් සිල්වා සහෝදරයා:-*** මේක ශ්‍රීල.නි.ප., එ.ජා.ප. හවුල් ආණ්ඩුවක්. ඒත් මේ පක්ෂ දෙක රාජ්‍ය බලය බොදාගැනීමේදී, තනතුරු වරප්‍රසාද ගැනීමේදී, ඒවාට උනන්දු වුණාට අර්බුදවලදී එකිනෙකා කර අරිනවා. බදුබර වැඩිවී ඒ මත ජනතා විරෝධය එනවිට ශ්‍රීල.නි.ප.ය ඉන් කර අරිනවා. එය එ.ජා.ප.ය පිට පමණක් තබනවා. බොහෝ කාර්යයන්වලදී එහෙමයි. ඒ නිසා ආණ්ඩුව දුර්වලයි. ඒකමිතියක් නැහැ. අනෙක් අතට මේ පක්ෂ දෙකම දුර්වලයි. එ.ජා.ප.ය උඩින් ආණ්ඩු බලය ගත්තට බිමේ බලයක් ඔවුන්ට නැහැ. පළාත් පාලන ඡන්ද පැවැත්වීමට නොහැකිවීම නිසා මේ අයගේ බිම් මට්ටමේ බලය දුර්වල වෙලා තිබෙනවා. අනෙක් අතට ශ්‍රීලනිපට බෙදීල. එම පක්ෂය හරියටම දෙකඩ කරලා තිබෙනවා. පසුගිය මැයි දිනයේදී පෙන්නුම් කළේ ශ්‍රීල.නි.ප.ය හරියට පළු දෙකට කැඩිල තියෙන එක. ඉන් මෛත්‍රී පිල ආණ්ඩුවේ. ඒ නිසාම රට තුළ නිර්මාණය වන ආණ්ඩු විරෝධය ඔවුන්ටත් එල්ල වෙනවා. අනෙක් අතට රාජපක්ෂ පිල කටයුතු කරන්නේ රාජපක්ෂ පවුල වෙනුවෙන්. ඔවුන්ගේ මේ මජර හැසිරීම නිසා ඔවුන්ට පොදු විපක්ෂයක භූමිකාව අතට ගන්න බැරිවෙලා තිබෙනවා. ඒ නිසා

15 වැනි පිටුවට



YES WE CAN

# දුරකතන අයිතිය උදුරා ගැනීමට එරෙහි වෙමු...

තාරුණ්‍යය තුළ රැදි ජවය, ශක්තිය, සැහැල්ලුව, නැවුම් බව සමාජ ගතිකත්වය කෙරෙහි සෘජුවම බලපායි. තාරුණ්‍යය තම දැනුම හා නිර්මාණාත්මක අදහස් ලබාදෙමින් ජීවත්වන සමාජය පවතින තත්වයන්ට වඩා වෙනස් කිරීමට නිරන්තර දායකත්වයක් ලබා දීමට බලා සිටී. එවන් තාරුණ්‍යයක තම හැකියාවන් එළිදැක්වීමට අවස්ථාවන් සලසා දෙනු වෙනුවට අද අප දකින්නේ එම අවස්ථාවන් අහිමි කරන, සමාජ ආර්ථික දේශපාලනික රාමුවකි.

අද පාලකයෝ රටේ ආර්ථිකය ගැන කෙස් පලෙන තර්ක ඉදිරිපත් කරති. ඇතිවී තිබෙන මහා අර්බුදයට විවිධ හේතු ඉදිරිපත් කරති. කලින් පාලකයන්ට බැන වදිති. එහෙත් විසඳුමක් ගැන කියන්නේ නැත. ඒ වෙනුවට කියන්නේ ජනතාවට තිත්ත බෙහෙත් බොන ලෙසය. පටි තද කර ගන්නා ලෙසය. මේ ප්‍රශ්නය ජනතාව පිට පටවා ඇත්තේ එසේය. ඒ අනුව තාරුණ්‍යය වෙතටද ඉදිරිපත්කර ඇත්තේ එවැනි කප්පාදු කිරීම්ය.

මෙරට ආර්ථිකය තාරුණ්‍යය අසහනකාරීත්වයට පත්කර තාරුණ්‍යය තුළ පවතින අර්බුදයන් තව තවත් උග්‍ර තරවයි. රටේ ආර්ථිකය නිසි කළමණාකාරීත්වයකට යොමු නොකොට ජනතාව මත බදු බර පටවමින් අයවැය මගින් 2016 වසරට යෝජනා කළ 8% ක හා 11% වැට්බද්ධ පාර්ලිමේන්තුවේ සම්මතව තිබිය දී අගමැති රනිල් වික්‍රමසිංහ මහතා නැවතත් නව බදු ප්‍රතිශතය ලෙස 15%ක වැට්බදු පැනවීමට යෝජනා කළේය. ඒ අනුව සියලු පාරිභෝජන භාණ්ඩ හා සේවාවන් මත නව බදු එකතු වීමෙන් භාණ්ඩ හා සේවාවන්හි මිල ඉහළ යමින් තිබේ. අත්‍යාවශ්‍ය භාණ්ඩයක් හා සේවාවක් බවට වර්තමානයේ භාවිතයෙන්ම පත්ව ඇති දුරකථන හා විදුලි සංදේශ සේවා සඳහා ආණ්ඩුව එක වරක් නොව දෙවරක්ම වැට් බදු පනවා තිබේ. උදාහරණයක් ලෙස රුපියල් 100ක රීලෝඩ් (පෙරගෙවුම්) මුදලකට අය කරන දුරකථන බදු මෙස්ය.

| | |
|---|---|
| විදුලි සංදේශ බද්ද | රු. 26.04% |
| ජාතිය ගොඩනැගීමේ බද්ද | රු. 2.08% |
| නව බදු අනුව වැට් බද්ද | රු. 19.53% |
| අනෙකුත් ආණ්ඩුවේ බදු | රු. 2.08% |
| එකතුව | රු. 49.73% |

ඒ අනුව රු. 100ක දුරකථන ගාස්තුවක් සඳහා රු. 49.73ක් බදු ලෙස රජයට ගෙවිය යුතුය. රු. 100ක පෙර ගෙවූ මුදලකින් ඔබ කථා කරනුයේ රු. 50.27ක මුදලකට පමණී. තාරුණ්‍යය සතු සිහින බොහොමයක් දුරකථනය ඔස්සේ ළඟා කර ගැනීමට පුරුදුව සිටි තරුණ තරුණයන් හට එම අවශ්‍යතාවයන් වෙනුවෙන් රජයට ගෙවිය යුතු බදු බර වැඩි වී ඇත.

මෙම බදු ප්‍රශ්නය පිළිබඳව ජනයාගේ අවධානය යොමු වෙමින් පැවති කාලයේ කාලගුණ විපර්යාසයෙන් සිදුවූ හදිසි ආපදා තත්ත්වය හේතුවෙන් ජනතාවගේ අවධානය වෙනතකට යොමුවිය. නිසි කළමනාකාරීත්වයක් නොමැති රජයේ වැඩපිළිවෙළ පිළිබඳව ආපදාවට ලක් වූ ජනයා පමණක් නොව සමස්ත ලාංකිකයන්ගේ අප්‍රසාදය එල්ල විය. තම සහෝදර ජනයාගේ දුකවේදනාව වෙනුවෙන් රජයේ ක්‍රියාවන් දෙස බලා නොසිට ස්වේච්ඡා සංවිධාන, මාධ්‍ය ආයතන, දේශපාලන පක්ෂ සෘජුව මැදිහත් වී ක්‍රියා කළ හෙයින් ආපදාවට පත් ජනයා හට යම් සහනයක් ලැබුණි.

නමුත් රටක දේශපාලන බලය හිමි පාලකයන්ට සමස්ත ජනයා වෙනුවෙන් වගකීමක් ඇත. ආණ්ඩුවට එම වගකීමෙන් මිදිය නොහැකිය. මහජනයා පීඩාවට පත් කරමින් ජනතාවට සහන සැලසිය යුතු අවස්ථාවන් මගහැර සිටිය නොහැකිය. නමුත් පවතින ආණ්ඩුවේ මේ සම්බන්ධ මැදිහත්වීම උදර පෝෂණය වෙනුවෙන් ඇමතිවරුන්ගේ වියදම සඳහා පමණක් ලක්ෂ 7000ක පමණ මුදල් පරිපූරක ඇස්තමේන්තු මගින් වෙන්කර ගැනීමට නම් ආණ්ඩුව පසුබට වන්නේ නැත..

මෙවන් ආර්ථික දේශපාලන වටපිටාවක ජීවත්වන තරුණ පරපුරේ තරුණයෙක් තරුණියක් ලෙස අප තව තවත් නිහඬව සිටිය යුතුද? තොරතුරු දැනගැනීමේ අයිතිය හකුලන, internet භාවිතයට wi-fi කලාප හඳුන්වා දෙනවා යැයි පවසමින් බලයට පැමිණ දුරකථනයට බදු පිට බදු ගසමින් තාරුණ්‍යය නිහඬ කරවීමට ඉඩ දී අප බලා සිටිය යුතුද? එක්වෙමු. දැනුවත්වෙමු. අයිතීන් වෙනුවෙන් හඬනගමු.







නුදුටු ඇස

## ජනමාධ්‍ය හා ජීවිතය

මධ්‍යහ්නයේ දිගු වාහන පෝලිමකට පසු වූ මා සිටි බස් රථය කිරිබත්ගොඩ නගරයට ආසන්න වී තිබුණි. බස් රථයේ පිටුපස ආසනයෙන් නැගී ආවේ කනස්සලු සහගත හඬකි. මහ මඟට ගතවන කාලය පිළිබඳ මැසිවිලි නගමින් දොඩමළු, වී සිටියේ තරුණයින් දෙදෙනෙකු බව ඔවුගේ කතා මගින් වැටහුණි. ක්‍රමයෙන් බසය ඉදිරියට යත්ම වාහන තදබදයට හේතුව දැනගන්නට හැකි විය.

මහමඟින් අඩක් වසාගෙන බිම වාඩි වී සිටියේ, කැළණිය සරසවියේ සිසුන් පිරිසකි. ඔවුන් විරෝධය දක්වමින් සිටියේ, මෑතකදී එම සරසවියේ සිසුන් පිරිසකට ලබාදුන් පන්ති තහනමටකට එරෙහිවය.

මෙය දකිත්ම මට පිටුපස ආසනයේ සිටි තරුණයන් දෙදෙනා දැඩි කෝපයකට පත්වූහ. මෙතරම් දිගු වාහන තබදබදයකට හේතු වූ සරසවි සිසුන් පිළිබඳ කෝපයෙන් අදහස් දැක්වූ ඔවුන් දෙනොගේම මතය වූයේ, එම සරසවි සිසුන් කඳුළු ගෑස් ගසා හෝ එලවා දැමිය යුතු බවයි. ඒ හා සමඟම ඔවුහු මාර්ගයේ අනෙක් පසට ගමන් කරන වාහනවල සිටියවුන්ට, ඉදිරියේ ඇති විරෝධතාව පිළිබඳ පවසා, විකල්ප මාර්ග භාවිතා කරන ලෙසටද යෝජනා කළහ.

මේ සියලු සංවාද අසා සිටි මාහට සිතුණේ, මේ තරුණයන් දෙදෙනා සරසවි අධ්‍යාපනය නොලැබූවන් බවයි. එමෙන්ම විශ්වවිද්‍යාලයකට ඇතුළත් වීමට මෙරට බහුතර සිසුන් දරනා උත්සාහය ඔවුන්ද නොඅඩුව දරා ඇති බවයි. යම් හෙයකින් ඔවුන්ට සරසවියට ඇතුළත් විය හැකි වූවා නම්, ඔවුන්ද මෙලෙසම විරෝධය දක්වනු ඇති අතර, තමන් දැරූ මතයට වෙනස් මතයක්ද දරනු ඇත.

මේ තරුණයින් දෙදෙනා වෙතින් ප්‍රකාශ වූයේ අද සමාජයේ ශිෂ්‍ය අරගල පිළිබඳ පවතින පොදු මතයයි. එය ඉබේ ඇති වූවක් නොවන අතර, එය ජනතාව මත බලෙන් පැටවූ මතයකි. මෙරට ශ්‍රව්‍ය දෘෂ්‍ය මාධ්‍ය හා ඒවා මෙහෙයවන ධනපති පාලකයන් විසින් පැළ කරන ලද මතයකි. තමන්ගේ මෙන් ජනතාව කියවන්නේ අනුන්ගේ මතයන්ය.

සෑම විටම ශිෂ්‍ය ව්‍යාපාරය අරගල කරන්නේ රටේ සමස්ත ශිෂ්‍ය ප්‍රජාව හා තරුණ පරපුරේත්, මුළු මහත් ජනතාවගේත් අයිතීන් වෙනුවෙනි. එය අතීතයේ මෙන්ම අදත් එලෙසමය. ප්‍රමුඛ කොටම නිදහස් අධ්‍යාපන අයිතිය වෙනුවෙනි.

එම තරුණයන් දෙදෙනාට මෙන්ම, මහමඟ රස්තියාදු වූ මාද ඇතුළු, ජනතාවගේත්, ඔවුන්ගේ දරුවන්ගේත් අධ්‍යාපන අයිතිය වෙනුවෙනි.

නමුත් මාධ්‍ය මඟින් ගොඩනඟන මතයන් කොතරම් ප්‍රබල ලෙස පොදුජන අදහස්වලට බලපෑම් කරනවාද යත්, තමන්ද නිදහස් අධ්‍යාපනය ලැබූවන් බව ජනතාවට අමතක කරවීමට එය සමත්ය.

ජනමාධ්‍ය මෙලෙස කරන බලපෑම මඟින් සැබෑ ප්‍රශ්නය හඳුනා ගැනීමට ජනතාවට නොහැකි වන අතර, එයට මුවා වී පාලන පන්තිය විසින් සිදුකරන ශිෂ්‍ය මර්දනය නොපෙනී යයි.

මෙය සෑම විටම ක්‍රියාවට නැගෙයි, ජනමතය වෙනස් කරමින්, පාලකයන්ට අවශ්‍ය ලෙස එය හසුරුවමින්, සැබෑ ලෙසම ජනතාව වෙනුවෙන් පෙනී සිටින, අරගල කරන පිරිස අරභයා මාධ්‍ය හැසිරීම නිවැරදිව තේරුම් ගැනීමට සබුද්ධික ජනතාව සෑම විටම පරිස්සම් විය යුතුය.

## මඟ කියූ සොයුරනි...

රිදවා මිහිකත - කරවා විකෘති
පුරවා කඳුලැල් - හදවත් සුසුම්දී
සහෝදර සහෝදරියන්ගේ විලාපය
ඇසේ දසතින් සිත් කම්පිත කර
අසරණ නමුත් උන්
මෙය අපගේ රුධිරයට සම

ගලන විට දසත් ජල කඳ
නොසිතා කිසිත් ඒ ගැන
නැගී සියලු දෙන පහුරේ හිඳ
ගියේ සහෝදර ප්‍රේමය හදවතට ගෙන

හඬනා විට දරුවන්
යයි හදවත ඉරි තලමින්
ඔවුන් වේය අපගේ දරුවන්
හැඟුමින් ගියා උන් වෙත ආදරයෙන්


යමින් ගෙයක් ගෙයක් ගානේ
බෙදමින් යළිත් ප්‍රාණේ
කුල මල බෙදුමෙන් තොරව
ගියේ පුරවා අපරිමිත සෙනෙහේ

සිටියත් කොතරම් එවුන් තදබල
නොදැනේ කිසිත් උන්ට මේ දුක
රජුන් ජල කෙළියට වඩිනා ලෙස
පැමිණේ උඩු වියන් බැඳ ගෙන

රතු තරුවේ ආලෝකය දසතට විහිදා
සැබෑ මනුදම්, පතුරුවා
එතෙර වන ජල තලය බියකරු
මඟ කියූ සොයුරනි...

අමිල

## සිත්තමක කතාව



## SYU හා Back to Green මගින් රුක්රෝපණ සතියක්

සමාජවාදී තරුණ සංගමය හා Back to Green සංවිධානය සංවිධානය කළ රුක්රෝපණ සතිය පසුගිය මැයි 8 දින තලවතුගොඩ වැව්බැම්ම අසලින් ආරම්භ කෙරිණි. මෙම සමාරම්භක අවස්ථාවට සමාජවාදී තරුණ සංගමයේ ජාතික සංවිධායක එරංග ගුණසේකර සහෝදරයා හා Back to Green සංවිධානයේ මොහොමඩ් ෆර්ෂාන් යන සහෝදරවරුන් සහභාගි වූහ. එයට සමගාමීව දිවයින පුරා සෑම දිස්ත්‍රික්කයම මෙම වැඩසටහන දියත් වේ. මෙය හංගේරියාවේ බුඩාපේස්ට් පිහිටි ලෝක තරුණ සම්මේලන (WFDY) මූලස්ථානයේ දී ද ආරම්භ විය. ඒ සඳහා ජ.වි.පෙ. ජාතික සංවිධායක බිමල් රත්නායක සහෝදරයා සහ ලෝක තරුණ සම්මේලනයේ සභාපති නිකෝස් පපාදීමිත්රියෝ සහෝදරයා සහභාගි විය. මෙම වැඩසටහන තුළ දී පැළ 15000ක් සිටුවීම අරමුණ වී ඇත.





# ආණ්ඩුව ණය උගුලින් ණය උගුලට

"ණය බරට එරෙහි රට තීරණාත්මක සටනක" මේ සති අන්ත පුවත්පත්වල ජාතික ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු අමාත්‍යංශය විසින් ලක්ෂ ගණනක් මුදල් ගෙවා පළකරන ලද දැන්වීමක තේමාවය. එම දැන්වීමේ තවදුරටත් සටහන් කර ඇත්තේ, රටේ සමස්ත ණය බර ජාතික ආදායමෙන් 75%ක් බවත් ණය බරට එරෙහිව සාර්ථකව සටන් වැදීමට නිරවුල් සහ සමබර බදු ප්‍රතිපත්තියක් අනුගමනය කළ යුතු බවත්ය. ඊළඟට එම දැන්වීමේ මෙසේද සටහන් කර තිබේ. "අපේ වෑයම මේ ණය බරින් අපේ දරුවන් හා මතු පරපුර මුදා ගැනීමයි" යනුවෙනි. ආණ්ඩුව පසුගියදා ජනතාව මත පැටවූ අසාධාරණ වැට් බද්ද සාධාරණීකරණය කර ගැනීම සඳහා මුදල් වැය කරමින් මෙම ප්‍රචාරණය කරන බව පැහැදිලිය. මීට අමතරව රූපවාහිනී හා ගුවන් විදුලි නාලිකාවල මෙවැනි දැන්වීමක් නිතර විකාශය වේ. ජනතාවගේ සංවර්ධනයට තිබූ රු. බිලියන 100ක් ණය වාරික හා පොලී ගෙවීමට වියදම් වූ බවත් එය වෙනස් කළ යුතු බවත් ඉන් කියවේ. එහෙත් 'ණය' පෙන්වා බදු ගසමින් ආණ්ඩුව ගමන් කරන්නේ 'ණය බරින් තොර රටක්' හැදීමටද? ප්‍රධාන ගැටලුව එයයි.


පසුගිය කාලය පුරාවටම බලයට පත් ආණ්ඩු නිෂ්පාදනය දුර්වල කරමින් ණය මත ජීවත් වීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කළේය. රාජපක්ෂ පාලනය එහිදී කප් ගැසූ බව ඇත්තය. එහි ප්‍රතිඵලයක් ලෙස 2015 අවසන් වන විට ලංකාවේ සමස්ත රාජ්‍ය ණය ප්‍රමාණය රුපියල් බිලියන 8503ක් බව මහ බැංකු වාර්තාව සඳහන් කරයි. එය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස 76%ක් වේ. ආණ්ඩුවේ දැන්වීමෙන් කියන්නේද මෙයමය. එහෙත් මෙම නිල ණයට අමතරව විවිධ රාජ්‍ය ආයතන විසින්ද ණය ගෙන තිබෙන නිසා රටේ සැබෑ ණය ප්‍රමාණය. රුපියල් බිලියන 10,000ක් පමණ ණය බව අගමැතිවරයා පාර්ලිමේන්තුවේදී පැවසීය. රටක ණය ප්‍රමාණය එම රටේ දළ දේශීය නිෂ්පාදිතයෙන් 76%ක් වූ විට එම රට පවතින අනතුරුදායක තත්වය ගැන අලුතින් කිව යුතු නැත. එහෙත් රාජපක්ෂ රෙජීමයේ ණය බරින් රට මුදවා ගැනීමට යැයි පවසමින් වත්මන් මෛත්‍රී - රනිල් රෙජීමය සිදු කරමින් සිටින්නේ ඊට නොදෙවෙනි ක්‍රියාමාර්ගයන්ය.

රටේ ආර්ථිකය පිළිබඳව වත්මන් ආණ්ඩුව අනුගමනය කරන ක්‍රියාමාර්ග මුළුමනින්ම අතාර්කික හා පරස්පර ඒවාය. රාජපක්ෂ රෙජීමය ණය ගත් බව සැබෑ නමුත් වත්මන් පාලනය එය පෙන්වා තම බැරිකම හා ජනතා විරෝධී ස්වභාවය වසා ගැනීමට දරන අසාර්ථක උත්සාහය හඳුනා ගත යුතුය. සැබැවින්ම ලංකාවේ ණය අර්බුදය විසඳීමට හෝ රට ආර්ථික වශයෙන් නගා සිටුවීමට වත්මන් හවුල් පාලනයට මෙන්ම ධනපති ක්‍රමයටද පුළුවන්කමක් නැත. මේ සිදුකරමින් සිටින්නේ ජනතාව මත බර පැටවීම සාධාරණය කිරීම සඳහා වූ ප්‍රචාරයන්ය.

පීඩාවට පත්ව සිටි ජනතාව මත ආණ්ඩුව පැටවූ 15%ක් වූ වැට් බද්ද කිසි ලෙසකින් හෝ සාධාරණය කළ නොහැක. ආණ්ඩුවේ සමහරු මෙම බද්ද හඳුන්වන්නේ 'දූෂණ බද්ද' නමිනි. ඒ, රාජපක්ෂ පාලනයේ වංචා හා දූෂණ නිසා විනාශ වූ ආර්ථිකය ගොඩ නැගීමට පැනවූ බද්දක්ය යන්න තහවුරු කිරීමටය. රාජපක්ෂ පාලනය දූෂණයෙන්, වංචාවෙන් පිරුණු එකක්ය යන්න ඇත්තය. එය රටේ මහජන මුදල් කෝටි ගණනින් නාස්ති කළ බවත් හොරකම් කළ බවත් සැබෑය. එය එසේ වූ විට ආණ්ඩුව කළ යුතු වන්නේ, රාජපක්ෂ පාලනයේ දූෂණ මගින් ඇති කළ අර්බුදයේ බර ඊට කිසිදු සම්බන්ධයක් නැති පොදු ජනතාවය මත පැටවීම නොව රාජපක්ෂ පාලනයට සම්බන්ධ වී මහජන මුදල් වංචා කළ වුන්ගෙන් ඒවා යළි ලබා ගැනීමය. පැනමා පත්‍රිකාවල නම් සඳහන් අය ගැන පරීක්ෂණයක් කර එම මුදල් ලංකාවට ගෙන්වා ගැනීමටත් රාජපක්ෂවරුන් හා මිතුරන් ගොඩ ගසාගෙන සිටින මහජන මුදල් කන්දරාව යළි රටට පවරා ගැනීමටත් ආණ්ඩුව පියවර ගත යුතුය. එහෙත් රාජපක්ෂවරුන් සමග රහසින් ගනුදෙනු කරන, ඔවුන්ව හුරතල් කරන ආණ්ඩුව ඔවුන් කළ විනාශයේ බර ජනතාව මත පටවා එය දරා ගන්නා ලෙසද ජනතාවට බල කිරීම යුක්ති යුක්ත නොවේ. අනෙක් අතට එය නිවැරදි ප්‍රතිඵල ගෙන දෙන්නක්ද නොවේ.

මීළඟ කරුණ වන්නේ, ආණ්ඩුවේ ආර්ථික උපාය මාර්ගය මෙම ණය උගුලෙන් රට ගලවා ගැනීමට සමත් එකක්ද යන්නය. රටක ණය බර ඉහළ ගොස් ආර්ථිකය අර්බුදයක නම් ආණ්ඩුවක් කළ යුතු වන්නේ කුමක්ද? පළමුවෙන්ම ණය ගැනීම සීමා කිරීමය. ඊළඟට වහාම ආදායම් උපදවන නිෂ්පාදන මාර්ග හා සේවා දියුණු කොට රටේ ජාතික ආදායම ඉහළ දැමීමය. එසේම ආණ්ඩුවේ නාස්තිකාර අනවශ්‍ය වියදම් අඩු කිරීමය. එහෙත් මේ එකක්වත් නොකරන ආණ්ඩුව ඒ වෙනුවට ජනතාව මත බදු බර පටවා තිබේ.

රාජපක්ෂ පාලනයේ ණය ගැනීම හා ණය උගුලක රට සිරවීම ගැන ලක්ෂ ගණන් මුදල් නාස්ති කරමින් දැන්වීම් පළකරන ආණ්ඩුව ආර්ථිකය හසුරුවමින් සිටින්නේ කෙසේද? ණය බර අඩු කරන දිශාවටද? ණය බර වැඩිකරන දිශාවටද? සැබැවින්ම රාජපක්ෂ ආණ්ඩුවේ 'ණය ගැනීමේ ප්‍රමාණය පරාජය කළ හැකි මට්ටමේ ණය ගැනීමකට මේ ආණ්ඩුවද අත ගසා තිබේ. වත්මන් ආණ්ඩුව රාජපක්ෂවරුන්ට දොස් කියමින් 2015 දී විශාල ණය ප්‍රමාණයක් ලබා ගෙන තිබේ. 2015 මහ බැංකු වාර්ෂික වාර්තාවට අනුව 2012 දී රුපියල් බිලියන 6000ක් වූ සමස්ත රාජ්‍ය ණය ප්‍රමාණය 2013 දී රුපියල් බිලියන 6793ක් වූ අතර එය 2014දී රුපියල් බිලියන 7390ක් විය. එය 2015 වර්ෂයේදී රුපියල් බිලියන 8503ක් දක්වා ඉහළ ගොස් තිබේ. ඉන් පෙනෙන්නේද වත්මන් ආණ්ඩුවද රාජපක්ෂවරුන් ගිය මඟේම යන බවය. ඒ, ඔවුන් විවේචනය කරමින් ඊට මුවා වී ජනතාව මත බර පටවමිනි.




> "රටේ ආර්ථිකය පිළිබඳව වත්මන් ආණ්ඩුව අනුගමනය කරන ක්‍රියාමාර්ග මුළුමනින්ම අතාර්කික හා පරස්පර ඒවාය. රාජපක්ෂ රෙජීමය ණය ගත් බව සැබෑ නමුත් වත්මන් පාලනය එය පෙන්වා තම බැරිකම හා ජනතා විරෝධී ස්වභාවය වසා ගැනීමට දරන අසාර්ථක උත්සාහය හඳුනා ගත යුතුය."

**ණය උගුලෙන් ගැලවීමට පුරසාරම් දොඩන ආණ්ඩුව මේ වසරේ කොපමණක් ණය ඉල්ලා හෝ අනුමත කරගෙන තිබේද? පසුගිය දිනෙක ආසියානු සංවර්ධන බැංකුවේ ප්‍රධානියා පවසා තිබු අයුරින් ඔවුන් ලංකාවට ඇමෙරිකානු ඩොලර් බිලියන 02ක ණයක් අනුමත කර තිබේ. ඉන් ඩොලර් මිලියන 700ක මුදලක් මේ වසරේදී මුදා හරින බවද පවසා තිබුණි. ඊළඟට ආණ්ඩුව ඉන්දියාවෙන් හා සාර්ක් අරමුදලෙන් ඩොලර් බිලියන 1.1ක ණය මුදලක් ලබා ගැනීමට අනුමැතිය ගෙන තිබේ. එසේම පසුගියදා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල නිවේදනය කරනු ලැබුවේ ඩොලර් බිලියන 1.5ක මුදලක් වෙන් කළ බවය. මේ ප්‍රමාණය එකතු කළ විට පමණක් එය ඩොලර් බිලියන 4.6ක විශාල ණය මුදලක් වේ. වත්මන් පාලනය 'ණය බරින් මතු පරපුර මුදාගැනීමට' පියවර ගෙන තිබෙන්නේ එසේය. ආණ්ඩුවේ මේ බොරුවට හා රැවටීමට තවදුරටත් ඉඩ දිය යුතු දැයි ජනතාව කල්පනා කළ යුත්තේ මේ නිසාය. 2008 ලෝක ආර්ථික අවපාතයෙන් පසු 2009දී ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ලංකාවට ණයක් අනුමත කළේය. ඒ ඩොලර් බිලියන 2.6කි. එය පවා විශාල ණයකි. දැන් ආණ්ඩුව ආයතන හා රටවල්වලින් ඩොලර් බිලියන 4.6ක ණයක් ගැනීමෙන් අර්බුදයේ ප්‍රමාණය මෙන්ම ණය කන්දරාවේ ප්‍රමාණයද අයෙකුට තේරුම් ගැනීම අපහසු නොවනු ඇත.**

පැහැදිලි ආර්ථික ප්‍රතිපත්තියක් නැති, ආර්ථික උපාය මාර්ගයක් නැති ආණ්ඩුව මෙලෙස රට තව තවත් ණය උගුලේම සිරකර වන අතර කර වටක් ගිලුණු ණය ගොහොරුවේම තව තවත් ගිලෙන අතර රටේ රාජ්‍ය ආයතන විවිධ සමාගම්වලට හෝ රටවලට පවරා දැත් නිදහස් කර ගැනීමටද කටයුතු කරමින් සිටී. ලංකාව සතුව තිබෙන රාජ්‍ය ආයතන ආදායම් ලබන ඒවා බවට පත්කර ගන්නවා වෙනුවට, නිෂ්පාදන මාර්ග දියුණු කර ගන්නවා වෙනුවට, බදු නොවන ආදායම් පංගුව වැඩි කර ගැනීමට කටයුතු කරනවා වෙනුවට තිබෙන රාජ්‍ය ආයතනද දන් දෙමින් සිටී. ඒ අනුව පාඩු ලැබීම හේතුවක් කර ගෙන ශ්‍රී ලංකන් එයාර් ගුවන් සමාගම පෞද්ගලික අංශයට ලබා දීමට තීරණය කර තිබෙන අතර"ණය ගෙවා ගැනීමට නොහැක" යන හේතුව මත මත්තල ගුවන් තොටුපල හා හම්බන්තොට වරාය චීනයට පැවරීමට තීරණය කර තිබේ.

පාඩු ලබන වරායක්, ගුවන් සමාගමක් වැනි ආයතනයක් ගොඩ ගැනීමට නොහැකිව ඒවා කාට හෝ පවරා දෙන ආණ්ඩුවක් අර්බුදයට ගිය රටක් ගොඩ ගන්නේ කෙසේද යන්න ප්‍රශ්නයක්ව තිබේ. සැබැවින්ම මේ හදන්නේ රට ගොඩ ගැනීමට නොව ආණ්ඩුවේ දවස ගෙවා ගැනීමට මුදල් ටිකක් සොයා ගැනීමටය. එහිදී රට තුළින් මුදල් සොයා ගැනීමට ජනතාවට

15 වැනි පිටුවට



"අවසාන විග්‍රහය අනුව බලන කල, ධනපති පංතිය පරදවා ලබන ජයග්‍රහණයන්ට ශක්තිය සපයන ගැඹුරුතම ප්‍රභව මූලයත්, මෙම ජයග්‍රහණයන්ගේ කල්පවත්නා සහ ස්ථිර භාවය පිළිබඳ එකම සහතිකයත්, අනෙකක් නොව, නව සහ උසස් නිෂ්පාදන ක්‍රමයක්, එනම්, ධනපති සහ සුළු ධනපති නිෂ්පාදනය වෙනුවට මහා පරිමාණ සමාජවාදී නිෂ්පාදනය ආදේශ කිරීමක් වන හෙයිනි."

**ලෙනින්**
**තෝරාගත් කෘති, 9 වෙළුම, 222 පිටුව**

# ගොබෙල්ස්ලාට එරෙහිව



"දිවයින" පුවත් පත විසින් සිදු කළ මේ අසත්‍ය ප්‍රචාරයන්ට නොරැවටෙන ලෙස ජනතාව දැනුවත් කරමින් ජ.වි.පෙ. නායකත්වය විසින් පුවත්පතේ පළවූ අසත්‍ය ප්‍රවෘත්තියට සහ අවලාදාත්මක විශේෂාංග ලිපියට එරෙහිව මැයි 09 වෙනි සඳුදා පුවත්පත් කොමිසමට පැමිණිල්ලක් ඉදිරිපත් කරන ලදී. මේ අවස්ථාව සඳහා ජ.වි.පෙ. නායක අනුර දිසානායක, ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා, ප්‍රචාරක ලේකම් විජිත හේරත්, පාලක ලේකම් ලාල් කාන්ත, මුදල් ලේකම් සුනිල් හඳුන්නෙත්ති, ජාතික සංවිධායක බිමල් රත්නායක යන සහෝදරවරුන් ඇතුළුව ජ.වි.පෙ. නායකයෝ රැසක් මේ අවස්ථාවට සහභාගි වී සිටියහ.

ලාංකේය දේශපාලනය තුළ මේ වන විට නැවත වටයකින් විකල්ප භූමිකාවකට ඉඩ විවර වෙමින් තිබේ. රාජපක්ෂ කල්ලිය පන්නාදමා වඩා යහපත් සමාජයක් බලාපොරොත්තු වූ ජනතාවට තමන්ගේ එම බලාපොරොත්තු ක්‍රමයෙන් බොඳවෙමින් යන බව පසක් වී ඇත.

2015 ජනවාරි 08 රාජපක්ෂ නඩය පරාජය කිරීමෙන් අනතුරුව පැවති මහ මැතිවරණයේදී තමන්ට පාර්ලිමේන්තුව තුළ වැඩි බලයක් ලබාදෙන ලෙස ජ.වි.පෙ. ජනතාවගෙන් ඉල්ලා සිටියද ජනතාව එයට එතරම් ප්‍රතිචාරයක් දැක්වූයේ නැත. ඔවුන්ගේ විශ්වාසය වූයේ, මහින්දගේ වංචා දූෂණයන්ට නිසි දඬුවම් ලබාදී ජනතාවගේ දැවෙන සමාජ ආර්ථික ගැටලු සඳහා කිසියම් කඩිනම් විසඳුම් ලබාගැනීමට හැකිවනුයේ රනිල් හෝ මෛත්‍රීගෙන් බවයි. එහෙත් නව පාලනය තුළ වසරකටත් වඩා වැඩි කාලයක් ගත වුවද රාජපක්ෂවරුන්ට දඬුවම් හෝ ජනතාවට සහන හෝ ලැබුණේ නැත.

තමන්ගේ සැප ජීවිත අහිමි කිරීම සම්බන්ධයෙන් රාජපක්ෂ කල්ලියේ විරෝධයත් ජනතා විරෝධී ක්‍රියා මාර්ග ගැනීමට ඉඩ නොදීම සම්බන්ධයෙන් 'යහපාලන' ආණ්ඩුවේ විරෝධයත් ජ.වි.පෙ. වෙත එක විට එල්ල වී තිබේ. එවන් තත්වයක් තුළ මේ සියලු කණ්ඩායම්හි වුවමනා එපාකම් ඉටු කරමින් පසුගිය මැයි 08 වෙනි ඉරිදා දිවයින පුවත්පත මගින් ජ.වි.පෙ. නායකත්වයට එරෙහිව අසත්‍ය තොරතුරු රැසක් වැපිරීය.



# අවලාද ඇයි?

වරෙක මාවෝ සේතුං පැවසුවේ අපගේ සාර්ථකත්වය මිණිය හැක්කේ මිතුරන්ගේ ප්‍රශංසාවලින් නොව සතුරන්ගේ කෝපාවිෂ්ඨ වදන්වලින් බවය. ඒ අනුව ගත් විට ජ.වි.පෙ. මේ මොහොතේ මෙරට ක්‍රියාත්මක වන සාර්ථකම දේශපාලන පක්ෂය බවට නම් කළ හැක. එනම් රනිල්, මෛත්‍රී හා මහින්ද පාර්ශවයන්ගේත් ජ.වි.පෙ.න් ඉවත් කළ බියසුල්ලන්ගෙත් පොදු සතුරා වී ඇත්තේ ජනතා විමුක්ති පෙරමුණයි. එනිසාම එම කණ්ඩායම් විසින් එල්ල කරන බොරු, අවලාද, අපහාස කිරීම් ආදී සියලු දෙයටම මුහුණ දීමට ජ.වි.පෙ.ට සිදුව තිබේ.

පසුගිය මැයි 08වෙනිදා ඉරිදා දිවයින පුවත්පත මගින් ජ.වි.පෙ.ට එරෙහි අසත්‍ය ප්‍රවෘත්තියක් හා ලිපියක් පළ කිරීම මේ අවලාදයන්ගේ ගුණාත්මක පිම්මක් සනිටුහන් කරන්නක් විය. මේ තත්වය තුළ තමන්ට අවලාද එල්ල කරනන් සහ ඔවුන්ගේ අරමුණු ජනතාවට හෙළිකිරීම සඳහා ජ.වි.පෙ. විසින් සම්මන්ත්‍රණයක් සූදානම් කරන ලදී.

එම සම්මන්ත්‍රණය පසුගිය මැයි 16 වෙනිදා "ජ.වි.පෙ.ට එරෙහි අවලාද ඇයි?" යන මාතෘකාව යටතේ කොළඹ නව නගර ශාලාවේදී පැවැත්වනු ලැබූ අතර ඒ මොහොතේ පැවති අයහපත් කාලගුණයද නොසලකා විශාල පිරිසක් එයට සහභාගි වී සිටිනු දක්නට ලැබුණි. ජ.වි.පෙ. නායක අනුර දිසානායක, ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහ දේශපාලන මණ්ඩල සභික ලාල් කාන්ත යන සහෝදරවරු මෙහිදී අදහස් දැක්වූහ.

# ගංවතුර හා මනුෂ්‍යත්වයේ මහා ශ්‍රම මෙහෙයුම

"ගොඩක් අයට රිදෙයි මේ ඉන්නේ ජ.වි.පෙ. සුනිල් හඳුන්නෙත්ති. ජාතික ලැයිස්තුවෙන් පත් කළ ජනතාව පත් නොකළ පාර්ලිමේන්තු මන්ත්‍රී. මාතර ඉඳලා ඇවිත් කඩුවෙල වැලිවිට, මීතොටමුල්ල පැත්තේ ගංවතුරේ ගිහින් අවතැන් වූ මිනිසුන් බේරගන්න. කෑම ටිකක් දෙන්න. මිනිසුන්ගේ සැබෑ දුක බලන්න අවතැන් වූ මිනිස්සු ළඟටම ජ.වි.පෙ. සහන සේවා බලකායත් සමග ගිය ආකාරය." ඉහත දක්වා ඇත්තේ පසුගිය මැයි 20 වෙනිදා මුහුණු පොතේ හඳුන්නෙත්ති සහෝදරයා ගංවතුරෙන් අවතැන්වූවන් හට සහන සැලසීම සඳහා ගිය අවස්ථාවේ ඡායාරූපත් සමග පළවූ වදන් කිහිපයකි. සැබැවින්ම පටු දේශපාලන අරමුණුවලින් තොරව ජනතා සේවය සඳහා කැප වන්නේ, ජ.වි.පෙ. බව මෙරට ජනතාව වසර 51ක ජ.වි.පෙ. ඉතිහාසය තුළ මනාව පෙන්වා දී ඇත.

පසුගිය මැයි මැද අයහපත් කාලගුණ තත්වය ගංවතුරක් බවට පත්ව ජනතාවගේ උන් හිටි තැන් අහිමි කරද්දී ආණ්ඩුව පාර්ශවයෙන් ඒ සඳහා ක්ෂණික මැදිහත් වීමක් සිදු නොවුණි. එසේම රාජපක්ෂ කල්ලියද විවේචන පමණක් ඉදිරිපත් කරමින් සිටියා මිස ජනතාව වෙත කිසියම් හෝ සහනයක් ලබා දීමට තමන් අටවා ගත් ඊනියා ඒකාබද්ධ විපක්ෂය මෙහෙය වූයේ නැත. මෙවන් වටපිටාවක් තුළ 'රතු තරුව' සහන කණ්ඩායම් ජ.වි.පෙ. නායකත්වය සමග එක්ව ජනතාවට සහන සැලසීමට ඉදිරිපත් වූයේ ජීවිත අනතුරද නොතකාය.

විවිධ මාධ්‍ය ආයතන තම තමන්ගේ නාලිකා හරහා විපතට පත් ජනතාවට සහන සැලසීම සඳහා වැඩියෙන්ම මැදිහත් වන්නේ තමන් බවට පෙන්වීමට කටයුතු කරද්දී 'රතු තරුව' සහන සේවා බලකාය "මනුෂ්‍යත්වයේ මහා ශ්‍රම මෙහෙයුම" නමින් ගංවතුරෙන් අවතැන් වූවන්ගේ නිවාස, වතු පිටි ආදිය මෙන්ම ඒ අවට මාර්ගයන් පිරිසිදුකර දීමේ ශ්‍රම මෙහෙයුමක් මැයි 26-27 යන දිනයන් හිදී දියත් කරන ලදී. කඩුවෙල නගරය අවට ජ.වි.පෙ. ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා, සුනිල් හඳුන්නෙත්ති, නිහාල් ගලප්පත්ති, ලක්ෂමන් නිපුනාරච්චි, සුනිල් වටගල, සමාජවාදී තරුණ සංගමයේ ජාතික සංවිධායක එරංග ගුණසේකර යන සහෝදරවරුන්ගේද, බියගම සියඹලාපේ ප්‍රදේශය ජ.වි.පෙ. නායක අනුර දිසානායක, ප්‍රචාරක ලේකම් විජිත හේරත්, බිමල් රත්නායක, වසන්ත සමරසිංහ, මහින්ද ජයසිංහ යන සහෝදරවරුගේද සහභාගිත්වයෙන් ශ්‍රමදාන කටයුතු සිදුවිය.



# වැට්වලට වැට බැඳීම



කැප කරන ජනතාවගේ මැයි රැලියක් පවත්වනු ලැබුවේ එක්සත් ජාතික පක්ෂය විසිනි. එම පක්ෂයේ නායක වත්මන් හවුල් ආණ්ඩුවේ අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ ජනතාගෙන් ඉල්ලා සිටිනුයේද කැපකරන ලෙසයි. මේ කැප කිරීම යනු කුමක්ද? පැවති එ.ජා.ප., ශ්‍රීල.නි.ප. තනි ආණ්ඩුවලදී මෙන්ම වත්මන් හවුල් ආණ්ඩු තුළදීද රටේ ජනතාව සිදු කළේ සැප ගැනීම නොව දිගින් දිගට කැප කිරීම බව අමුතුවෙන් කිව යුතු නොවේ. එසේ නම් වික්‍රමසිංහ මහතා නැවත වතාවක් සිදු කරන ලෙස ජනතාගෙන් ඉල්ලා සිටින කැපකිරීම සුළු පටු එකක් නොවනු ඇත.

අග්‍රාමාත්‍යවරයාට මිලියන 600ක නිල රථ දෙකක් ගෙන්වීමට සැලසුම් කරමින්ද අමාත්‍යවරු තමන්ගේ අමාත්‍ය කාර්යාල අලුත්වැඩියාවට මෙන්ම කුලිය සඳහාද ලක්ෂ ගණනින් මුදල් වෙන් කර ගනිමින්ද රටේ ජනතාවගේ කැප කිරීම ඉල්ලා සිටි එක් ආකාරයක් වූයේ නව වැට් බද්දය.

මෙතෙක් 8%ක් හා11%ක් පැවත වැට් බද්ද 15%ක තනි අගයකට වැඩි කරමින් නව වැට් බද්ද ක්‍රියාත්මක වීම ඇරඹීමත් සමග අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යවල සිට ඖෂධද, වෛද්‍ය ගාස්තු ආදී සෑම දෙයක්ම ඉහළ යන්නට විය.

මේ තත්වය හමුවේ මේ නව වැට් බද්දට එරෙහිව ජනතාව පෙළගැස්වීමේ වැඩපිළිවෙළකට ජ.වි.පෙ. අවතීර්ණ විය. එහි එක් පියවරක් ලෙස පසුගිය මැයි 30 වෙනිදා මේ සම්බන්ධයෙන් රටේ ජනතාව දැනුවත් කිරීම සඳහා දිවයින පුරා අත් පත්‍රිකා බෙදාහැරීමේ ව්‍යාපාරයක් ආරම්භ කරන ලද අතර කොටුව දුම්රියපොළ ඉදිරිපිටදී පැවති එම අවස්ථාවට ජ.වි.පෙ. නායකයෝ රැසක් සහභාගි වූහ.

## ඉතිහාසය වෙනස් කළ අරගල



# යුග පෙරළි කළ අරගල මඟ

ඉතිහාසයේ යුගයන් වෙනස් කළ අරගලයන් පිළිබඳව පසුගිය කලාප කිහිපයකින් අප සාකච්ඡා කළෙමු. ඒ අනුව ඉතිහාසය යනු නිදහසේ ඉලක්කකර ගත් දිසාවකට ගමන් කරන්නක් නොවන බව අපට පෙනී යයි. මෙම ලිපි පෙළ ආරම්භ කරනු ලැබුවේද ඉතිහාසයේ සිදුවූ තීරණාත්මක අරගලයන් පිළිබඳව හා ඒවා ඇති වීමට බලපෑ සමාජ ආර්ථික කොන්දේසි මෙන්ම එම අරගලයන්ට ජනතාවගේ මැදිහත් වීම් පිළිබඳව අවධානය යොමු කිරීමටයි.

ඉතිහාසයේ පැවති ප්‍රාථමික සාමූහික සමාජය, වහල් හිමි හා වැඩවසම් සමාජ හා වර්තමානයේ පවතින ධනේශ්වර සමාජය ක්‍රමය එසේ හඳුන්වනු ලැබුවේ ඒ ඒ සමාජයන් හි නිෂ්පාදන ක්‍රියාවලිය පදනම් කරගනිමිනි. ඒ අනුව වහල් හිමි සමාජයේදී ඇතිවූ වහල් කැරලිද, වැඩවසම් යුගයේ එයට එරෙහිව පැන නැගි අරගලයන්ද (ප්‍රංශ හා ඇමරිකන් විප්ලව) වැඩවසම් ක්‍රමයට එරෙහිව රුසියාව තුළ සිදුවූ ජනතා අරගලයන්ද අපි සාකච්ඡාවට බඳුන් කෙරුවෙමු. ඒ අනුව මුළු මහත් ඉතිහාසය පුරාම සිදුව ඇත්තේ, ඒ ඒ සමාජ අවධිවලදී පීඩනයට ලක්වන ජනතාවන් විසින් තමන් පීඩාවට පත් කරන පාලනයට එරෙහිව අරගල කිරීම බව දැක්විය හැක.

**"මෙතෙක් පැවති සියලු සමාජවල ඉතිහාසය පංති අරගලවල ඉතිහාසය වේ. නිදහස් මිනිසා සහ වහලාද, රෝම කුලීනයා සහ රෝම පොදු ජනයාද, රදළයා සහ ප්‍රවේණි දාසයාද, ශ්‍රේණි හිමියා සහ ජ්‍යෙෂ්ඨ ආධුනිකයාද - වචනයකින් පැහැදිලි කළහොත්, පීඩකයා සහ පීඩිතයා එකිනෙකට විරුද්ධව නියත ලෙස නැගී සිට වරෙක සඟවුණා වූද, වරෙක විවෘත වූද සටනක්, එක්කෝ මුළුමහත් සමාජයම විප්ලවවාදී ලෙස ප්‍රතිනිර්මාණය කිරීමෙන් අවසන්වූ. නැතිනම් සටන් කරන පංතීන්ගේ පොදු විනාශයෙන් අවසන් වූ සටනක් නොකඩවාම කරගෙන ගියහ."** - මාක්ස් සහ එංගල්ස් කොමියුනිස්ට් පක්ෂයේ ප්‍රකාශනය, පිට - 33, (මෙය ග්‍රන්ථය රචනා කරන අවධිය වන විට පංති සමාජවලට පෙර පැවති සාමාජීය සංවිධාන පිළිබඳව සොයාගෙන නොතිබුණි.)

### වුවමනාව කාගේද?

ඉතිහාසයේ සිදුවූ යුග පෙරළි සහ ඒවා සිදු වීමට බලපෑ තීරණාත්මක අරගල කිසියම් පුද්ගලයෙකුගේ හෝ නැතහොත් කණ්ඩායමක තනි කැමැත්ත මතම සිදුවුවායැයි පැවසුවහොත් එය තාර්කික නොවේ. ඉතිහාසයේ කියවෙන දැවැන්තම වහල් කැරැල්ල ස්පාර්ටකස්ගේ පුද්ගල කැමැත්ත හෝ ඇමරිකානු විප්ලවය ජෝර්ජ් වොෂිංටන්ගේ, තොමර්ස් ජෙෆර්සන්ගේ හෝ ප්‍රංශ විප්ලවය දාර්ශනිකයකු වූ ජීන් ජැක් විස් රූසෝගේ පෞද්ගලික කැමැත්ත පමණක් නොවීය. එසේම රුසියන් විප්ලවයද ලෙනින්ගේ තනි ජයග්‍රහණයක් ලෙස සැලකිය නොහැක. එසේනම් මේ අරගලයන්ට පුද්ගල සාධකයන් අදාළ නොවේයැයි නිගමනය කළ හැකිද? එසේද නැත. මෙහිදී පුද්ගල සුවිශේෂතා බැහැර කළ නොහැක. නමුත් ඒ මොහොතේ පැවති සමාජ වුවමනාව නියෝජනය වූයේ සුවිශේෂී පුද්ගල චරිත හරහාය. මෙය පටලවා ගත යුතු නැත.

**"මිනිස්සු ස්වකීය ඉතිහාසය නිර්මාණය කරති. එහෙත් ඔවුන් එසේ කරන්නේ ඔවුනට රිසි පරිදි නොවේ. ඔවුන් විසින් තෝරාගත් තත්වයන් යටතේ ඔවුහු එය නිර්මාණය නොකරති. ඔවුන් ඉදිරියේ පවතින, ඔවුනට ලැබී ඇති සහ අතීතයෙන් සංක්‍රමණය වූ තත්වයන් යටතේය. ඔවුන් නිර්මාණය කරන්නේ"** මාක්ස්-එංගල්ස් තෝරාගත් කෘති, 1 වැනි වෙළුම, 128 පිටුව

### 'හීලෑ කළ සතුන්ගේ කැරැල්ල'

ප්‍රාථමික සාමූහික සමාජය බිඳ වැටීමෙන් අනතුරුව බිහිවූ වහල් හිමි සමාජ ක්‍රමයේ මූලික පංති බෙදීම වූයේ වහලා සහ වහල් හිමියා අතරය. වහලා පාලනය කරනු ලැබුවේ කසයේ බලයෙනි. මූලික බෙදීම වහලා සහ වහල් හිමියා අතර වුවත් වෙනත් පීඩක මෙන්ම පීඩිත ස්ථරයන්ද මේ සමාජයන්හි වූහ. නිෂ්පාදන උපකරණයන්ගේ දුර්වල වර්ධනයේ ස්වභාවය නිසාවෙන් නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා අතිමහත් මිනිස් ශ්‍රමයක් එකල අවශ්‍ය විය. එම අවශ්‍යතාව තෘප්ත කරනු ලැබුවේ මූලික වශයෙන් යටත් කරනු ලැබූ ගෝත්‍රවල වහලුන් මගිනි. එම ක්‍රියාවලියට සාපේක්ෂව වහලුන් යනු හීලෑ කළ සතුන් නැතහොත් කථා කරන උපකරණයන් වශයෙන් සමාජ මතයක්ද එකල නිර්මාණය වී තිබුණි.

වහලුන් මත එල්ලවූ අධික පීඩනය හේතුවෙන් වහල් හිමියන්ට එරෙහිව කැරැලි ගැසීම් ඇතිවූ අතර යූනුස්, සැලිවියස් සහ ස්පාර්ටකස් යන වහලුන් විසින් නායකත්වය දුන් වහල් කැරලි මූලික වශයෙන් ඉතිහාසයේ සඳහන් වේ. මෙම කැරැලි හුදෙක් ඔවුන්ගේ පෞද්ගලික තීරණ නොව වහල් හිමියන්ගේ පීඩනයට එරෙහිව වහලුන්ගේ ප්‍රතිචාරය විය. එක පසෙකින් වහල් කැරැලිත් අනෙක් පසෙන්, නිෂ්පාදන උපකරණයන්ගේ සිදුවූ ක්‍රමික වර්ධනයත් හේතුවෙන් වහලා සූරාකෑමේ මාධ්‍ය වශයෙන් පවත්වා ගැනීමේ සමාජ වුවමනාවද අහෝසි විය. මේ නිසාම නිෂ්පාදන බලවේග විසින් නව නිෂ්පාදන සබඳතාවයක් ඉල්ලා සිටි අතර එහි අවසන් ප්‍රතිඵලය ලෙස වහලා වෙනුවට ඉඩම සූරාකෑමේ මාධ්‍යය බවට පත්ව ඉතිහාසයේ නව යුගයක් ඇති විය.

### ඉඩමෙන් ඉවත් වීම

වහල් හිමි සමාජ අවධියෙන් පසු බිහි වූ වැඩවසම් සමාජ ක්‍රමය තුළ මූලික පංති බෙදීම සිදුවුයේ ඉඩම් හිමියන් සහ ප්‍රවේණි දාසයන් අතරය. ඉඩම සූරාකෑමේ මාධ්‍යය විය.වහලාට සාපේක්ෂව ප්‍රවේණි දාසයාට තම ශ්‍රමයේ කිසියම්ම ප්‍රතිලාභයක් ලැබුණද එක අතකින් මොහු ඉඩමට බැඳි 'වහලෙක්ම' විය. ඉඩම් හිමි රදල පංතිය විසින් දාසයන් මත එල්ල කළ පීඩනයද සුළුපටු නොවීය. ක්‍රමයෙන් සිදුවූ නිෂ්පාදන උපකරණයන්ගේ වර්ධනයට වැඩවසම් නිෂ්පාදන සම්බන්ධතා බාධා කරනන්ට විය. එහි තාර්කික ප්‍රතිඵලය වූයේ නව නිෂ්පාදන සම්බන්ධතාවක් බිහි වී සමාජය ඉදිරියට යෑමයි.

> ක්‍රමයෙන් සිදුවූ නිෂ්පාදන උපකරණයන්ගේ වර්ධනයට වැඩවසම් නිෂ්පාදන සම්බන්ධතා බාධා කරනන්ට විය. එහි තාර්කික ප්‍රතිඵලය වූයේ නව නිෂ්පාදන සම්බන්ධතාවක් බිහි වී සමාජය ඉදිරියට යෑමයි.

යුග පෙරළිවල මෙම මූලධාර්මික පදනම ප්‍රායෝගිත තලයේ සිදුවූ ආකාරය සම්බන්ධයෙන් අවධානය යොමු කිරීමට අපි ප්‍රංශ විප්ලවය සාකච්ඡා කළෙමු. ලුවී රජ පරම්පරාව, පූජකයන්, ඉඩම් හිමි රදලයන් මේ සමාජයේ අධිපති පංතිය නියෝජනය කළ අතර ප්‍රවේණි දාසයන්, ගොවින්, සාමාන්‍ය ජනතාව සහ නැගී එන ධනපති පංතිය නිරන්තරයෙන් මොවුන්ගෙන් පීඩාවට පත් වූ බවත් සැබැවින්ම බිහිවෙමින් තිබූ කාර්මික නිෂ්පාදනයන්ගේ හිමිකාරීත්වය ධනපති කොටස් සතුව වෙමින් පැවති අතර වැඩවසම් රාජාණ්ඩුව එයට බාධාවක් වූ බවත් හඳුනාගැනීමට හැකි විය.

වැඩවසම් රාජාණ්ඩුවේ ආකාර්යක්ෂම පාලනයත්, විදෙස් රටවල් සමග යුධ ගැටුම් ආදියට මැදිහත් වීම නිසා වූ අධික ණය බර ජනතාව මත පැටවීමත්, ගොවි ජනයාගේ සුවිශේෂ ගැටලුත් ආදිය නිසා ඔවුනුත් සම්බන්ධ කර ගනිමින් රාජාණ්ඩුව පෙරළා දැමීමට නැගී එන ධනපති පංතිය සමත් විය. 1789 ජූලි 14 බැස්ටීලයට පහර දීම වැඩවසම් පාලනය අවසන් කිරීම වශයෙන් හැඳින්වුවද ඉන්පසු වසර ගණනාවක් ගොවි ජනතාව, පීඩිත ජන කොටස් හා ධනපති පංතිය ගෙන ගිය අඛණ්ඩ අරගලයක ප්‍රතිඵලයක් ලෙස වැඩවසම් ක්‍රමය බිඳවැටී ප්‍රංශයේ ධනේශ්වර ක්‍රමය ස්ථාපිත විය.

ඇමරිකානු විප්ලවය දෙසට අවධානය යොමු කළ විට එයද පදනමින් වැඩවසම් ක්‍රමයට එරෙහි අරගලයක් බව පෙනීගියද මෙහි ප්‍රවේණි දාසයන් හෝ ඉඩම් හිමි රදලයන් අපට මුණ ගැසෙන්නේ නැත. බ්‍රිතාන්‍ය රාජාණ්ඩුවට එරෙහිව මෙහිදි අරගල කරනු ලබන්නේ ඇමරිකානු ජනපදවාසීන් සහ නැගී එන වෙළඳ ප්‍රජාවයි. ඇමරිකාවේ ආර්ථිකය තමන්ට එරෙහි නොවන ආකාරයට පවත්වා ගැනීම බ්‍රිතාන්‍යයේ වුවමනාව වූ නිසාවෙන් විවිධ බදු වර්ග මෙන්ම නව භාණ්ඩ නිපදවීම තහනම් කිරීම, ඇමරිකාව තුළ කර්මාන්ත ශාලා ඇති කිරීමට ඉඩ නොදීම ආදී කාරණා නැගී එන වෙළඳ ප්‍රජාවට මෙන්ම ජනපදවාසීන්ටද ඉමහත් පීඩාකාරී කාරණා විය.

මෙහි අවසන් ප්‍රතිඵලය වූයේ, මේ පීඩනයන්ට එරෙහිව සංවිධානය වූ ජනතාව සන්නද්ධ වී සිවිල් යුද්ධයකින් බ්‍රිතාන්‍ය රාජාණ්ඩුවේ යටත්විජිත පාලනය අවසන් කර දැමීමයි. එනිසා ඉහත සඳහන් ප්‍රංශ සහ ඇමරිකන් විප්ලවයන් හුදෙක්ම එම අරගලයන්ට සම්බන්ධ වූ ජනතාවගේම වුවමනාව නොව ඒ මොහොතේ පැවති සමාජ වුවමනාව ලෙස හැඳින්විය හැක.

### වැඩවසම් රුසියාව සමාජවාදයට

1917 ඔක්තොම්බර් රුසියාවේ සිදුවූ සමාජවාදී සමාජ විප්ලවයේ තීරණාත්මක කාර්ය භාරයක් ඉටු කරන ලද්දේ ලෙනින් ප්‍රමුඛ නිර්ධන පංතියේ දේශපාලන පක්ෂ විසින් බව විවාදයකින් තොරව පිළිගත හැක. එහෙත් එම බල පෙරළිය ඓතිහාසික තත්වයන්, පුද්ගල සුවිශේෂීතා මත සිදුවූ ඉතාමත් සංකීර්ණ ක්‍රියාවලියක් බව අප අමතක කළ යුතු නැත.

ඒකාධිපති **15වැනි පිටුවට**



"සතුරා අපට වියරු ලෙස පහර දෙන්නේ නම්ද, එකම එක යහ ගුණයක් හෝ නැතිව, හොඳටම කළු කොට අප සිත්තම් කරන්නේ නම්ද, එය වඩාත් හොඳය. අප සතුරාත් අපත් අතර පැහැදිලි වෙන්කිරීමේ ඉරක් ඇඳ තිබෙන බව පමණක් නොව, අප අපේ වැඩවලදී බොහෝ දේ මුදුන්පත් කර තිබෙන බවද එයින් පෙනී යයි."

**මාඕ සේතුං**
**තෝරාගත් ලිපි, 143 පිට**

# ප්‍රංශය: කම්කරු උද්ඝෝෂණවලට මැදිවී



ප්‍රංශය පසුගිය අවුරුදු විස්සක් තුළ මතුවූ දැවැන්තම උද්ඝෝෂණ රැල්ලට හා වැඩවර්ජන මාලාවට මුහුණදී සිටී. ඊට ප්‍රධාන නිමිත්ත වී ඇත්තේ, ප්‍රංශයේ වත්මන් ආණ්ඩුව හඳුන්වා දීමට සැරසෙන කම්කරු නීති ප්‍රතිසංශෝධනයයි.

මෙම කම්කරු නීති සංශෝධනය ගෙන ඒමට සූදානම් වන්නේ, වත්මන් සමාජවාදී පක්ෂ ආණ්ඩුවේ කම්කරු ඇමති මයිරියාම් එල් බොම්රිය. ඒ නිසා එම සංශෝධනයන් 'එල් බොම්රි' සංශෝධනයන් ලෙසද හැඳින්වේ. කම්කරු ඇමතිවරයාට හා ආණ්ඩුවට අනුව මෙම කම්කරු නීති ප්‍රතිසංශෝධනය ඉලක්ක කර ඇත්තේ ප්‍රංශයේ දැවෙන ප්‍රශ්නයක්ව ඇති විරැකියාව අඩු කරලීම හා ව්‍යාපාරයන්ට හිතවත් පරිසරයක් නිර්මාණය කිරීමයි. (ප්‍රංශයේ විරැකියා ප්‍රතිශතය 10%කි.)

හඳුන්වාදීමට සූදානම් වන නව නීති රීති යටතේ බඳවාගනු ලබන නවක කම්කරුවන් සඳහා සමාගම්වලට තමන්ට අවශ්‍ය නීති රීති පැනවීමට ඉඩ කඩ ලැබෙන අතර 2000 වසරේදී හඳුන්වා දුන් පැය 35ක වැඩ සතිය වෙනස් කිරීමටද ඉඩ කඩ සැලසේ. නව නීති රීතිවල ව්‍යවස්ථා අංක 02 අනුව සමාගම් අතර ඇති කර ගන්නා ගිවිසුම්වලට ආණ්ඩුව සමඟ ඇතිකර ගන්නා ගිවිසුම්වලට වඩා වැඩි බලයක් හිමිවේ. අතිකාල දීමනා ගෙවීම් දැනට 25% වන අතර එය 10% දක්වා අඩුකර ලීමට නව නීති මගින් ඉඩ කඩ ලබා දෙයි. මීට අමතරව සමාගම්වල ලාභ හෝ අලෙවිය සැලකිය යුතු ප්‍රමාණයකින් අඩු වේ නම් සේවකයන් රැකියාවලින් ඉවත් කිරීමට සමාගම්වලට අවසර ලැබේ.

මෙම යෝජනාවලියට පාලක සමාජවාදී පක්ෂයේ මන්ත්‍රීවරු පිරිසක්ද විරුද්ධ වී සිටිති. මේ නිසා ප්‍රංශ ආණ්ඩුවට මෙම පනත ප්‍රංශ පාර්ලිමේන්තුවේ පහළ මණ්ඩලයේදී ඡන්ද විමසීමකින් තොරව සම්මත කර ගැනීම සඳහා ප්‍රංශ ව්‍යවස්ථාවේ ව්‍යවස්ථා අංක 49 ක්‍රියාත්මක කිරීමට සිදු විය. ප්‍රංශ ජනාධිපති ප්‍රංශුවා හොලන්ඩේට සිය ධුර කාලය තුළදී ව්‍යවස්ථාවේ මෙම කොටස භාවිත කිරීමට සිදුවූ දෙවන අවස්ථාව මෙයයි. මීට පෙර ප්‍රංශය තුළ ආර්ථික ප්‍රතිසංස්කරණ හා ආර්ථික ලිහිල්කරණය හඳුන්වාදීමේදීද ඔහුට මෙම කොටස භාවිත කිරීමට සිදු විය.

'එල් බොම්රි' සංශෝධනයන්ට එරෙහිව මේ වන විට ප්‍රංශය පුරා දැවැන්ත විරෝධතා රැල්ලක් පැන නැගී තිබේ. පසුගිය 26වැනි බ්‍රහස්පතින්දා පමණක් කම්කරුවන් හා තරුණයන් මිලියන 1.2ක් (වෘත්තීය සමිතිවලට අනුව) පොලීසිය පවසන අන්දමට තුන් ලක්ෂ අනූදාහක් වීදිවලට බැස නව කම්කරු නීති සංශෝධනයට විරුද්ධව උද්ඝෝෂණය කළහ. ශිෂ්‍ය සංගම් හා වෘත්තිය සමිතිවලට අනුව මේ වන විට ප්‍රංශය පුරා පා ගමන්, උද්ඝෝෂණ, උද්ඝෝෂණ රැලි 200කට අධික සංඛ්‍යාවක් පවත්වා තිබේ. කර්මාන්ත, වරාය, දුම්රිය, ගුවන් ආදී සෑම ක්ෂේත්‍රයකම කම්කරුවන් මෙම උද්ඝෝෂණවලට සම්බන්ධ වී තිබේ. ප්‍රංශයේ ජන මත සමීක්ෂණවලට අනුව ප්‍රංශ ජනතාවගෙන් අඩකට වැඩි පිරිසක් හඳුන්වා දීමට යන මෙම නව කම්කරු නීතිවලට විරුද්ධය.

## රුසියාව: වටළෑම තවදුරටත්



රුසියාව යුදමය වශයෙන් වට කිරීමේ එක්සත් ජනපද සැලැස්ම තවදුරටත් සිදුකෙරෙමින් පවතී. එම ක්‍රියාවලියේ වැදගත් සිදුවීම් කිහිපයක් පසුගිය මාසයේදී සිදුවිය.

මැයි තුන්වන අඟහරුවාදා එතෙක් යුරෝපයේ එක්සත් ජනපද හමුදා ප්‍රධානියා වූ ජෙනරල් පිලිප් බ්‍රීඩ්ලව් වෙනුවට ජෙනරල් කර්ටිස් එම් ස්කැපොරෝවිච් පත් කරනු ලැබිණි. එය සිදු වූයේ යුරෝපයේ එක්සත් ජනපද හමුදා මූලස්ථානය පිහිටා ඇති ජර්මනියේ ස්ටට්ගාර්ඩ් නුවරදීය.

මීට පෙර ඔහු දකුණු කොරියාවේ එක්සත් ජාතීන්ගේ හමුදාවේ එක්සත් ජනපද අනුබණ්ඩය භාර අණ දෙන නිලධාරියා ලෙස කටයුතු කළේය.

රුසියාව එක්සත් ජනපදයේ ජාතික ආරක්ෂාවට තර්ජනයක් ලෙස ප්‍රකාශ කරමින් එක්සත් ජනපදය නැගෙනහිර යුරෝපීය රටවල පාබල හමුදා රඳවා තබා තිබෙන අතර යුධ අභ්‍යාස ඇතුළු යුධ ක්‍රියාකාරකම් ඉහළ දමා තිබේ. පසුගිය අවුරුදු තුන තුළ පමණක් එක්සත් ජනපදය නැගෙනහිර යුරෝපීය රටවල ස්ථානගත කර ඇති යුධ ගුවන් යානා සහ යුද ටැංකි ප්‍රමාණ ඉහළ නැංවීය. ඊට අමතරව එහි රඳවා ඇති හමුදාව හතළිස්දාහ දක්වා දෙගුණ කළේය.

මේ අතර පසුගිය 19 වන දා නැටෝ සංවිධානය (උතුරු අත්ලාන්තික් ගිවිසුම් සංවිධානය) ඊසාන දිග රුමේනියාව තුළ නව මිසයිල 24ක් ස්ථාන ගත කළේය. ඒ සඳහා යුරෝ මිලියන 880ක් වැය විය. ඊසාන දිග රුමේනියාවේ සිට රුසියාවේ ස්වයං පාලන ප්‍රදේශයක් වන ක්‍රිමියාවට ඇත්තේ කිලෝමීටර් 600ක දුරකි.

## යුරෝපය: සරණාගත ප්‍රශ්නයෙන් බැටකමින්




යුරෝපා කොමිසම විසින් පසුගිය මැයි 04 වනදා විවාද සම්පන්න යෝජනාවක් ඉදිරිපත් කරනු ලැබීය. එනම් යුරෝපා සංගමයේ සාමාජික රටක් සරණාගතයන් භාර ගැනීම ප්‍රතික්ෂේප කරන්නේ නම් එක් සරණාගතයෙක් වෙනුවෙන් යුරෝ 25 0000 ක් යුරෝපා සංගමයට ගෙවිය යුතු යැයි යන යෝජනාවයි ඒ.

මේ වන විට සරණාගත ප්‍රශ්නය යුරෝපා සංගමය තුළ සෑම සාමාජික රටක්ම මුහුණ පා සිටින ප්‍රබල ගැටලුවක් බවට පත් වී අවසන්ය. මෙම සරණාගතයන් ප්‍රධාන වශයෙන් පැමිණෙන්නේ, අධිරාජ්‍යවාදී රටවල මැදිහත්වීම් හේතුවෙන් සිවිල් යුද තත්වයක් ඇතිවූ ඇෆ්ගනිස්ථානය, ලිබියාව, සිරියාව වැනි රටවල සිටයි. යුරෝපා සංගමයේ සරණාගතයන් පිළිබඳ නීති පද්ධතිය වූ ඩබ්ලින් නීතිරීතිවලට අනුව සරණාගතයෙකු පළමුව ඇතුළුවන රට විසින් එම සරණාගතයා භාර ගත යුතුයි. මේ නීතිය හේතුවෙන් යුරෝපා සංගමයේ රටවල් කිහිපයකට තමන්ට ඔරොත්තු නොදෙන තරමේ සරණාගතයින් ප්‍රමාණයක් භාර ගැනීමට බල කෙරී තිබේ. එබැවින් ඩබ්ලින් නීති වෙනස් කිරීම කෙරෙහිද යුරෝපා සංගමයේ අවධානය යොමුවී තිබේ.

කෙසේ වෙතත් යුරෝපා කොමිසමේ ඉහත යෝජනාව ක්‍රියාත්මක වීමට පෙර යුරෝපා පාලිමේන්තුවේදී එය සම්මත විය යුතුය. හංගේරියාව, චෙක් ජනරජය, ස්ලෝවැකියාව හා පෝලන්තය යන රටවල් ඔවුන්ගේ අභ්‍යන්තර කටයුතු අමාත්‍යාංශ නිල නිවේදනයක් හරහා මෙම යෝජනාව දැනටමත් ප්‍රතික්ෂේප කර තිබේ.

## නේපාලය: චීනයට ළං වන හැඩ




චීනය ප්‍රථම වතාවට වයඹ දිග චීනයේ සිට නේපාලය දක්වා ප්‍රවාහන සේවයක් ආරම්භ කර තිබේ. මෙම ප්‍රවාහන සේවයේ කොටසක් දුම්රිය මාර්ග හරහාද අනෙක් කොටස මහා මාර්ග හරහාද සිදු කෙරේ. එය වයඹ දිග චීනයේ ගැන්සු පළාතේ සිට නේපාලයේ අගනුවර වන කත්මන්ඩු දක්වා විහිදේ. ගමන සඳහා දින 10ක කාලයක් ගතවන අතර එහිදී දුම්රියෙන් කිලෝමීටර් 2431ක් ද මහා මාර්ග හරහා කිලෝමීටර් 724 ක් ද ගමන් කිරීමට සිදුවේ. මෙම මාර්ගය භාවිතා කිරීමේදී චීනයේ සිට මුහුදු මාර්ගයෙන් හා ගොඩබිමින් කත්මන්ඩු නුවර දක්වා ගමන් කිරීමට යන කාලයට වඩා අඩු කාලයකින් නේපාලයට ළඟා විය හැකි වීම විශේෂ වාසියකි.

මුළුමනින්ම ගොඩබිමින් වට වී ඇති රටක් වන නේපාලයට ජාත්‍යාන්තර ප්‍රවාහන කටයුතු සඳහා මෙතෙක් භාවිතා කිරීමට සිදුවූයේ ඉන්දියාවේ වරායන්ය. එහෙත් පසුගිය කාලයේදී ඉන්දියාව නේපාලයේ දේශපාලනය තමන්ට අවශ්‍ය පරිදි හැසිරවීම සඳහා මෙම තත්වය උපයෝගී කර ගත්තේය. නේපාලයට චීනයේ සිට මෙවැනි ගොඩබිම් මාර්ගයක් සැකසීම දේශපාලනිකව වැදගත් සිදුවීමක් වන්නේ එබැවිනි.

එසේ වූවද නේපාලය හා චීනය සම්බන්ධ කරන බිම් තීරුව භූ විෂමතාව අතින් දුෂ්කර ප්‍රදේශයක් වන නිසා ජාත්‍යාන්තර ප්‍රවාහන කටයුතු සඳහා මෙම මාර්ගය යොදා ගැනීම තවත් කාලයක් ගත වන සිදුවීමක් වීමටද ඉඩ තිබේ.

# විකිණීමේ අලුත් කලාව: ණයට හිලව්කර අයිතිය අලෙවිය

විවෘත ආර්ථික මොඩලය තුළ 'පෞද්ගලීකරණ' සංකල්පයට ඇත්තේ අමිල වටිනාකමකි. පෞද්ගලීකරණය විසින් විවෘත ආර්ථිකයට හැම විටම ඉහළ මිලක් ලබා දෙන ලදී. විවෘත ආර්ථිකයේ පැවැත්මේ සහජාතීය ලක්‍ෂණය පෞද්ගලීකරණය විය. නමුත් ඊට ප්‍රතිවිරුද්ධ ලෙස සමාජය තුළින්ද පෞද්ගලීකරණයට එරෙහි සමාජ මතයද පෝෂණය විය. දුබල ධනපති පාලකයින් තම පැවැත්මේ කොන්දේසියක් ලෙස රාජ්‍ය වතු, රාජ්‍ය ව්‍යාපාර, රාජ්‍ය දේපළ පෞද්ගලීකරණයට යොමුකරන තරමටම එයින් පීඩාවට පත්වූ ගොවි ජනතාව, වැඩකරන ජන කොටස් සහ රාජ්‍ය සම්පත් ජනතාවගේ අයිතියක්ව පැවතිය යුතුය යන ප්‍රගතිශීලී මතය දරන ලද බොහෝ කොටස් ඊට එරෙහි මතයේ කොටස්කරුවෝ වූහ.

1977න් පසු පැවති එ.ජා.ප., ශ්‍රීල.නි.ප. හවුල් සියලු පාලන කාලයන් තුළ වරින්වර රාජ්‍ය දේපළ ආයතන ලෙස පෞද්ගලීකරණයට ලක්කරන ලදී. නමුත් ඊට එරෙහිව ප්‍රබල ලෙස ගොඩනැගුණු සමාජ විරෝධය හමුවේ පැවති පාලකයින්ට සිදුවූයේ එක්කෝ විකිණීම සාධාරණීකරණය කිරීම හෝ නැතිනම් විකිණීම-පෞද්ගලීකරණය වෙනුවට වෙනස් වචන මාලාවක් සොයාගැනීමය. කොටස් හිමිකම් සේවකයින්ට ලබාදීම-ජනතාකරණය ආදී නොයෙක් නාමකරණයන්ට ලක්ව වුවද හරයෙන් සිදුවූයේ මෙම විකිණීමේ-පෞද්ගලීකරණයේ කටයුත්තමය. එසේ විකිණීමේ ක්‍රියාමාර්ගවලින් තොරව විවෘත ආර්ථිකය පැවැත්මේ තේරුමක් ධනපති පංතියට නොමැති විය.

## එ.ජා.ප.ය සහ විකිණීම

ලංකාවේ රාජ්‍ය සම්පත් විකිණීමේ කටයුතු සඳහා ශ්‍රීල.නි.ප. ආණ්ඩු පියවර ගත් අවස්ථා බොහෝ විය. පාඩු ලබන රාජ්‍ය ආයතනය විකිණීම වෙනුවෙන්ම වෙනම ආයතනික ව්‍යුහයන්ද ඔවුන් විසින් සකස් කරනු ලැබීය. නමුත් විකිණීම දේශපාලනය ලාංකේය දේශපාලනය තුළ පැළකර පෝෂණය කිරීමේ සම්පූර්ණ ඉතිහාසමය කාර්ය කොටස ඉටුකරනු ලැබුයේ එක්සත් ජාතික පක්‍ෂ ආණ්ඩු විසිනි. දැන් වර්තමානයේදීද යළි නව මුහුණුවරකින් විකිණීමට පණ දීමට ඉදිරිපත් වී ඇත්තේද ඔවුන්මය. ඒ, එ.ජා.ප.යට විකිණීම සඳහා වන ඉතිහාසමය වටිනාකම (?) නිසා දැයි සැක හිතෙන තරමටම එම ක්‍රියාවලිය යළි කරළියට පැමිණෙමින් තිබේ.

අලුත්ම විකිණීමේ සැලැස්ම වී ඇත්තේ, පසුගිය පාලන කාලයන් තුළ (විශේෂයෙන්ම රාජපක්‍ෂ ණය) ආණ්ඩු විසින් රටට ලබාගෙන ඇති ගෙවිය යුතු ණය වෙනුවෙන් හිලව්වට අදාළ ව්‍යාපෘතියේම අදාල කොටස් හිමිකම ණය ලබා දුන් රටට ලබා දීමයි. කොටස් අයිතියෙන් ණය ගෙවීම මෙම නව විකිණීමේ ක්‍රමයයි. මෙම නව ක්‍රමය රනිල්-මෛත්‍රී පාලනය 'විකිණීම' ලෙස නොව 'ණය ගෙවීම' ලෙස හඳුන්වා දෙනු ඇත.

එ.ජා.ප. පාලකයින් විකිණීමේ, පෞද්ගලීකරණයේ ජන්ම පුරුදුකාරයින් වුවද, පැවති රාජපක්‍ෂ පාලනයට එරෙහි ඔවුන් ගොඩනැගූ සමාජ මතවාද තුළ පෞද්ගලීකරණයට එරෙහි සටන්පාඨයද ඉහළින්ම විය. එ.ජා.ප.ය පෞද්ගලීකරණයට දායක වූ ඉතිහාසය විසින් ඔවුන්ට ජනතාව විසින් ලබා දුන් පරාජයන්ගේ වේදනාව නිසාම ඔවුහු මින් ඉදිරියට පෞද්ගලීකරණය තමන්ගේ වැඩපිළිවෙළක ප්‍රතිපත්තිය නොවන බව දිවුර දිවුරා කියන මට්ටමකට පත්වූහ. කලින් පැවති එ.ජා.ප.යට වඩා තමන් ඉඳුරා වෙනස් බවත් රාජ්‍ය දේපළ විකිණීමේදී තමන් ඉතිහාසයේ ගනු ලැබූ තීරණ පිළිබඳව ස්වයංවිවේචනයක් කර ඇති බවත් ජනතාවට කීමට තරම් ඔවුහු ඉක්මන් වූහ. ඒ නිසාම පසුගිය 'යහපාලන රැවටීම' වෙනුවෙන් ඡන්දය දුන් ජනතාව නාස්තිය, වංචාව, දූෂණය, හොරකමට එරෙහිව මෙන්ම යළි පෞද්ගලීකරණ සූදුව සිදු නොවනු ඇතැයිද යම් පමණකට විශ්වාස කරමින් එ.ජා.ප.ය වෙනුවෙන් ඡන්දය ප්‍රකාශ කළේය. නමුත් බලු නකුටේ ඇද ඇරිය නොහැකිවා සේ යළි එ.ජා.ප.ය සුපුරුදු විකිණීමේ ක්‍රියාවලියට අත තබා තිබේ. නමුත් ඒ පරණ පුරුදු ලෙස විකිණීම යන තේරුමෙන් නොව 'ණය ගෙවීම' ලෙසිනි.

වාර්තා වන කරුණු අනුව ණය ගෙවීමට 'විකිණීම' ආදේශ කර ඇත්තේ, ප්‍රධාන ලෙසම චීන ණය ගැනීම සඳහාය. චීනයේ ආයෝජන ලෙස පසුගිය රාජපක්ෂ පාලන කාලය තුළ ණය ලබාගෙන ක්‍රියාවට නගන ලද මත්තල ගුවන්තොටුපළ, හම්බන්තොට වරාය, අධිවේගී මාර්ග ආදී ව්‍යාපෘති රැසක් ඇත. එම ණය ගැනීම සිදු කරන ලද්දේ ශක්‍යතා අධ්‍යයනයක් මගින් රටේ අවශ්‍යතාවයන් හඳුනා ගැනීමකින් නොව රාජපක්ෂවරුන්ගේ තේජස පිම්බීම සඳහාය. නමුත් ඒ ණය මගින් ගොඩ නැගූ වරාය අද නැව් නැති, ව්‍යාපාර කටයුතු සිදු නොකරන වරායකි. කලාතුරකින් සිදුවන්නේ කොළඹ වරායට එන හදිසි තොග කොළඹදී ගොඩබෑම වෙනුවට අමතර වියදම් දරා හම්බන්තොටින් ගොඩබෑමය. අද ආණ්ඩුව යෝජනා කර ඇත්තේ, ණයට හිලව්වට හම්බන්තොට වරාය චීනයට සින්නක්කරව ලබා දීමටය. එවිට ණය වෙනුවට චීනයට තමන්ට අයිතිය හිමි ව්‍යාපාරයක් ලැබෙනු ඇත. වත්ත බද්දට දී ඇස්සට දත නියවීම සිහි ගන්වන්නේ මෙවිටය.

## බැරිකම විකිණීම - ශ්‍රීලංකන්

පවත්වා ගත නොහැකි ව්‍යාපෘති ණයට හිලව්වට විකිණීම මෙන්ම පාඩු ලබන රාජ්‍ය ව්‍යාපාර පෞද්ගලීකරණය වෙනුවට කළමනාකරණය පෞද්ගලීකරණය කිරීමද තවත් රනිල් - මෛත්‍රී 'යහපාලනයේ' පෞද්ගලීකරණ පිම්මකි. එහි අලුත් ආණ්ඩුවේ පළමු අත්හදා බැලීමට තෝරාගෙන ඇත්තේ ශ්‍රීලංකන් ගුවන් සමාගමය. ශ්‍රීලංකන් ගුවන් සමාගම රජයට පවරා ගත් 2008 වර්ෂයේදී රුපියල් මිලියන 4428ක ශුද්ධ ලභයක් ලබා තිබුණි. ඒ, එමිරේට්ස් ආයතනය සමග ඒකාබද්ධ ව්‍යාපාරයක් ලෙස පවතින විටදීය. ඉන්පසු 2016 මේ දක්වාම එය අඛණ්ඩව පාඩු ලබයි. (ඇමුණුම 01)

ශ්‍රී ලංකන් පාඩුව

| වර්ෂය | අලාභය (රු.මිලියන) |
|---|---|
| 2009 | 9306 |
| 2010 | 2698 |
| 2011 | 382 |
| 2012 | 19,778 |
| 2013 | 21,750 |
| 2014 | 32,408 |
| 2015 | 16,495 |

පාඩු එකතුව රු.මිලියන 102,816

එසේම සේවක පිරවීම දේශපාලන තීන්දු මත සිදුවීම නිසා එක් ගුවන් යානයකින් නඩත්තු කරන සේවක ප්‍රමාණය 333කි. 2014/15 වර්ෂයේ දෙසැම්බර් 31 වන විට සමාගමේ ශුද්ධ වත්කම් සෘණ වටිනාකමක් බවට පත්වී තිබුණි. එම සෘණ ශුද්ධ වත්කම් ප්‍රමාණය රු. මිලියන 74106 (බිලියන 74ක්) විය. ඒ අනුව ශ්‍රීලංකන් ගුවන් සමාග මේ ජංගම වත්කම ජංගම වගකීම් පියවීමටවත් ප්‍රමාණවත් නොවීය. ඒ නිසාම වාර්ෂිකව රු. බිලියන 19ක් පමණ රජයේ භාණ්ඩාගාරයෙන් ලබා දෙමින් ශ්‍රීලංකන් ගුවන් සමාගම නඩත්තු කර ඇත. ශ්‍රීලංකන් ගුවන් සමාගම අඛණ්ඩව පාඩු ලැබීම නිසා 2014 වන විට පාඩු ලැබූ මුළු කාලය සඳහා රජයේ භාණ්ඩාගාරය විසින් කෙටි කාලීන ණය පියවීමට රු. මිලියන 46,470ක් වරින් වර ශ්‍රීලංකන් ගුවන් සමාගමට ලබාදී ඇත. මේ සියලුම ණයබර තිබියදී පසුගිය රාජපක්ෂ පාලනය විසින් තමන්ට ලැබෙන කොමිස් මුදල් නිසා කිසිදු ශක්‍යතාවයක් නොසලකා තවත් ගුවන් බස් 07ක් මිලදී ගැනීමට ගිවිසුම් අත්සන් කර මේ වනවිට මිලදී ගත යුතු තත්වයට ගනුදෙනුව පත්ව ඇත. රජය එම ගුවන් බස් මිලදී ගන්නේ නම් මාසයකට ඇමරිකන් ඩොලර් බිලියන 1.4ක් බැගින් ගෙවීමට සිදුවනු ඇත. එයද ඉදිරියේදී ශ්‍රීලංකන් පාඩු ගොඩට තවත් පාඩු එකතු කරනු ඇත.

වර්තමාන 'යහපාලන' පාලනයේ නවතම යෝජනාව වී ඇත්තේ මේ සියලු පාඩු රජය දරාගෙන පාඩු ශුද්ධ කර ශ්‍රීලංකන් ගුවන් සමාගම වෙනත් රටක ගුවන් සමාගමකට පාලනය කිරීමට භාර දීමයි. මෙතෙක් 2008 සිට සිදු කළ පාඩුවලට දැන් වගකිව යුතුව ඇත්තේ ජනතාවය. භාණ්ඩාගාරය සියලු ණය සහ පාඩු භාර ගන්නවා යනු ශ්‍රීලංකන් ගුවන් සමාගමේ පැවති පාලකයන්ගේ ණය ජනතාව විසින් භාරගත යුතුය යන්නය. ජීවිතයේ එකදු දිනයකදීවත් ගුවන්යානයකට ගොඩ නොවැදුණු වැඩකරන ජනතාව, ගොවි ජනතාව, ධීවර ජනතාව මේ පාඩු භාරගත යුතුය යන්නය. කිරි දොවන කොටස පෞද්ගලීකරණය කොට තණ කවන කට ජනතාවට පැවරීම මෙහි සරල තේරුමය.

අද දවසේ 'පෞද්ගලීකරණය නොකර' පෞද්ගලීකරණ වැඩපිළිවෙළ වෙනස් ලෙසකින් ක්‍රියාත්මක කිරීමට හොඳම උදාහරණයකි, ශ්‍රී ලන්කන් ගුවන් සමාගමට රජය සිදුකිරීමට යෝජනා කරන විකිණීමේ ක්‍රමය.

අපට නැගෙන සරලම ප්‍රශ්නය වන්නේ, (ශ්‍රී ලංකන් ගුවන් සමාගම මෙතෙක් පැවති රාජපක්ෂ පාලනය විසින් පාඩු කළ බව ඇත්තය.) ඒ, සියලු පාඩු භාණ්ඩාගාරය විසින් භාරගන්නේනම් වර්තමාන පාලනයට පෞද්ගලීකරණය නොකර (බාහිර පාර්ශ්වයකට කළමනාකරණය නොපවරා) පවත්වාගෙන යා නොහැක්කේ මන්ද යන්නය. පාඩු ලාභ කළ නොහැක්කේ පාඩුවල බර වැඩි නිසානම් එය පිළිගත හැකිය. නමුත් ඒ සියලු පාඩු ශ්‍රී ලංකාවේ ජනතාව පිට පටවා කළමනාකරණය විකිණීමට උත්සාහ දැරීමෙන් තේරුම් ගත හැක්කේ රටක් පාලනය කරනවා තබා එක් ආයතනයක්වත් මනා කළමනාකරණයකින් පවත්වා ගෙන යාමට වර්තමාන දුබල ධනපති පාලකයින්ට නොහැකි බවය.

නමුත් සැබෑ තත්වය නම්, මෙය රනිල් මෛත්‍රී පාලනයේ කළමනාකරණ නොහැකියාවක් නිසා මේ කොටසින් කොටස පෞද්ගලීකරණය කිරීමක් නොව විවෘත ආර්ථික මොඩලයේ, ධනපති පාලනයේ සැබෑ ස්වභාවය ලෙසින්ම විකිණීම තවත් වටයකින් අරඹා ඇති බවය. අද ශ්‍රීලංකන් ගුවන් සමාගමට ආණ්ඩුව ඉදිරිපත් කරන විකිණීමේ තර්කයම හෙට දිනයේදී ඉතිරිව ඇති ඛනිජ තෙල් සංස්ථාවේ කොටස් කිහිපයටත් ජල සම්පාදනයටත් විදුලි බලයටත් සෞඛ්‍ය සේවයටත් යෝජනා කරනු ඇත. ණය වෙනුවට ණයට හිලව් කරන ව්‍යාපෘති මුවාවෙන් අධිරාජ්‍යවාදී ප්‍රාග්ධනය මෙන්ම බලහත්කාරයද අපගේ දේශයට පතිතවනු ඇත. ඒ නිසා ධනපති ක්‍රමයේ දුර්වල පාලකයින් තනි තනිව හෝ හවුලේ හෝ ජනතාව මුලා කරමින් සිදු කරන මේ සම්පත් මංකොල්ලය, රාජ්‍ය දේපළ ජනතාවට අහිමි කිරීම අප තේරුම් ගත යුතුව තිබේ.






"අවසාන විග්‍රහය අනුව බලන කල, නව සමාජ ක්‍රමයේ ජයග්‍රහණය සඳහා අන් සියල්ලටම වඩා වැදගත් වන්නේ හා ප්‍රධාන වන්නේ ශ්‍රම ඵලදායකත්වයයි. ප්‍රවේණිදාස ක්‍රමය යටතේ කිසි කලෙකත් නොදුටු ශ්‍රම ඵලදායකත්වයක් ධනපති ක්‍රමය විසින් ජනිත කරන ලදී. නව සහ ඉතා උසස් ශ්‍රම ඵලදායකත්වයක් නිර්මාණය කිරීම මගින් සමාජවාදය විසින් ධනපති ක්‍රමය අන්ත පරාජයට පත් කරනු ලැබිය හැකිය. මෙය ඉතා දුෂ්කර කටයුත්තකි. ඒ සඳහා දීර්ඝ කාලයක් අවශ්‍යය. නමුත් එය ආරම්භ කර තිබේ. වැදගත් කාරණය එයයි."

**ලෙනින්**
**ප්‍රවුදා පුවත්පත**
**1919 මැයි 23**

# ගංවතුරට යට වූ ආණ්ඩුව හා අපේ වගකීම

"එලක වැටීම මොළයට ලාභයක්'' යැයි පැරණි කියමනක් ඇත. එයින් හැඟවෙන්නේ පරාජිත හෝ විනාශකාරී යම් අත්දැකීමක් ඔස්සේ අපට යමක් උගෙන ගැනීමට අවස්ථාවක් ලැබෙන බවය; එවැන්නක් නැවත සිදුනොවී වළක්වා ගැනීමට හෝ නැවත එවැනි දෙයක් සිදු වූ විට හානිය අවම කර ගැනීමට අපට යම් අවබෝධයක් ලැබෙන බවය.

එහෙත් මෙම කියමන අපේ රටේ ආණ්ඩු කළ හා කරවන පාර්ශ්වයන්ට අදාළ නොවන්නේදැයි සිතෙන්නේ අත්දැකීම් තුළින් පාඩම් උගෙන ගන්නා බවක් නොපෙනෙන බැවිනි. පසුගියදා ජල ගැලීම් හා නායයෑම් වැනි හදිසි ආපදා තත්වයන්ට රටේ සමහර ප්‍රදේශ ගොදුරු වූ විට මේ බැව් මනාව පසක් විණි.



ආපදා කළමනාකරණ අමාත්‍යාංශයක් වෙනමම පිහිටුවා තිබුණද එයින් හදිසි ආපදා තත්වයන් ඇතිවීම වළක්වා ගැනීමට ක්‍රියාමාර්ග ගත් බවක් හෝ ආපදා තත්වයක් ඇති වූ විට ජනතාවට සහන සැලසීමේ ක්‍රියාවලිය සඳහා ක්‍රියාකාරීව මැදිහත් වූ බවක් පෙනෙන්නට නොතිබිණි.

විශේෂයෙන් මෙවැනි ආපදා තත්වයකදී ඊට මුහුණ දුන් කාන්තාවන් හා ළමුන් පිළිබඳව විශේෂ අවධානයක් හා සොයා බැලීමක් කළ යුතු වුවත් එය එසේ නොවුණි. උන් හිටි තැන් අහිමි වූ ජනතාව තාවකාලික කඳවුරු තුළ ගාල් කිරීමේදී විශේෂයෙන් කාන්තාවන් හා ළමුන්ගේ ආරක්ෂාව වෙනුවෙන් කිසිදු පියවරක් ආණ්ඩුව ගෙන නොතිබිණි. ඒ වෙනුවට ළමා ආරක්ෂණ අධිකාරියේ වගකිව යුත්තන් ක්‍රියා කළේ කඳවුරු තුළදී විවිධ අපචාරයන්ට ළමුන් ලක්විය හැකි බැවින් ළමුන්ගේ ආරක්ෂාව තහවුරු කිරීමට පියවර ගන්නවා වෙනුවට ළමුන්ගේ ආරක්ෂාව දෙමාපියන්ටම පවරා ආණ්ඩුව වගකීමෙන් නිදහස් වීමය. කඳවුරු තුළ කාන්තාවන් හා ළමුන් වෙනුවෙන් විශේෂ පහසුකම් සලසා දිය යුතු වුවත් එවැන්නක් සිදු නොවුණි.

ආපදා තත්වය පහව ගිය පසුවද ආණ්ඩුවේ අදාළ ආයතන ක්‍රියා කරනුයේ ඇල් මැරුණු ස්වරූපයෙනි. ආපදාවන්ට ලක් වූ ප්‍රදේශ තුළ විශේෂයෙන් පැන නැගිය හැකි සෞඛ්‍ය ගැටලු සම්බන්ධයෙන් සෞඛ්‍ය සායන හෝ එම ජනතාව විශේෂයෙන් නිවස තුළ මූලික කාර්යභාරයක් කරනු ලබන කාන්තාවන් දැනුවත් කිරීමේ වැඩසටහන් හෝ පැවැත්වීමට ආණ්ඩුව පියවර ගෙන නොමැත.

මෙම ආණ්ඩුවේ අසමත්භාවය කොතෙක්ද කිවහොත් මියගිය හා අතුරුදන් වූ සංඛ්‍යාව තවමත් නිවැරදිව පැවසීමට ආණ්ඩුව අපොහොසත් වී ඇත. ආපදා තත්වයන් තුළින් අපේ රටේ ආණ්ඩු පාඩම් ඉගෙන නොග න්නේ නම් ජනතාව පාඩම් ඉගෙන ගත යුතුය. විශේෂයෙන් ආණ්ඩු පත් කිරීමේදී ඊට විශාල වශයෙන් දායක වන කාන්තාවන්වත් මෙයින් පාඩම් ඉගෙන ගත යුතුය. එනම් මේ පැවතුණු හා පවතින ආණ්ඩු රටේ උද්ගතව ඇති බොහෝ ගැටලු හා අර්බුද විසඳීමට අපොහොසත් වී ඇතිවා මෙන්ම හදිසි ආපදා තත්වයන් තුළදීද ඊට මුහුණ දීමට අපොහොසත් හා අසාර්ථක වී ඇති බවය. කාන්තාවන් වශයෙන් අප කළ යුතු වන්නේ මෙම පාඩම ඊළඟ ආපදා තත්වයකදී නැවත සිහි ගන්වා ගැනීමට ඉඩ නොතබා ආපදා තත්වයන් තුළදී පමණක් නොව සාමාන්‍ය ජන ජීවිතයේදීත් ජනතාවට සැබෑ ලෙසම සහන සලසන යහපත් සමාජයක් ගොඩ නගා ගැනීමට මැදිහත් වී කටයුතු කිරීමය.

## සිව්දෙසින්

### කිරි ගොවීන් විරෝධතාවයේ...

දියර කිරිවල මිල අඩු කිරීමට විරෝධය පාමින් ඕස්ට්‍රේලියාවේ කිරි ගොවීහු මැයි 25 දින මෙල්බර්න්, ඇඩිලේඩ් හා බ්‍රිස්බේන් නගරවල විරෝධතාවයේ යෙදුණාහ.

මෙල්බර්න්හි විරෝධතාවයට එක් වූ කිරි ගොවීන් විසින් වික්ටෝරියන් පාර්ලිමේන්තුව දක්වා පෙළපාලියේ ගොස් පාර්ලිමේන්තුව ඉදිරිපිට විරෝධතා රැලියක්ද පවත්වන ලදී.

ෆොන්ටෙරා සමාගම දියර කිරි කිලෝවක් ඩොලර් 5.60 සිට ඩොලර් 5 දක්වා මිල පහත හෙළා ඇති අතර මේ හේතුවෙන් කුඩා පරිමාණ කිරි ගොවීන් බංකොලොත්භාවයට පත්වීමට ඉඩ ඇති බව පැවසේ.






### එවරස්ට් නැගි පළමු ශ්‍රී ලාංකික කත...

37 හැවිරිදි ජයන්ති කුරු-උතුම්පාල එවරස්ට් කඳු මුදුනට නැගි ප්‍රථම ශ්‍රී ලාංකික කත ලෙස ඉතිහාසගත විය.

මැයි 21 දින අඩි 29 029ක් උස කඳු මුදුනට නැගි ඇය මාධ්‍යවේදිනියක් හා කාන්තා අයිතීන් පිළිබඳ ක්‍රියාකාරිනියක්ද වේ.

අඩි 26 000න් ඉහළට දැඩි ශීත හා ඔක්සිජන් හිඟ තත්වයක් පවතින බැවින් ඉතා දුෂ්කර අභියෝගයන්ට මුහුණ දීමට කඳු නගින්නන්ට සිදුවේ.

1975 ජපන් කාන්තාවක් එවරස්ට් කන්ද නැගි පළමු කාන්තාව ලෙස ඉතිහාසගත වී ඇති අතර එතැන් සිට මේ දක්වා කාන්තාවන් 418 දෙනෙකු එවරස්ට් කඳු මුදුනට ළඟාවීමට සමත් වී ඇත. ජයන්ති එවරස්ට් කන්ද නැගි 419 වන කාන්තාවය.

### ද්වේෂ දුරු කරනට කාලයයි මේ..

උදා හිරු කැන් වියැකුණා මිස යළිත් පායා එයිද සැකහැර
අඳුරු ගගනත හඬා වැටුණා මුළු රටක නෙත් කෙවෙනි බොඳකර
ලතෙත් සිත්වල ඉබි යතුරු ලූ මිනිස්කම් ගුණ යළිත් මතුකර
මහී මව් හිස කඩා වැටුණා පරපුරක් කඳු අතර සිරකර

මගේ මව්බිම වැනසුවේ ඔළු කුහර හිස් මැති ඇමති සිටුවරු
මෙවන් විපතක් වෙලාවට උන් නිවන් වැඩී සිල් ගත්ත බුදුවරු
සොබාදම දඬුවමට හසුකළ මහී මවගේ දරුවන් මුණුබුරු
නැගිටුවන්නට පෙරට ආවේ අප අතර උන් සැබෑ දෙවිවරු

දොහොත් හිස බැඳ නැගූ දුක්මුසු අඳෝනා දෙවියන්ට ඇසුණෙද?
මහා පඬුපුල් අසුන උණු වී සක් දෙවුන් ළය සිදුරු වූවෙද?
සතර වරමම හිමි වුණත් මේ දුක දකින්නට වරම් ඕනෙද?
කෝටි තිස් තුන තබා එක දෙවියෙකුත් පිළිසරණකට හිටියද?

සීත කාමර ඇතුළෙ ඉඳගෙන හදන සැලසුම් සැබෑ වෙවිද?
හීන පෙන්නා කඳුළු විකුණා සදෙව් ලොව මෙහි ගොඩ නගාවිද?
යළිත් වනසා මගේ මව්බිම, උන්ගෙ මඩි තර කර ගනීවිද?
මෙදා පාරත් අපේ දුක් ගිනි පෙර කරුම ලෙස අත් හරීවිද?

ගිලුණු පස් කඳු මතින් යළි පෙති දෙපෙති විහිදා ගොඩ නැගෙන්නට
යළිත් කිසිදා නොවෙන්නට මේ විපත් අවුරා වැට බඳින්නට
දෝරේ ගිය ගං දෑල මිනිසත් කමින් උතුරා ගලා යන්නට
දෑත් දිගුකර පිහිට වෙමු අපි වැටුණු විගසම නැගිට ගන්නට

මහාගිරි හිස් දෙරණ සිපගත් අඳෝනා යළි නොම ඇසෙන්නට
උතුම් මව්රට කෙළෙසනා යක්ෂයන් දූරීභූත වෙන්නට
අවැසි මන්තර අප සතුයි දැන් පේ වෙලා පාවඩ එලන්නට
නටා දහ අට පාලියම වුව කාලයයි දොස් දුරු කරන්නට

## දැනුම සමාජය හා චින්තනය 05

# අසත්‍යයට එරෙහිව සත්‍යය සටන් වදියි!

විද්‍යාවේ, තාක්ෂණයේ ඉහළම ඵල බුක්ති විඳින මෙම 21වන සියවසේදී පවා පොදු ජනතාවගේ චින්තනය තුළ තවමත් වැඩි වශයෙන් ආධිපත්‍යය දරන්නේ අසත්‍යයන් හා මිත්‍යාවන්ය. දැනුමේ ඉතිහාසය පුරා අසත්‍යයට එරෙහිව සත්‍යය කළ සටන මගින් කිසියම් දුරකට අසත්‍ය පරාජය වුවද එය වෙස් මාරුකර ගනිමින් විවිධ වේශයන්ගෙන් යළි යළිත් මිනිසාගේ චින්තනය තුළට කඩා වදිමින් තිබේ.

වත්මන් සමාජයේ අසත්‍යය හා මිත්‍යාව පැතිරී යන්නේත් එය තවමත් සමාජ විඥානය තුළ ආධිපත්‍යය දරන්නේත් අහම්බයකින් හෝ පුද්ගලයින්ගේ මොළයේ දුර්වලකමින් නොව ආර්ථික, දේශපාලන හා සමාජයීය හේතු රැසක ප්‍රතිඵලයක් ලෙසිනි. ඉන් ප්‍රධානම කරුණ වන්නේ යල්පැන ගිය වත්මන් ධනවාදයට මිහිමත පැවතිය හැකි වන්නේ මිනිසුන් සත්‍යය වෙනුවට මිත්‍යාවන් විශ්වාස කරන තාක් පමණක් වීමත් ඒ නිසාම ධනවාදයේ සියලුම ආයතන, මෙවලම් හා පුද්ගලයෝ පංති අරමුණින්ම මිත්‍යාවන් වැපිරීම හා තහවුරු කිරීම නොකඩවා සිදුකරන නිසාත්ය.

### අසත්‍යයන් වපුරවන්නෝ

සමාජය තුළ අසත්‍යයන් වපුරන්නෝත් එම අසත්‍යයන් තුළ ජීවත් වන්නෝත් එසේ කිරීමට හේතු කිහිපයක්ම තිබේ. ධනවාදී පාලකයෝ හා ඊට සම්බන්ධ විවිධ දේශපාලන සංවිධාන හා පුද්ගලයෝ දේශපාලන හේතු මත නිතර අසත්‍ය පතුරුවති. ධනවාදයට මිනිස් සමාජය සංවර්ධනය කරා ගෙනයා හැකි බවත් ජනතාවට හොඳ අනාගතයක් ලබාදිය හැකි බවත් සමාජවාදය යල්පැන ඇති බවත් කොමියුනිස්ට්වාදය භයානක බවත් එවැනි දේශපාලන අසත්‍යයන්ය.

එසේම ආගමික සංස්ථාවන්ගේ පැවැත්ම සඳහා ඊට සම්බන්ධ අය සත්‍ය වෙනුවට අසත්‍යය පතුරුවති. ඊළගට ආර්ථික වුවමනාවන් මත ආර්ථික ලාභ වෙනුවෙන් ඊට අදාල අය බොරු කියති. මිත්‍යාවන් පතුරුවති. මේ දිනවල රූපවාහිනීවල වෙළඳ දැන්වීම් පිරී ඇත්තේ, එවැනි බොරු හා මිත්‍යාවලිනි. අනෙක් අතට ගතානුගතික වීම නිසා, සම්ප්‍රදායට ගොදුරුවීම නිසා තර්කයෙන් තොරව කරන විශ්වාසයන් පරපුරෙන් පරපුරට ගෙනයාමට විවිධ අය තුළ ඇති කැමැත්ත නිසාද නොදන්නාකම නිසාද මිනිස්සු සමාජය තුළ අසත්‍යය පතුරුවති. විවිධ ප්‍රතිවිරෝධයන් හා එකිනෙකාට එරෙහි අයද එලෙස බොරු කියති.

### විශ්වාස කළ නොහැකි බොරු විශ්වාස කිරීම

මානව සමාජයේ පංති පාලනය තුළ, පාලකයින් හා ඔවුන්ගේ අනුගාමිකයන් විසින් නිතිපතා වැපුරූ අසත්‍යය මත, ඉතිහාසයක් ගතකළ ජනතාවක් එම මිත්‍යාවන්ට යටවීම ගැන පුදුම එලවන උදාහරණ අපට සොයාගත හැක. 1917 රුසියානු විප්ලවයෙන් පසු ගම්බද කාන්තාවන් විප්ලවයට හතුරු කිරීම සඳහා පරාජයට පත් ප්‍රතිගාමීන් පල්ලිය මගින් ගම්වල එක්තරා ප්‍රචාරයක් කර තිබේ. ඒ, වැඩිහිටි කාන්තාවන් බිත්තර රැක්කවීම සඳහා මොස්කව්වලට ගෙනයන බවය. පුදුමය නම් මෙම බොරුව රුසියානු කාන්තාවන් විසින් වහාම විශ්වාස කිරීමය; ඒවා පැතිරී යාමද සිදුවීමය. මෙවැනිම අත්දැකීමකට කියුබානු විප්ලවවාදීහුද මුහුණ දුන්හ. ෆිදෙල් පවසන ආකාරයට 1959 කියුබානු විප්ලවය ජයග්‍රහණය කළ වහාම එක්සත් ජනපදය කියුබාවට එරෙහිව 'ඔපරේෂන් පීටර් පෑන්' නම් මෙහෙයුමක් දියත්කර තිබේ. එයට අනුව පල්ලිය මගින් ප්‍රචාරය කළ බොරුවක් නිසා දෙමාපියන් බියට පත්ව තිබේ. ඒ නව කියුබානු ආණ්ඩුව කුඩා දරුවන් දෙමාපියන්ගෙන් පැහැර ගන්නා බවත් ඒ දරුවන් රුසියාවට යවන බවත් එහිදී ඔවුන් මරා, මස් ටින්වල අසුරා යළි කියුබාවට එවන බවත්ය. මෙම බොරුව මිනිසුන් කොතරම් විශ්වාස කළේදයත් කුඩා දරුවන් 14,000ක් එක්සත් ජනපදය වෙත හොරෙන් පිට කිරීමට කියුබානු දෙමාපියන් විසින් කටයුතු කර තිබේ. අසත්‍ය හා මිත්‍යාව සමාජයට කරන හානිය එතරම්ය. ලංකාවේ සමාජය තුළ මෙන්ම දේශපාලනය තුළද ධනපති පංතිය හා එහි දාසයන් පතුරුවන අසත්‍යයන් තේරුම් ගත යුත්තේද මේ අනුවය.

### සත්‍යය මරා දැමිය නොහැක


මානව දැනුම තුළ සත්‍යය හා අසත්‍යය අතර අරගලය ආරම්භ වූයේ, පංති සමාජයේ බිහිවීමත් සමඟය. පංති සමාජය පිළිබඳව විවරණයක යෙදුන මාක්ස් හා එංගල්ස් සිය කොමියුනිස්ට් පක්ෂයේ ප්‍රකාශනයේ පළමු වගන්තිය ලියුවේ, "මෙතෙක් පැවතුණ සමාජයන්ගේ ඉතිහාසය වූ කලී පංති සටන්වල ඉතිහාසයයි" යනුවෙනි. එය සත්‍යයකි. එපමණක් නොව පංති සමාජයට සාපේක්ෂව මෙතෙක් පැවතුණු ඉතිහාසයන් වූ කලී සත්‍යය හා අසත්‍යය අතර සටනක ඉතිහාසයද වේ. පංති සමාජය ආරම්භයේදීම එදා තිබූ දැනුමේ සීමා නිසා බොහෝ මිත්‍යා විශ්වාස සමාජය තුළ තිබුණි. සිදුවිය යුතුව තිබුණේ විද්‍යාව වර්ධනය වී සත්‍යය මතුවන විට ඊට ඉඩදී අසත්‍යය වේදිකාවෙන් බැස යාමය. එහෙත් පාලක පංතියත් එහි රැකවරණයට සිටි ආගමික සංස්ථාත් (විශේෂයෙන් බටහිර කතෝලික පල්ලිය) මිත්‍යාව මත පදනම්ව සිටි අතර සත්‍යය මතුවී මිත්‍යාවන් ප්‍රතික්ෂේප වීම පාලක පංතියේ හා ආගමික සංස්ථාවල පැවැත්මට අභියෝගයක් ලෙස ඔවුහු දුටහ. මේ නිසා පාලක පංතියේ ආශිර්වාදය හා අනුග්‍රහය ලැබූ ආගමික සංස්ථා සත්‍යය පුළුස්සා වළ දැමීමට ක්‍රියා කළහ. අසත්‍යය වෙනුවට ජනතාවට සත්‍යය කියාදීම සඳහා ජීවිතවලින් වන්දි ගෙවීමට බොහෝ දෙනාට සිදුවිය. එබැවින් සත්‍යයේ ගමන්මග පිරී ඇත්තේ බාධා, අවලාද, බොරු, බේගල්, බොරු චෝදනා හා මරා දැමීම්වල අත්දැකීම්වලිනි. එම සත්‍යය පවා තවමත් තේරුම් ගැනීමට සමාජය අසමත්වීම ඛේදවාචකයකි.

### සොක්‍රටීස්ගේ සිට

සත්‍යය වෙනුවෙන් දිවිපිදූ බොහෝ දෙනා ඉතිහාසය තුළ සිටිති. ඉන් බොහොමයක් කිසිවකුත් නොදැන ඉතිහාසය තුළ සැඟව ගිය අය වෙති.

> "විශේෂයෙන්ම මිත්‍යාවන් විශ්වාස කිරීමට ඉතිහාසයක් තුළ පුරුදු ජනතාවකට සත්‍යය පැවසීමට වඩා අසත්‍යය පැවසීම පහසුය. ජනතාව සත්‍යය විශ්වාස කරනවාට වඩා මිත්‍යාව විශ්වාස කිරීමට පෙළඹීම අසත්‍යය පතුරුවන්ගේ වාසියට හේතුවී තිබේ."

එහෙත් ඉන් සමහර අය ඉතිහාසයේ මැකිය නොහැකි සළකුණු තබා ඇත. එබැවින් කිහිප දෙනෙක් පිළිබඳ විමසා බැලීම වටී. සත්‍යය වෙනුවෙන් දිවිපිදූ පළමුවැන්නා ලෙස ඉතිහාසයේ සඳහන් වන්නේ සොක්‍රටීස්ය. ඔහු ජීවත්වූයේ ග්‍රීසියේ ඇතැන්ස්වලය. ඒ, ක්‍රි.පූ. 470 කාලයේය. සොක්‍රටීස් නිදහස් මනසින් කටයුතු කළ අයෙකු වූ අතර දයලෙක්තික තර්ක ක්‍රමයක් මගින් ඔහු සියල්ල ප්‍රශ්න කළේය. විශේෂයෙන් රෝම පාලනය හා එහි ඉගැන්වීම් ප්‍රශ්න කළේය. මේ නිසා තරුණ පිරිස 'නොමග යවන' කෙනෙක් ලෙස 'විප්ලවකාරී අදහස්' ඇත්තෙක් ලෙස නම් කොට සොක්‍රටීස්ට එරෙහිව නඩු ඇසූ පාලකයෝ ඔහුට වස පානය කර මිය යන ලෙස බලකරන ලදී. පලා යාමට හැකියාව තිබුණද ඔහු සියතින්ම වස පානය කොට 'සත්‍යය' වෙනුවෙන් දිවි දුන්නේය.



ග්‍රීසියේ බිඳ වැටීමත් සමඟ යුරෝපයේ බලවත්වූයේ රෝමයයි. රෝම අධිරාජ්‍යයේ වහල් පාලනයට එරෙහිව විවිධ අරගල පැන නැගුණ අතර රෝම වහල් පාලනයට එරෙහිව ආගමික ආකාරයෙන් ඉදිරියට ආ පුද්ගලයා වූයේ ජේසුස්ය. ජේසුස් පීඩිතයන්ගේ දහමක් නිර්මාණය කළේය. ඒ නිසාම රෝමය ජේසුස් කුරුසියේ ඇණ ගසා මරා දැම්මේය. එහෙත් එම රෝම අධිරාජ්‍යයම පසුව ජේසුස්ගේ ආගම වූ ක්‍රිස්තියානිය රෝම අධිරාජ්‍යයේ නිල ආගම බවට පත්කොට එය රෝම අධිරාජ්‍යය රකින ආගම බවට, අධිපති පංතියේ ආගම බවට පත් කළේය. ඉන්පසු වැඩවසම් සමය හෙවත් මධ්‍යතන යුගය පුරාම විද්‍යාවට එරෙහි සටන ගෙනයනු ලැබුවේ පල්ලිය විසිනි. ඊට ගොදුරු වූ අය අතර ප්‍රමුඛයෙක් වූයේ කොපර්නිකස්ය.

1474 උපන් නිකලස් කොපර්නිකස් විසින් විද්‍යාත්මක සොයාගැනීම් රැසක් සිදුකළ අතර ඉන් මූලික වූයේ එතෙක් පැවති පෘථිවි කේන්ද්‍රවාදයට අභියෝගයක් වූ සූර්ය කේන්ද්‍රවාදය හෙවත් 'පෘථිවිය සූර්යා වටා කැරකෙන්නේය' යන්න සොයා ගැනීමය. මෙය, 'පෘථිවිය වටා සූර්යා ගමන් කරන්නේය' යන මතය මත බිහිකර තිබූ බයිබලයේ ඉගැන්වීම්වලට පහරක් විය. ඉන්පසු පල්ලිය කොපර්නිකස්ට මිත්‍යා මත පතුරුවන්නෙක් ලෙස චෝදනා කොට දඩයම ඇරඹීය. එවකට තිබූ ඊනියා ධර්මාධිකරණට ඔහු ගෙන්වා බයිබලයට පටහැණි මෙම මතය අසත්‍යයක් ලෙස ප්‍රසිද්ධියේ ප්‍රකාශ කරන ලෙස ඔහුට බල කළේය. නැත්නම් ඔහු පුළුස්සා මරා දමනු ඇත. එහිදී තම ජීවිතය බේරා ගැනීමට ඊට එකඟ වූ කොපර්නිකස් ධර්මාධිකරණ අධිකරණයේදී මෙලෙස ප්‍රකාශ කළේය. "සූර්යා වටා පෘථිවිය ගමන් කරන බව මම දැන් පිළිනොගන්නෙමි. එහෙත්, මම පිළිගත්තත් නැතත් පෘථිවිය ගමන් කරන්නේ සූර්යා වටා නම් එය ගමන් කරන්නේ සූර්යා වටා පමණි." අද අප කවුරුත් පිළිගන්නා මෙම සත්‍යය වෙනුවෙන් එය මුලින්ම ඉදිරිපත් කළවූවන්ට අත්වූ ඉරණම ඉහත සිදුවීමෙන් පෙනේ.

### පුළුස්සා මැරීමට බැරිවූ සත්‍යය

සත්‍ය පැවසීමේ වරදට දඬුවම් නොලබා බේරීමට උපක්‍රමිකව කොපර්නිකස් සමත්වුවද කොපර්නිකස්ගේ මතය පිළිගෙන එය තව දුරටත් වර්ධනය කළ බෲනෝට ජීවිතය බේරා ගැනීමට හැකිවූයේ නැත.

ක්‍රි.ව. 1548 උපත ලද බෲනෝ විශ්වය පිළිබඳ, විද්‍යාව පිළිබඳ, නව මත රැසක් පළ කළ අතර පෘථිවිය සූර්යා වටා ගමන් කරන්නේ යයි පැවසූ කොපර්නිකස්ගේ මතය පිළිගත එය වඩාත් සංවර්ධනය කළේය. එහි ප්‍රතිඵලය ලෙස ධර්මාධිකරණය විසින් අත්අඩංගුවට ගනු ලැබුණු බෲනෝ පල්ලියේ ශුද්ධ වූ ලියවිලිවලට විරුද්ධ වීමේ චෝදනාවට මත නඩු විභාග කොට ක්‍රි.ව. 1600 ජනවාරි 17දා පුළුස්සා මරා දැමිණි. ඒ, ඔහු ලියූ පොත්පත් රැසක්ද සමඟය. සත්‍යය පැවසූ බෲනෝ පුළුස්සා මරා දැමුවද සත්‍යය මරා දැමිය නොහැකි වූ අතර පසු කලෙක දුරේක්ෂය හා විද්‍යාත්මක උපකරණ විසින් එම සත්‍යය වඩාත් තහවුරු විය. අවසානයේදී 20 වන සියවසේදී බෲනෝගේ මරණය සම්බන්ධයෙන් ලෝකයාගෙන් සමාව අයැදීමට පල්ලියට සිදුවිය.

සත්‍යය හා අසත්‍යය අතර ගැටුමේදී මීළඟට දඩයමට ලක් වූයේ ගැලීලියෝ ගැලීලිය. 1564 ඉතාලියේ උපන් ගැලීලියෝ ප්‍රකට විද්‍යාඥයෙක් විය. ඔහු විද්‍යාත්මක සොයාගැනීම් රැසක් කළ අතර දුරේක්ෂය සොයා ගැනීම ඉන් ප්‍රධාන විය. පෘථිවිය චලනය වන බවත් එය පැතලි ස්ථාවර වස්තුවක් නොවන බවත් ඔහුද පැවසූ අතර එය තහවුරු කිරීමට කරුණුද ඉදිරිපත් කළේය. පෘථිවිය සූර්යා වටා ගමන් කරන බව ඔහුද සනාථ කළේය. සුපුරුදු ලෙස පල්ලියේ මර්දනකාරී ධර්මාධිකරණය ගැලීලියෝ අත්අඩංගුවට ගත්තේය. මිත්‍යා දෘෂ්ටිකයෙකු හා ධර්ම විරෝධියෙකු ලෙස නම්කර නඩු විභාගයක් පවත්වා මරණ දඬුවම් නොලැබීමට නම් තම මතය ප්‍රසිද්ධියේ ඉල්ලා අස්කර ගැනීමට ඔහුට බල කෙරිණි. ඔහුගෙන් බලෙන් පාපෝච්චාරණයක් ගන්නා ලදී. ඒ අනුව පල්ලිය ලබාදුන් ලියවිල්ල අධිකරණය හමුවේ හැඟීම් විරහිතව කියවා අවසන් කළ ඔහු නැඟී සිටිමින් හිමින් යමක් මිමිණුවේය. ඒ, "මොනව කිව්වත් එය චලනය වෙනවා" යනුවෙනි. ගැලීලියෝට පල්ලිය ජීවිතාන්තය දක්වා දඬුවම් නියම කොට පසුව

15වැනි පිටුවට



"මාධ්‍ය මගින් කරන්නේ බොරු කියන එක පමණක් නොවේ. සාවද්‍ය පරාවර්තනයන් ඇති කිරීමයි. බොරුව හා සාවද්‍ය පරාවර්තනයන් යනු වර්ග දෙකක්. බොරුව දැනුම මත සෘණාත්මක බලපෑමක් ඇති කරනවා. සාවද්‍ය පරාවර්තනයන් චින්තනය මත සෘණාත්මක බලපෑමක් ඇති කරනවා. එය තොරතුරු වසන්කිරීමට හෝ විකෘති කිරීමට සමාන නැහැ. එමගින් සිදුවන්නේ සිතීමට ඇති හැකියාව මොට කිරීමයි."

**ෆිදෙල් කස්ත්‍රෝ**
**'මගේ ජීවිතය' පොතින්**

# ජ.වි.පෙ.ට එරෙහි අවලාද ඇයි?

ජ.වි.පෙ.ට එරෙහිව සතුරන් විසින් අවලාද ව්‍යාපාරයක් දියත්කිරීමත් සමග ඒ සම්බන්ධව ජනතාවට කරුණු පැහැදිලි කිරීම සඳහා පසුගිය 16වැනිදා කොළඹ නව නගර ශාලාවේදී ප්‍රසිද්ධ සම්මන්ත්‍රණයක් පැවැත්වීමට ජ.වි.පෙ. කටයුතු කළේය. එහිදී පළවූ අදහස්වල සංක්ෂිප්ත ලිඛිත සටහනක් කාලීන වැදගත්කම සලකා මෙසේ පළකරමු.

## ජ.වි.පෙ. නායක අනුර දිසානායක සහෝදරයා



පසුගිය දින කිහිපය තුළ ජ.වි.පෙ. ඉලක්ක කරගත් දැවැන්ත ප්‍රහාරයක් එල්ල වුණා. මේ ප්‍රහාරය පිළිබඳව යම් දේශපාලනික අදහස් දැක්වීමක් සාකච්ඡාවක් කරන්න ඕනෑ කියලා අපි කල්පනා කළා. අපි විවේචනවලට කැමති පක්ෂයක්. විවේචනවලින් ගතයුතු සාධනීය දේවල් උකහා ගන්න අපි පසුබට වෙන්නේ නැහැ. අපේ පක්ෂය තුළ ස්වයං විවේචනාත්මක ඇගයීම් තිබෙනවා. ඒ වගේම ප්‍රහාරයන් පිටුපස තිබෙන දේශපාලනය තේරුම් ගන්න සමත් පක්ෂයක්.

මේ මොහොතේ දේශපාලනය කතාබහ වුණු කණ්ඩායම් කිහිපයක් තිබෙනවා. පරාජයට පත්වුණු රාජපක්ෂ කණ්ඩායම, රනිල් කණ්ඩායම, මෛත්‍රී කණ්ඩායම සහ ජනතා විමුක්ති පෙරමුණ ඒ අතර ඉන්නවා. පරාජයට පත්වුණු කණ්ඩායමේ වේදනාව, කෝපය, වෛරය සමාජයට මුදා හරිමින්

> "පරාජයට පත්වූ කණ්ඩායමේත් බලයට ආපු කණ්ඩායමේත් වරප්‍රසාද අහිමි වුණු කණ්ඩායමේත් පොදු සතුරා බවට අද පත්වෙලා තිබෙන්නේ ජනතා විමුක්ති පෙරමුණයි. ඔවුන්ගේ පොදු සතුරා බවට පත්වීම ගැන අපි සතුටු වෙනවා. "

තිබෙනවා. මහින්ද රාජපක්ෂ අද විදෙස් සංචාර යන්නේ කොහොමද? විදේශ කටයුතු අමාත්‍යාංශයෙන් හිඟමන් යැදලා. ඔහුට වේදනාවක් කෝපයක් දැනෙන්නේ නැද්ද? තමන්ට එරෙහි කණ්ඩායම් විනාශ කළ හැකි යැයි හිතපු, තමන්ට එරෙහිව ලියන මාධ්‍ය විනාශ කර දැමිය හැකි යැයි හිතාගෙන හිටපු ගෝඨාභය රාජපක්ෂ අද දිනපතා ජනාධිපති විමර්ශන ඒකකයට යනකොට වේදනාවක්, කෝපයක්, වෛරයක් ඇතිවෙන්නේ නැද්ද? නිවාස අමාත්‍යාංශයෙන් මුළු පක්ෂයේ සාමාජිකයින්ටම පඩි ලබාගෙන, ඒක නැතිවෙනකොට වේදනාවක් දැනෙන්නේ නැද්ද? විමල් වීරවංශගේ සහෝදරයා වන සරත් වීරවංශ තමන්ගේ බිරිඳගේ වාහනය තමන්ම කුලියට අරගෙන එම වාහනයට එක්ලක්ෂ තිස් දාහක කුලියක් ජනාධිපති ලේකම් කාර්යාලයෙන් ලබාගත්තා. වීරවංශගේ මාධ්‍ය ලේකම් කුලියට ගත්ත වාහනයට ජනාධිපති ලේකම් කාර්යාලය සහ ඉංජිනේරු සංස්ථාව යන ආයතන දෙකෙන්ම වාහනයට කුලී මුදල් දෙකක් ගත්තා. නුවර සංවිධායකයා තමන්ගේ වාහනය නෝනගේ නමට ලියලා ඒ වාහනේ කුලියට අරගෙන වාහනයත් අරගෙන සල්ලිත් අරගෙන යනවා. මේ සියල්ල අද අහිමි වෙලා. ඒ වෛරය, කෝපය පිට කරමින් ඉන්නවා. ඔවුන් කෝපය පිට කළ යුත්තේ ආණ්ඩුවටයි. නමුත් අද? ගමන් බලපත්‍ර දෙකක් තියෙන වීරවංශ එළියේ ඉන්නවා. ඔහුට ආණ්ඩුව සමඟ ප්‍රශ්නයක් නැහැ. ශිරන්ති රාජපක්ෂට නඩු පවරන්න ඕන නැහැ කියලා කැබිනට් එක එකඟ වෙනවා. මහින්ද රාජපක්ෂ උගන්ඩාවේ යන්න විදේශ ඇමතිට කතා කරලා ටිකට් එක ගන්නවා. ඔවුන් ආණ්ඩුවත් එක්ක තරහා වෙන්න ඕනෑද?

අනෙක් පැත්තෙන් මේ ආණ්ඩුවේ කෝපය එල්ල වෙන්නේ කාටද? මහින්ද රාජපක්ෂ කණ්ඩායමට මේ ආණ්ඩුවට ප්‍රබල විවේචනයක් ගොඩනගන්න බැහැ. මේ ආණ්ඩුවට ප්‍රබල විවේචනයක් එල්ල කරන්න පුළුවන් ජනතා විමුක්ති පෙරමුණට පමණයි. අපි පාර්ලිමේන්තුවේදී හෙළි කළා, රනිල් වික්‍රමසිංහ ප්‍රභූ රථ දෙකක් සඳහා රුපියල් මිලියන 594ක් වෙන්කර ගත්තා කියලා. සාගල රත්නායක ඒ වෙන්කර ගත්ත මුදල ප්‍රතික්ෂේප කරන්නේ නැහැ. ඒ වුණාට ඔහු කියනවා එම රථ දෙක සඳහා වැය වන්නේ රු.ලක්ෂ 1300ක් පමණයි ඉතිරි ප්‍රමාණය බද්ද කියලා. ඔහු කියන්නේ ජර්මනියේ වටිනාකම. අපි කියන්නේ ලංකාවේ වටිනාකම. ඒවා හෙළිදරව් කරන විට රනිල්ට රිදෙනවා. අපි මහ බැංකු අධිපතිවරයාගේ වංචාවලට විවේචන එල්ල කරනවා. වරායට නියමිත ගාස්තු ගෙවන්නේ නැතිව ඇමතිවරයෙක් ආණ්ඩුවට ලක්ෂ 4600ක් අහිමි කරනකොට ඒකට අපි විවේචන කරනවා. අධ්‍යාපන අමාත්‍යාංශයේ අයථා විදියට සුළු සේවකයින් බඳවා ගන්න කොට ඒවා හෙළිදරව් කරනවා. පෙට්‍රෝලියම් ආයතනයට අයථා පත්වීම් දෙනකොට ඒ ගැන විවේචනය කරනවා. එවිට පවතින ආණ්ඩුවට රිදෙනවා. ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිවරයා මහාමාර්ග අමාත්‍යාංශයට මාසයකට රු.65,000 ගණනේ වැටුප් දීලා උපදේශකයෝ 56ක් පත්කර ගන්නවා. රු.25,000 ගණනේ වැටුප් ගෙවලා සම්බන්ධීකරණ ලේකම්වරු 96ක් පත්කර ගන්නවා. මේ විදියට කෝටි ප්‍රකෝටි ගණන් නාස්ති කරනකොට ඊට එරෙහිව අපි ප්‍රබල විවේචනයක් ගොඩනගනවා.

ඒ වගේම පහුගිය ආණ්ඩුවෙන් වරප්‍රසාද ලබාගත්ත ව්‍යාපාරික කණ්ඩායම් මාධ්‍ය ආයතන හිමිකරුවන් මාධ්‍යවේදීන් හිටියා. නිවාස අමාත්‍යාංශයෙන් පඩි ගත්ත මාධ්‍යවේදීන් හිටියා. ඔවුන් පත්තරෙනුත් වැටුප් ගත්තා. ආණ්ඩුවේ ආයතනවලිනුත් වැටුප් ගත්තා. මාධ්‍ය ආයතන හිමිකරුවන් රටේ ප්‍රබල සමාගම්වල සභාපති තනතුරුවල හිටියා. ජාතික යැයි කියාගන්නා පුවත්පතක කර්තෘවරයෙක් රාජපක්ෂගේ ජනාධිපති උපදේශක තනතුරක හිටියා. එම පුවත්පතේම මාධ්‍යවේදියෙක් වරායෙන් වැටුප් ගත්තා. ඔවුන්ට ඒවා අහිමි වනවිට ඒ කෝපය 15වැනි පිටුවට

## දේශපාලන මණ්ඩල සභික ලාල්කාන්ත සහෝදරයා



මේ සමාජ ක්‍රමය වෙනස් කර නවීන සමාජයක් වෙනුවෙන් දේශපාලනය කරන එකම දේශපාලන පක්ෂය ජනතා විමුක්ති පෙරමුණ නිසා අවලාද නගනවා. අපේ පංතිය ඒක අවබෝධ කරගත යුතුයි. අපේ පක්ෂයේ සාමාජිකයෝ අවලාදවලින් කලබල නොවුණාට අපේ පංතියේ අය කලබල වෙනවා. ඒ නිසා සාකච්ඡාවක් ඕනෑ.

මීට අවුරුදු එක හමාරකට දෙකකට පස්සට ගියොත් මහින්ද රාජපක්ෂ ආණ්ඩුවට එරෙහිව වැඩ කරපු පුද්ගලයින් තුන්දෙනෙක් හිටියා. ඒ, අනුර දිසානායක, නිල විපක්ෂ නායක වූ රනිල් වික්‍රමසිංහ සහ මෛත්‍රීපාල සිරිසේන. ඒ වෙලාවේ මේ රටේ ජනතාව විපක්ෂ නායකයා විදියට පිළිගත්තේ, අපේ පක්ෂයේ නායක අනුර දිසානායක සහෝදරයායි. ඒක බලෙන් අත්පත් කරගත්ත එකක් නෙවෙයි. පක්ෂයේත් අනුර සහෝදරයාගේ නායකත්වයෙනුත් අප ගෙන ගිය භාවිතයෙන් තමයි ඒක අත්පත් කරගත්තේ. සමාජයේ විපක්ෂ නායකයා ලෙස පිළිගත් අපේ පක්ෂයේ නායකයාට තමයි මේ අවලාද ව්‍යාපාරය එල්ල වෙලා තිබෙන්නේ.

> "මේ සමාජ ක්‍රමය වෙනස් කර නවීන සමාජයක් වෙනුවෙන් දේශපාලනය කරන එකම දේශපාලන පක්ෂය ජනතා විමුක්ති පෙරමුණ නිසා අවලාද නගනවා. අපේ පංතිය ඒක අවබෝධ කරගත යුතුයි. අපේ පක්ෂයේ සාමාජිකයෝ අවලාදවලින් කලබල නොවුණාට අපේ පංතියේ අය කලබල වෙනවා. ඒ නිසා සාකච්ඡාවක් ඕනෑ."

ඔබ දන්නවා, අප ජීවත් වෙන සමාජ ආර්ථික ක්‍රමයේ පංති දෙකක් තිබෙනවා. එක් ස්ථරයක් ලාභ ලබනවා, භුක්ති විඳිනවා. භුක්ති විඳින පිරිස එය පවත්වාගෙන යාම සඳහා ධනපති පක්ෂ, විවිධ සංවිධාන, මාධ්‍යවේදීන් කුලියට ගත් පුද්ගලයින් යොදා ගන්නවා. මේ ධනපති සමාජ ක්‍රමයේ මේ වෙනකොට කෙළවරටම ඇවිත් ඉන්නවා. ජනතා විමුක්ති පෙරමුණ මේ සමාජ ක්‍රමය පවත්වාගෙන යන්න උදව් කරන පක්ෂයක් නෙවෙයි. ජ.වි.පෙ. බිහිකරලම තිබෙන්නේ, මේ ධනපති සමාජ ක්‍රමය පෙරළා දාලා අලුත් සමාජ ක්‍රමයක් ගොඩනැගීම වෙනුවෙන්. ඒ නිසා මේ ධනපති සමාජ ක්‍රමය තිබිය යුතුයි කියන සියල්ල අපේ දේශපාලනික සතුරෝ බවට පත්වෙලා. මේ සමාජ ක්‍රමය වෙනස් කර නවීන සමාජයක් වෙනුවෙන් දේශපාලනය කරන එකම දේශපාලන පක්ෂය ජනතා විමුක්ති පෙරමුණ නිසා අවලාද නගනවා. අපේ පංතිය ඒක අවබෝධ කරගත යුතුයි. අපේ පක්ෂයේ සාමාජිකයෝ අවලාදවලින් කලබල නොවුණාට අපේ පංතියේ අය කලබල වෙනවා. ඒ නිසා සාකච්ඡාවක් ඕනෑ.

සමාජ පරිවර්තනයක් කරන්න යන පක්ෂවලට හොඳ අත්දැකීමක්, න්‍යායක්, නායකයින්ට කැපකිරීමේ හැකියාවක් තිබෙන්න ඕනෑ කියලා ලෙනින් සහෝදරයා කියා තිබෙනවා. ජනතා විමුක්ති පෙරමුණේ අපට 1965 ඉඳලා අත්දැකීම් තිබෙනවා. දියුණු න්‍යායක් තිබෙනවා. අපි එය භාවිතා කරනවා. 71දීත් 88-89දීත් ඉන් පසුවත් කැප කරන්න පුළුවන් කියලා ඔප්පු කර තිබෙනවා. ඒ වගේම වමේ ව්‍යාපාරයක් සාමජය තුළ වැඩි බහුතරයක් තුළ විශ්වාසය දිනාගන්න ඕනෑ. දැන් මේ අවලාද අදාල වෙන්නේ ඒ කොටසටයි. සමාජය තුළ විශ්වාසය දිනාගත් එකම පක්ෂය ජනතා විමුක්ති පෙරමුණයි. අපිට ඉන්නේ මන්ත්‍රීවරුන් හය දෙනෙක් වුණාට, සමාජයේ බහුතරයකගේ විශ්වාසය දිනා ගන්න අපිට පුළුවන් වෙලා තිබෙනවා. ඒ නිසා සමාජය තුළ තහවුරු කරගත් විශ්වාසය නැති කරන්න අපිට අවලාද ගහනවා.

මේ තරම් බදු බර, දඩ බර, ජනතාව මත පටවපු ආණ්ඩුවක් මීට කලින් තිබිලා නැහැ. මේ තරම් 15වැනි පිටුවට

## ජ.වි.පෙ. ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා



ජනතා විමුක්ති පෙරමුණේ ඉතිහාසය දුක් කම්කටොළු පහරදීම් මැද ආපු ගමනක් තිබෙන්නේ. මේ අවලාද අපිට අලුත් නෙවෙයි. මේ අවස්ථාව වනවිට අවලාදවල ගුණාත්මක පරිවර්තනයක් සිදුවෙලා තියෙනවා. කැලෑ පත්තරවල, සමාජ ජාල වෙබ් අඩවිවල පසුගිය කාලය පුරා අවලාද ප්‍රචාරය කළා. අනතුරුව ජාතික යැයි කියාගන්නා පුවත්පතක මුල් පිටුවේ සහ ඇතුල් පිටුවක විශාල මඩ, අවලාද ප්‍රමාණයක් ප්‍රචාරය කළා. එය ගුණාත්මක පියවරක් විදියටයි අපි දකින්නේ. ඒ නිසා මේ සම්බන්ධයෙන් ගැඹුරු දේශපාලන සංවාදයක් ඕනෑ. ඒ සම්බන්ධයෙන් ජනතාවටත් උනන්දුවක් තිබෙනවා. එම සංවාදය පක්ෂයටත් රටේ ජනතාවටත් මාධ්‍යවලටත් හොඳයි. අපි පැහැදිලිව කියන්න ඕනෑ, අපිට මාධ්‍යයත් සමඟ සටනක් නැහැ කියලා. අප විසින් කළේ ප්‍රතිචාර දැක්වීමක් පමණයි. අපි කිසිදු ප්‍රතිචාරයක් නොදැක්වූවා නම් එහෙම නොකළේ ඇත්තටම පක්ෂයේ අර්බුදයක් තියෙනවද කියලත් අහනවා.

සතුරන්ට අපිත් එක්ක දේශපාලන සටනක් කරන්න බැහැ. ප්‍රතිපත්තිවලින්, කරුණුවලින්, අදහස්වලින් අපිත් එක්ක සටන් කරන්න බැහැ. ඒ නිසා ඔවුන් අවලාද අතට ගන්නවා. අවලාද අතට ගැනීමෙන් පෙන්වන්නේ සතුරාගේ දුබලකමයි. එයින් පෙන්වන්නෙ අපිට අවලාද ගහපු පුවත්පතේ කතුවරයාගේ මාධ්‍යවේදියාගේ ඒ පිටුපස සිටින අයගේත් දුබලකමයි. රෝහණ විජේවීර සහෝදරයා අවලාද සම්බන්ධයෙන් අපිට පාඩම් කියාදී තියෙනවා. හිරගෙදර හිටපු අපේ සහෝදරවරුන්ට කරුණු ගණනාවක් ලිඛිතව ලබා දුන්නා. අවලාද, නින්දා කරන අය පෙන්වන්නේ, ඔවුන්ට ශක්තියක් නැති බවයි. ඔවුන් දුබලයින් කියන එකයි. බේගල් යනු දුබලතාවයයි. දේශපාලන බංකොළාත්භාවයයි. දේශපාලන පරාජයයි.

අපි අද දේශපාලන සන්ධිස්ථානයක ඉන්න නිසා සතුරා අපේ නායකයින් තෝරාගෙන පහර දෙන්න පටන් අරගෙන. ඉතිහාසය දෙස බැලුවොත් අදටත් සිදුවන්නේ පරණ දේවල්මයි. නම් ගම් විතරයි වෙනස්. වමට එරෙහිව මඩ ගැසීම තමයි සුපුරුදු දේ. අවලාදවලින් සමාජය ජ.වි.පෙ.ට ඇති විශ්වාසය බිඳින්න උත්සාහ කරනවා. මොකද, පොදු ජනතාව ඇත්ත නැත්ත හොඳින් තෝරා බේරා ගන්නේ නැහැ. පත්තරේ තියෙන්නේ ඇත්ත කියලා ඔවුන් විශ්වාස කරනවා. ඒ නිසා අපේ සතුරන් මඩේ බැහැලා ගොඩ ඉන්න අපිට මඩ ගහලා සතුටක් ලබනවා. ඒක අද ඊයේ පටන්ගත්ත එකක් නෙවෙයි. මාක්ස්වාදය ආරම්භය සිටම සිදුවුණා. මාක්ස්වාදයේ ආරම්භකයා වූ කාල් මාක්ස් සහෝදරයා 1883 මියගියා. මාර්තු 17වැනිදා අවසන් කටයුතුවලට පැමිණි මාක්ස්ගේ ළඟම මිතුරා වූ එංගල්ස් කෙටි කතාවක් කළා.

> "අපිට අවලාද නගන්නේ පුද්ගලික තරහකට නෙවෙයි. ජනතාවගේ සහාය ලබාගෙන ජ.වි.පෙ. පෙරට ආවොත් ධනවාදයෙන් සැප විඳින මහත්වරුන්ට ඒ සැප අහිමි වෙනවා. ඒක පංති ප්‍රශ්නයක්. ඒ සැප නැතිවුණාම ඔවුන් කෝපයට පත්වෙනවා."

ඔහු කිව්වා, එම යුගයේ මාක්ස් තරම් වෛරයට, ද්වේශයට ලක්වූ කෙනෙක් සිටියේ නැති තරම් කියලා. මාක්ස් එම අවලාදවලට අවශ්‍ය විටෙක පිළිතුරු දුන්නා. නැතිනම් ඒවා මකුළු දැල් ලෙස පිස දැම්මා. ජනතා විමුක්ති පෙරමුණත් එහෙමයි. අපි අද පිළිතුරු දිය යුතු තැනකට ඇවිත් තිබෙනවා. රුසියාව ගොඩනැගූ මහා දැවැන්තයෙක් වූ ලෙනින්ටත් අවලාද ගැහුවා. ඔහුට ජර්මන් ඔත්තුකාරයෙක් කිව්වා. අද අපේ පක්ෂයේ නායක අනුර දිසානායක සහෝදරයා එයාර් පෝට් එකෙන් විදෙස් ගමන් යනකොට වීඩියෝ කරලා රහස් ගමන් යනවා කියලා ප්‍රචාරය කරනවා. අපිට රහස් ගමන් යන්න ඕනනම් පාස්පෝට් එකට වීසා ගහලා එයාර් පෝට් එකෙන් යන්න ඕනද?

ආසියානු කලාපයේ මලයානු කොමියුනිස්ට් පක්ෂය තමයි අවලාද නැගීම පිළිබඳව හොඳම උදාහරණය සපයන්නේ. මලයානු කොමියුනිස්ට් පක්ෂය අවලාද නිසා ගොඩගන්න බැරි තැනකට බිඳ වැටුණා. මේ අවලාද නගන්න ධනපති පංතිය පාවිච්චි කරන්නේ, වමේ ව්‍යාපාරයෙන්ම පළා ගිය හෝ එළවා දැමූ අයයි. වමේ ව්‍යාපාරයේ විනය කැඩුවාම ප්‍රතිපත්ති පිළි නොගත්තාම ඔවුන්ට යන්න වෙනවා. ඒ පුද්ගලයින් තමයි අද වමට අවලාද ගහන්න පාවිච්චි කරන්නේ. ජනතාව අසත්‍යයක් පැතිරුවාම කලබල වෙනවා. විශ්වාස කරනවා. පස්සේ තමයි අසත්‍යයක් කියලා තේරුම් ගන්නේ.

කියුබානු නායක ෆිදෙල් කැස්ත්‍රෝ ඉතාමත් ආදර්ශවත් නායකයෙක්. ඔහු කියුබාව ගොඩනැගුවා. ෆිදෙල්ගේ 'මයි ලයිෆ්' පොතේ එක් තැනක ඔහු කියනවා, 15වැනි පිටුවට

ජනතා විමුක්ති පෙරමුණේ මහජන නියෝජිතයින් විසින් පළ කළ අදහස් වෙනුවෙන් නියමුවා වේදිකාව වෙන්වෙයි.

2016 මැයි 05

# වැට් බදු වැඩි කළේ අයි.එම්.එෆ්. ළඟට යන්න සහතික සම්පූර්ණ කර ගන්නයි

## පාර්ලිමේන්තු මන්ත්‍රී අනුර දිසානායක සහෝදරයා



වංචා, දූෂණ, නාස්තිය පිළිබඳව එදා තමුන්නාන්සේලා මැතිවරණ වේදිකාවේදී කරන ලද ප්‍රකාශයන් මුළුමනින්ම විහිළුවක් බවට පත් වෙලා තිබෙනවා. තමුන්නාන්සේලා වංචනිකයන් ආරක්ෂා කරනවා. ආරක්ෂා කරනවා විතරක් නොවෙයි. තමුන්නාන්සේලා වංචාවේ යෙදෙනවා. තමුන්නාන්සේලා වංචාවේ, දූෂණයේ යෙදෙන එක ගැන මා අද එකින් එක කියන්නම්.

ඉස්සරවෙලාම "නාස්තිය" ගැන කියන්නම්. මේ තිබෙන්නේ පරිපූරක ඇස්තමේන්තුව. ඔය පැත්තේ මහත්වරු ටික, මන්ත්‍රීවරු ටික දැන් ඒකට අත ඔසවන්නද බලාගෙන ඉන්නේ? මේ පරිපූරක ඇස්තමේන්තුවේ 67වැනි මුදල් ඉල්ලීම ගැන මා දැන ගන්නට කැමැතියි. කොච්චර මුදලක්ද ඉල්ලලා තිබෙන්නේ? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රුපියල් ලක්ෂ 5,943ක් ඉල්ලලා තිබෙනවා. මොකටද? මොකක් වෙනුවෙන්ද? මා දන්නා විදියට, අග්‍රාමාත්‍යවරයාට වාහන ගන්න. එහෙම නොවෙයි නම්, එය නිවැරැදි කරන්න. මා දන්නා විධියට ගන්නේ වාහන දෙකයි. වාහන දෙකට ආසන්න වශයෙන් රුපියල් ලක්ෂ 6,000යි. ඒ කියන්නේ එක වාහනයක් කීයද? එක වාහනයක් රුපියල් ලක්ෂ 3,000යි. රුපියල් ලක්ෂ 3,000ට මොනවාද ගන්නා වාහන කියා අපි දැන ගන්න කැමැතියි. රුපියල් ලක්ෂ 6,000ක් අග්‍රාමාත්‍යවරයා වෙනුවෙන් වාහන ගන්න වෙන් කරනවා. මේ පාර්ලිමේන්තුව මෙය අනුමත කරන්න ඕනෑද කියා කල්පනා කරලා බලන්න. දැනට රුපියල් ලක්ෂ 6,000කට, දන්නා විධියට වාහන දෙකයි ඉල්ලන්නේ.

ජනතාවට බදු ගහලා, විශාල විනාශයකට පත් කරලා. ගොවියාගේ වී ටික විකුණා ගන්න විධියක් නැහැ. තේ දළු හිමියා අසීරුතාවට පත් වෙලා. රබර් කිරි කපන්නා අසීරුතාවට පත් වෙලා. තමුන්නාන්සේලා අනුමත කරනවාද අග්‍රාමාත්‍යවරයා වෙනුවෙන් වාහන ගන්න රුපියල් ලක්ෂ 6,000ක් මේ පාර්ලිමේන්තුවෙන් වෙන් කරන්න? මේක අනුමත කරන්න ඕනෑද? ඒ විතරක් නෙවෙයි, තමුන්නාන්සේලා නාස්තියට විරුද්ධව කථා කරපු මහත්වරු.

ඊළඟට, විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් ගරු අමාත්‍යතුමාගේ නිල නිවාසය ප්‍රතිසංස්කරණය කරන්න, ගරු ඇමතිතුමාගේ නිල නිවාසය හදන්න, ඉල්ලන්නේ කීයක්ද? එයාගේ නිල නිවාසය හදන්න රුපියල් හතළිස්දෙලක්ෂ හැටදහසක් ඉල්ලනවා. විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍ය ගරු හරින් ප්‍රනාන්දුගේ නිල නිවාසය ප්‍රතිසංස්කරණය කරන්න. මීට අවුරුද්දකට කලින් ඇමතිවරු හිටපු ගෙවල් ඕවා. ඒ ඇමතිවරුත් ඔය වාගේ කාපට් මාරු කළා. ඒ ඇමතිවරුත් ඔය වාගේ තිර රෙදි මාරු කළා. ඒ ඇමතිවරුත් ඔය වාගේ හුණු පිරියම් කළා. තව ඇමතිවරයෙක් එන කොට කාපට් මාරු කරන්න, තව ඇමතිවරයෙක් එන කොට හුණු පිරියම් කරන්න, තව ඇමතිවරයෙක් එන කොට පොලිෂ් කරන්න, මොකක්ද මේ සිද්ධ වෙලා තිබෙන්නේ? මහජනයාගේ ධනය නේ. විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් ගරු ඇමතිවරයා රුපියල් හතළිස්දෙලක්ෂ හැටදහසක් වැය කරනවා, තමන්ගේ නිල නිවාසය අලුත්වැඩියා කරන්න. මේ රටේ ජනතාව මේවා අනුමත කරන්න ඕනැද? මේ පාර්ලාමේන්තුව මේක අනුමත කරන්න ඕනෑද?

ඒ විතරක් නොවෙයි. රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන ඇමතිවරයා තමන්ගේ අමාත්‍යාංශයේ අලුත්වැඩියාව වෙනුවෙන්, ප්‍රතිසංස්කරණ වෙනුවෙන් මුදල් ඉල්ලනවා. මතක තබා ගන්න. අමාත්‍යාංශයක් හදන්න නොවෙයි. අලුතින් ගොඩනැගිලි හදන්න නොවෙයි. රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යවරයා - කබීර් හාෂිම් අමාත්‍යවරයා- තමන්ගේ අමාත්‍යාංශයේ ප්‍රතිසංස්කරණය වෙනුවෙන් ඉල්ලනවා රුපියල් ලක්ෂ 600ක්. තමුන්නාන්සේලා අනුමත කරනවාද ඒක? තමන්ගේ තිබෙන අමාත්‍යාංශය ප්‍රතිසංස්කරණය කරන්න මේ පාර්ලිමේන්තුව රුපියල් ලක්ෂ 600ක් දෙන්න ඕනැද? රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයක් තිබුණා. උපකරණ තිබුණා. හැබැයි, දැන් අලුත් ඇමතිවරයෙක් එන කොට, අමාත්‍යාංශය අලුත්වැඩියා කරන්න, අමාත්‍යාංශය ප්‍රතිසංස්කරණය කරන්න රුපියල් ලක්ෂ 600ක් මේ පාර්ලිමේන්තුවෙන් ඉල්ලනවා. මේවා දීලායි තිබෙන්නේ. දීලා අපෙන් ඉල්ලනවා අනුමැතිය. මේකට නේ ඇවිල්ලා තිබෙන්නේ. දැන් තමුන්නාන්සේලා අනුමත කරනවාද මේක? මේකද තමුන්නාන්සේලා කියපු කථාව?

අනික් පැත්තෙන් බැලුවොත්, මේ අය වාහනවලට සල්ලි වෙන් කර ගන්නවා. ගෙවල් හදන්න සල්ලි වෙන් කර ගන්නවා. ආරක්ෂාව වෙනුවෙන් සල්ලි වෙන් කර ගන්නවා. කාර්යාල හදන්න සල්ලි වෙන් කර ගන්නවා. මේ අය මේ ඔක්කොම කරන අතරේ සාමාන්‍ය ජනතාවට මොකක්ද කියන්නේ?

> "මේ සහතිකයත් අරගෙන තමයි වොෂිංටන් නුවරට ගියේ. "මෙන්න, අපි ආදායම වැඩි කරන්න සැලසුම් හදලා තිබෙනවා. මෙන්න වැට් බද්ද වැඩි කරලා තිබෙනවා. මෙන්න අපේ සහතිකය" කියා පෙන්නුවා. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ළඟට යන්න අවශ්‍ය වන සහතික සම්පූර්ණ කර ගැනීම වෙනුවෙන් තමයි තමුන්නාන්සේලා මේ බද්ද වැඩි කළේ."

අපි මේ පාර්ලිමේන්තුවේදී ඒ ගැන අහන කොට නවීන් දිසානායක අමාත්‍යවරයා කියනවා, "සහනාධාර ලබාදීම ආණ්ඩුවේ ප්‍රතිපත්තිය නොවෙයි" කියලා. තේ වගා කරලා, ඒ දල්ල කඩලා, ඒකෙන් තේ නිෂ්පාදනය කරලා, ලංකාවට විදෙස් ආදායම ගෙනෙන ගොවියාට සහනාධාරයක් දෙන්න මැළි වෙනවා. රබර් වගාව කරලා, ඒ රබර් වගාව ආරක්ෂා කරලා, ඒක ඉතා පරිස්සමින් කපලා, ඒ ලැබෙන කිරි ටික ආරක්ෂා කරලා, ඒ කිරි ටිකෙන් අපට විදෙස් ආදායමක් ගෙන දෙන ගොවියාට සහනාධාර දෙන්නේ නැහැ. ඒ වෙනුවට මොකක්ද කරන්නේ? ඒ වෙනුවට අග්‍රාමාත්‍යතුමා තමන්ගේ ආරක්ෂක වුවමනාව වෙනුවෙන් රුපියල් ලක්ෂ 6,000කට වාහන දෙකක් ගන්නවා. ඒ වෙනුවට කබීර් හාෂිම් අමාත්‍යවරයා තමන්ගේ කාර්යාලය අලුත් වැඩියා කරන්න රුපියල් ලක්ෂ 600ක් වියදම් කරනවා. සාමාන්‍ය ගොවි ජනතාවට, තේ දළු හිමියාට, රබර් කර්මාන්තකරුවාට සහනයක් දෙන්න මැළි වන ආණ්ඩුව කෝටි, ප්‍රකෝටි ගණන් නාස්ති කරමින් සිටිනවා. මේක සාධාරණ නැහැ. ඒ නිසා අවුරුදු එකහමාරක් යන කොට තමුන්නාන්සේලාගේ ගමනේ දිශානතිය පෙන්නුම් කරලා ඉවරයි. වඩාත් වැඩියෙන් කාබාසිනියා කරන, විනාශයට පත් කරන, සියලු සේසතම හුරාගෙන යන දිසාවකට තමයි තමුන්නාන්සේලා අවතීර්ණ වෙමින් සිටින්නේ.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් ඩොලර් බිලියන 2ක ණය මුදලක් දෙන්න එකඟ වුණාය කියනවා. වොෂිටන් සාකච්ඡාවලදී ඩොලර් කෝටි 220ක ණය මුදලක් දෙන්න එකඟ වුණාය කියනවා. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ නිලධාරින් හා ආණ්ඩුවේ නිලධාරින් අතර ගිවිසුමක් අත්සන් කළාය කියනවා. ඒ ගිවිසුම තවම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා නැහැ. හැබැයි අද ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ලෝකය පුරා පෙන්නුම් කර තිබෙන්නේ, ලෝකයටම දෙන්නේ එක කොන්දේසියයි. දැන් ඒ ගොල්ලෝ "විකිණිය යුතුයි" කොන්දේසිය දමන්නේ නැහැ. විකිණීම හෝ නොවිකිණීම ආණ්ඩුවේ කැමැත්තයි. අද ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ලෝකයටම කියන්නේ, තමන්ගේ අයවැය පරතරය අඩු කරගන්න කියන එකයි. එච්චරයි කියන්නේ. "අයවැය පරතරය අඩු කරගන්න, ආදායම වැඩි කරන්න. වියදම අඩු කරගන්න" ඔච්චරයි කියන්නේ. ආදායම වැඩි කරන්න මොකක්ද කරන්න ඕනැ? තමුන්නාන්සේලා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ළඟට යන්න කලින්, මැයි මාසයේ 02වැනි දා මේ බදු ටික පනවලා ඔවුන්ට පෙන්වන්න ඒ සහතිකය අතට ගත්තා. මේ සහතිකයත් අරගෙන තමයි වොෂිංටන් නුවරට ගියේ. "මෙන්න, අපි ආදායම වැඩි කරන්න සැලසුම් හදලා තිබෙනවා. මෙන්න වැට් බද්ද වැඩි කරලා තිබෙනවා. මෙන්න අපේ සහතිකය" කියා පෙන්නුවා. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ළඟට යන්න අවශ්‍ය වන සහතික සම්පූර්ණ කර ගැනීම වෙනුවෙන් තමයි තමුන්නාන්සේලා මේ බද්ද වැඩි කළේ. මොකද, ඔවුන් කියනවා, "ආදායම වැඩි කරගන්න" කියලා.

ඊළඟට ඔවුන් ඉල්ලන්නේ, අය වැය පරතරය අඩු කරන්න නම් වියදම් කප්පාදු කරගන්න කියායි. වියදම් කප්පාදු කරන්න මොකක්ද කරන්න තිබෙන්නේ? සහනාධාර කප්පාදුවයි. තමුන්නාන්සේලාට ණයවල පොලී වාරික ගෙවන එක කප්පාදු කරන්න බැහැ. රාජ්‍ය සේවකයාගේ වැටුප් ගෙවන එක අඩු කරන්න බැහැ. තමුන්නාන්සේලාගේ නාස්තිකාර වියදම් අඩු කරන්න බැහැ. ඒ වෙනුවට තමුන්නාන්සේලා අඩු කරන්නේ ජනතාවගේ සහනාධාරයි. ඒ නිසා තමයි පිං පඩිය කපන්නේ. ඒ නිසා තමයි පොහොර සහනාධාරය කප්පාදු කරන්නේ. ඒ නිසා තමයි තේ සඳහා තිබුණු සහනාධාරය කප්පාදු කරන්නේ. ඒ නිසා තමයි රබර් ගොවියා සඳහා තිබුණු සහනාධාර කප්පාදු කරන්නේ. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ළඟට යන්න කලින් තමුන්නාන්සේලා සම්පූර්ණ කළ යුතු කොන්දේසි කිහිපයක් තිබුණා. එකක් තමයි, ආදායම වැඩි කිරීම සඳහා වූ යෝජනා. ඒ යෝජනා අනුව තමයි බදු වැඩි කරන්නේ. තමුන්නාන්සේලා ඒ සහතිකයට රබර් සීල් එක ගහගත්තා.

ඊළඟට අවශ්‍යව තිබුණේ මොකක්ද? ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ළඟට යන්න කලින් සහනාධාර කප්පාදු කරන්න ඕනෑ. සහනාධාර ටික කප්පාදු කරලා ඒ සහතිකයත් ගත්තා. ඒ සහතික දෙක අරගෙන තමයි, තමුන්නාන්සේලා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ළඟට ගියේ. "මෙන්න, අපි බදු වැඩි කරන්න යෝජනා ගෙනැත් තිබෙනවා. සහනාධාර කප්පාදු කර තිබෙනවා. අය වැය පරතරය අඩු කර ගැනීම සඳහා කටයුතු සූදානම් කර තිබෙන්නේ, කරුණාකර අපට ආධාර දෙන්න" කියන එක තමයි එතැනට ගිහින් තමුන්නාන්සේලා ඉල්ලුවේ.


ඒ අනුව තමයි ඩොලර් බිලියන 2.2ක ණය මුදලක් අනුමත වෙලා තිබෙන්නේ. අපි දැන ගන්න කැමැතියි, මෙතැනින් එහාට තිබෙන අපේ එකඟතා මොනවාද කියලා. මේ පාර්ලිමේන්තුව ඒවා දැන ගන්න ඕනෑ. මම ඊයේ අග්‍රාමාත්‍යවරයාගෙන් මේ ගැන ඇහුවා. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල හා අප අතර ඇති කර ගත් එකඟතා මොනවාද, මේ ණය කවදා වෙනකම් දෙනවාද, ණය ප්‍රමාණය කොපමණද, එම ණය ගෙවන්නේ කොහොමද කියන මේ කාරණා. ඒවා මේ පාර්ලිමේන්තුව දැන ගන්න ඕනෑ නැද්ද?

## කවුළුව හැරෙමි තබමි

# සදා දිලෙන සැබෑ තරුව

තරු උන්මාදයකින් පෙළෙන ලාංකේය සමාජය මේ වන විට සැබෑ තරුව සොයා ගැනීමට බැරිව තරු පෙනෙන තත්වයකට ඇද වැටී ඇත. එහෙත් මේ ව්‍යාජ තරු අතර සදා නොනිමෙන මඟ කියන තරුවක් ලාංකේය සමාජය යා යුතු මඟට එළිය දෙමින් අහස් ගැබේ ඉහළින්ම බැබලේ. ඒ එළියෙන් මඟ දකින ලාංකේය සමාජ ව්‍යාපාරය දිනෙන් දින ඉදිරියට ඇදෙන්නේ ඒ එළියෙන් අලුත් ලොව ආලෝකමත් කිරීම සඳහාමය. ඒ මිනිස් තරුව අන් කිසිවෙකු නොව රෝහණ විජේවීර නම් ඒ අසහාය දේශපාලඥයායා; අසාමාන්‍ය මිනිසාය; නොපසුබට විප්ලවවාදියාය. ඔහු ලාංකේය සමාජය එතෙක් ගමන් කළ අඳුරු මාවත වෙනුවට අලුත් මාවතක් කපා දුන්නේය. ඒ 1964 මැයි 14 දින එහි ආරම්භක පස් පිඩැල්ල කපමිනි. ලාංකේය නිර්ධනීන්ගේ නියමු පක්ෂය, ජ.වි.පෙ. උපත ලබන්නේ එදාය. ඒ මහා ව්‍යාපාරයට නායකත්වය දුන් මහා නියමුවා ඔහුය. විජේවීර සහෝදරයාය.

1971 අප්‍රේල් මහ නඩු විභාගයේදී අපරාධ යුක්ති විනිශ්චය කොමිසන් සභාව හමුවේ ඔහු දුන් සාක්ෂිය මෙරට පමණක් නොව ලෝකයේ විප්ලවවාදී ඉතිහාසය තුළද සුවිශේෂී සටහනක් තබා ඇත. එම නඩු වාර්තාව සහ තවත් ලියවිලි පදනම් කරගෙන '71 නඩු විභාගය: විජේවීරගේ හෘදය සාක්ෂිය' නමින් කෘතියක් පසුගිය මැයි 14 දින කොළඹ මහවැලි කේන්ද්‍රයේදී එළි දැක්විණි. එහි කර්තෘ වූයේ කලක් ජ.වි.පෙ. ක්‍රියාකාරිකයකු වූ උදේනි සමන් කුමාර සහෘදයාය. ටයිප් පිටු 12,000 කට අධික වූ එම නඩු වාර්තාව මෙරට ඉතිහාසයේ දීර්ඝතම නඩු විභාගය වූ අතර එයින් තෝරාගත් සාරය මෙම කෘතියේ ඇතුළත්ය.




ධනේශ්වර පාලනය, එහි අධිකරණය හා නීතිය අභියෝගයට ලක් කරමින් විජේවීර සහෝදරයා එම නඩුවේදී දුන් සාක්ෂිය විනිසුරු මඬුල්ලේ පමණක් නොව සමස්ත ලාංකේය සමාජයේද මෙරට විද්වතුන් කලාකරුවන්, පමණක් නොව ලෝ දනන්ගේද නෙත් ඇර බැලීමට පාත්‍ර විය. රෝහණ සහෝදරයාට සහ ජ.වි.පෙ.ට අවලාද නගන සතුරන්ට අප කියන්නේ, 'විජේවීරගේ හෘදය සාක්ෂිය' කියවා බලන ලෙසයි. රෝහණ විජේවීර නමැති ඒ දිදුලන මිනිස් දේශපාලන තරුව මේ නරුම සමාජ ක්‍රමයට වඩා කොතරම් නම් උසකින් දිදුලන්නේදැයි එවිට පසක් වනු ඇත.

# මීඩියා ෆස්ට් - ජනතාව ලොස්ට්



මිනිස් වර්ගයාට අත්වන ස්වාභාවික විපත පවා වෙළඳාම පිණිස යොදාගැනීම ධනවාදයේ ස්වභාවයයි. ශ්‍රී ලංකාව තුළ මේ වන විට ඇති වී තිබෙන ගංවතුර උවදුරින් පීඩාවට පත් ජනයාගේ දුක කඳුළ, වේදනාව විකුණාගෙන කෑම සඳහා මේ දිනවල විවිධ ජනමාධ්‍ය සහ විශේෂයෙන් රූපවාහිනී චැනල් පොරකන අන්දම දුටු විට විටෙක හිරිකිතේ බැරිය. "අපි තමයි ඒ මිනිසුන්ගේ දුක බැලීමට මුලින්ම ගියේ, අපි තමයි ෆස්ට්" කියමින් මිනිසුන්ගේ කරදර විකුණාගෙන කෑමට මේ දිනවල රූපවාහිනී නාලිකා අතර ඇත්තේ නිමක් නැති පොරයකි. ඉණවටක් වතුරේ බැසගෙන දුකටපත් මිනිසුන්ගේ මුවගට මයික් එක අල්ලා "ඔබේ නාලිකාව පමණයි අපිව බලන්න ආවේ. අපිට උදව් කළේ. මුලින්ම ආවෙ ඔයගොල්ලො. ඔයගොල්ලො නිවන් දකින්න ඕන. අපි මුළු හදින්ම ඔයාලගේ නාලිකාවට පිං දෙනවා" ආදී වදන් ඔවුන් ලවා තෙපලවාගෙන ලෝකයේ මානුෂීයම ආයතන ලංකාවේ රූපවාහිනී චැනල් බවට මවා පෙන්වීමට ඒ ඒ නාලිකාවල නිවේදකයින් දඟලන දැඟලිල්ල දුටුවම අපිටම ලැජ්ජා සිතේ. විටෙක දුකක්ද දැනේ. මන්ද මිනිසුන්ගේ දුක පෙන්න පෙන්නා ලාංකේය සමාජය ඇන්දීමට දරන ඔවුන්ගේ 'මාර සටන' දුටු විටය.

යුද්ධය, ස්වාභාවික විපත්, දුප්පත්කම, දූෂණ, අක්‍රමිකතා මේ ආදී බොහෝ කාරණාවලදී ලංකාවේ ජනමාධ්‍යවලට නම් කල්ල මරේය. ඒ නිසා දැන් ලංකාවට මේ ප්‍රශ්න කතා කිරීමට, ඒවාට එරෙහිව සටන් කිරීමට සමාජ ව්‍යාපාරයක් අවශ්‍ය නැත. ජනමාධ්‍ය මුදලාලිලා ඒ කාර්යය තිතට කරති. ගංවතුරෙන් පසු ලෙඩදුක්, නිවාස ප්‍රශ්න, ඊට පසු නැවත නියඟය, මේ සියල්ල මාධ්‍යයට ලාභ මලු තරකරන, තම නාලිකාවේ ජනප්‍රිය කර ගැනීමට තිබෙන වෙස්වලාගත් ආශීර්වාදයන්ය. මිනිසුන්ගේ දුක විකුණා කෑම හැර ඒ දුකින් මිදීමේ මාර්ගය මේ මාධ්‍යහිමියන්ට කිසිසේත් අදාළ නැත. මිනිසුන් දුකට පත් වන තරමට ඔවුන්ගේ සතුට වැඩිවේ. මේවාට අසුවන මිනිසුන්ගේද ඉරණම ගංවතුරේ ගසාගෙන යාමය. දුකට පත්වන මිනිසුන්ට ආධාර කළ යුතුය. ඒත් 'ෆස්ට්' වීමට දඟලන්නේ ඇයි? ඒ ඇත්තටම මිනිසුන්ට ආදරය නිසාද? තම ලාභ මළු තරකර ගැනීමේ කෑදරකම නිසාද?

# හිරු කිරණින් පන්නරය ලැබූ දරුවෝ

තරුණයින්ගේ ශිෂ්‍යයින්ගේ යුග කාර්යභාරය කථාකරන විට එය එකම වචනයකට සම්පිණ්ඩනය කළ හැකි බව ලෙනින් වරක් කීවේය. එනම් ඉගෙන ගන්න යනුයි. එහිදී ඔහු තවත් දෙයක් කියයි. එනම් ඉගෙන ගන්නේ මොනවාද? ඉගෙන ගන්නේ කෙසේද? පැරණි සමාජය වෙනුවට අලුත් සමාජය එනම් කොමියුනිස්ට් සමාජය ගොඩ නැගීමේ, ඒ සඳහා ශික්ෂණය ලැබීමේ, පුහුණුව සහ අධ්‍යාපනය ලැබීමේ වගකීම පැටවෙන්නේද තරුණයින් හා ශිෂ්‍යයන් මත බව ලෙනින් අවධාරණය කරයි. ඒ අලුත් සමාජය ගොඩනැගීම සඳහා ඉගෙන ගනිමින් සටන් කරමින් සටන් කරන ගමන් ඉගෙන ගනිමින් එය භාවිතයයට නැගීම සඳහා තම දිවිහිමියෙන් සටන් වැදුණු ශිෂ්‍ය පරපුරකට ශ්‍රී ලංකිකයින් වශයෙන් අපි හිමිකම් කියමු.



තම පෞද්ගලික අභිමතාර්ථ පසෙකලා මේ දුකට පත් සමාජය, විනාශ කරා ඇදෙන සමාජය ඉන් මුදවාගෙන, යුක්තිය, සාධාරණය, සැමට අලුත් දැනුම ලබාදීම පෙරදැරි කරගෙන තම ජීවිතවලින් පවා වන්දිගෙවා සටන් කළ සහ කරන සිසු පරපුරක් අප සතුය. හැම ජූනි මසකම 20 වෙනි දින විරු සිසු දිනය නමින් සමරනු ලබන්නේ ඒ ගමන වෙනුවෙන් තමන්ගේ උතුම් දිවි කුසුම පුදකළ ඔවුන්ට කරන උපහාරයක් ලෙසය. තම මල් කැකුළුවන් ජීවිත සතුරා විසින් පුළුස්සා දමා හළු කරද්දීත් තම උත්තුංග අරමුණ වෙනුවෙන් නොසිදෙන එඩියකින් සහ සවියකින් සටන් වැදි ඒ ලාංකේය විරු සිසු පරපුරේ කථාව ඉතිහාසයේ කිසිදිනෙක මැකී යනු නොමැත. එය මකා දැමීමටද නොහැකිය. වත්මන් සිසු පරපුරට එම කථාව අධ්‍යයනාගාරයක්මය. ඒ අධ්‍යයනාගාරයට වැදී ඉගෙන ගත යුතු දේ බොහෝය. එය එතරම්ම පොහොසත්ය. ඉදින් ලෙනින් කිව්වා සේ වත්මන් සිසු පරපුරටද අපට කීමට ඇත්තේද අධ්‍යයනාගාරයට වදින්න ඉගෙන ගන්න; සටන් කරන්න; සටන් කරමින් ඉගෙන ගන්න. අලුත් ලොවක් සඳහා...

# පොලිටිකල් පංතිය

පොලිටික්ක සුපුරුදු විදිහට පරක්කු අතරෙ ළමයි ආපු ගංවතුරයි, එන්න තියෙන ගංවතුරයි, නාය ගිය ඒවයි, යන්න තියෙන ඒවයි ගැන කතා කළා.

"ගංවතුර නැද්ද ළමයිනේ" පොලිටික්ක ගංවතුරට ගහගෙන ආවා වගේ පංතියට කඩා වැදුණා.

"ගුඩ් මොනිං සර්" වසන්තිය කිවුවෙ අනුරුද්දිය දිහා හොරැහින් බලන ගමන්.

"මොන ගුඩ්ද ළමයිනේ. මේක මහ එපා කරපු මෝනිං එකක්." පොලිටික්ක කියද්දි අනුරුද්දිය 'ඇද්ද උඹට' කියන්න වගේ වසන්තියට නියෙව්ව.

"ඇයි සර් එහෙම කියන්නෙ... ගෙට පස් කණ්ඩියක් වැටුණාද? පාර යටවුණාද?" මංජුවට කුතුහලේ.

"නෑ ළමයිනේ... එහෙම කරදරයක් වුණේ නෑ. බලන්නකො එද්දි මාව තෙමුණානෙ." පොලිටික්කට කිව්වට මදි වගේ හිතුණා. "තෙමුණ කිවුවට තෙමිල බත්වුණා."

"සර් තෙමිච්ච එකට ඔය තරම් අප්සෙට්නම් ගෙවල් වතුරට යටවෙච්චි, ගෙවල් නාය ගිය මිනිස්සුන්ට, පවුලෙ අය පණපිටින් වැළලුණු මිනිස්සුන්ට මොනව හිතෙනව ඇද්ද සර්." මංජුව විහිලුවක් වගේ ඇත්තකින් දමල ඇන්න.

"හරි හරි ළමයිනේ ඒ අමාරුව මම නොදන්නව නෙමෙයි." පොලිටික්ක තාවකාලිකව පරාජය බාරගත්ත. "මං කියන්න හැදුවෙ වැස්සෙ තරම... ඒක නෙමෙයි ළමයිනේ, බලන්නකො ළමයිනේ ආණ්ඩුව රණවිරු සැමරුම වැස්සට යට ගැහැවුවනෙ." පොලිටික්ක වමට සිග්නල් දාලා දකුණට කැපුව.

"මහින්ද මහත්තය හිටියනම් ගංවතුර, නායයෑම් නෙමෙයි මොනව තිබ්බත් සතියක් සමරනව නේද සර්." කනිය අවදියෙන් කියල පෙන්නුව.

"නැතුව ළමයිනේ. ගංවතුර නම් අද ආව, හෙට බැස්සා... එහෙමද යුද ජයග්‍රහණෙ. ඒක හැමදාම තියෙනව. සමරන්නෙ නැතුව කොහෙමද?" පොලිටික්කට හෙණ හැපිය.

"එහෙනම් මහින්ද මහත්තයයි, එයාගෙ කට්ටියයි හැමදාම කෑ ගහන්නෙ කොටිය ඔළුව උස්සනව කියල. අවුරුදු හතක් ගිහිල්ලත් යුද්දෙ මතක් කරල මිනිස්සුන්ගෙ ඔළුවට තමන්ගෙ දේශපාලනේ බස්ස ගන්න කියන කතාවක්නෙ." මංජුව හීනියට දැලි පිහි පාරක් ඇද්දා.

"දැන් රාජපක්ෂ කල්ලියෙ අයට වැඩට යන්න වගේ පරීක්ෂණ ඉස්සරහ කටඋත්තර දෙන්න යන්න වෙලා. ඒ හිතේ අමාරුවට රණවිරු සැමරුම් තියලා 'මෙහෙව් අපෙන් පලිගන්නවෝ' කියන්න හදනව. හැබැයි දැන්නම් මිනිස්සු එච්චර අන්දන්න බැරිවුණා මං හිතන්නෙ. කුරුණෑගල දාපු වැඩෙත් වැස්ස පිට දාල අකුළන්න වුණානෙ." සමනත් තුවාලෙ පෑරුව.

"ළමයිනේ බලන්න දවස් දෙකයි වැස්සෙ... බලන්න වෙච්ච විනාසයක්." පොලිටික්ක කතාව කලින් ට්‍රැක් එකට ගන්න බැලුව.

"විනාසෙ කියන්නෙ සර්... මහින්දගෙ ආරක්ෂාව ගැනයි යුද ජයග්‍රහණෙ විකුණන වැඩෙයි වැස්සට හේදිලා ගිය එකද?" මංජුවත් හරහටම හිටිය.

"නෑ නෑ ළමයිනේ... බලන්න කොළඹයි, අරණායකයි වෙච්ච වැඩේ. මිනිස්සු කී දාහකට ප්‍රශ්නයක් වුණාද?" කරන්නම දෙයක් නැති තැන පොලිටික්ක වතුරට බැස්සා.

"ගංවතුර බහින දවස්වල මහින්දල ශිරන්තිල ගංවතුර බලන්න යනව ෆොටෝ දාල තියනවනම් දැක්ක. ඒත් එයාගෙ මහලොකු කොළඹ ලොක්කො කාටවත් මිනිස්සුන්ට සහන දෙන වැඩේට බහින්න බැරිවුණා. දෙගොල්ලන්ගෙම ආණ්ඩු කෙරිල්ලෙ ප්‍රතිඵලේ භුක්ති විඳින්නෙ සිද්ධ වුණේ අහිංසක මිනිස්සුන්ට. පහුගිය කාලෙ 'ගොඩ කළ මෙහි වගුරු බිමකි - ඒ මත දැන් පුරවරයකි' කියලා වැරදි සංවර්ධනයක් කරපු ආණ්ඩු, වගුරු බිම් ගොඩ කරලා 'වෙල් යායට මුහුණලා සුන්දර ඉඩමක් ඔබටත්' කියලා විකුණද්දි බකං නිලාගෙන හිටපු ආණ්ඩු මේවට වගකියන්න ඕනෙ. ලැජ්ජ නැතුව දැන් බොරුවට ෆොටෝ දාගන්න හදනව. ජවිපෙ රතුතරුව නොතිබෙන්න සෑහෙන දෙනෙක් බඩගින්නෙ. ශ්‍රමදානෙ නොතියෙන්න ගෙවල් සුද්ද කරගන්න එක තව කල් යන්න තිබුණා." සමනගෙ කතාවට කොරිඩෝවෙ ඉඳල හිස්ටීරියාව අත්පුඩි ගහපු එක පොලිටික්කට පිහියෙන් ඇන්න වගේ වුණා.

## සමාජ වෙනසකට...

03 පිටුවෙන්



රට තුළ දේශපාලනයේ කිසියම් අරාජිකත්වයක්, විකල්පයක් සඳහා වූ දේශපාලන රික්තයක් නිර්මාණය වෙමින් තිබෙනවා.

***නියමුවා:-ඔබ පවසන මේ දේශපාලන රික්තය හා එහි විශේෂතාවය තවදුරටත් පැහැදිලි කළොත්?***

***ටිල්වින් සිල්වා සහෝදරයා:-*** හොඳයි, මේ ආණ්ඩුව හැදුණ හැටි බලන්න. මේ ආණ්ඩුව හැදුණේ මීට පෙර වගේ බලයට ආපු පක්ෂයේ ශක්තියෙන් නොවෙයි. මහින්ද රාජපක්ෂ පාලනයට එරෙහිව රට තුළ මතුවුණ විරෝධයත්, රාජපක්ෂ පාලනය පෙරළා දැමීමට පෙරට ආපු, ක්‍රියාත්මක වුණ විවිධ දේශපාලන හා සිවිල් සමාජ කණ්ඩායම්වලත් මැදිහත්වීමෙන් රාජපක්ෂ පාලනය බිඳවැටුණා. එහි අතුරු ඵලයක් ලෙස මේ හවුල් ආණ්ඩුව බලයට ආවා. ඒක තමයි ඇත්ත. බලයට ආපු ආණ්ඩුව රාජපක්ෂ පාලනය පරාජය කිරීමට දායක වුණු, යහපාලනය බලාපොරොත්තු වුණු, ජනතාවගෙත් සමාජ බලවේගයන්ගේත් බලාපොරොත්තු ඉක්මනින් කඩකළා. දැන් මේ ආණ්ඩුව හැදීමට සෘජුව හෝ වක්‍රව දායක වූ පුද්ගලයන් හා සිවිල් සංවිධාන කලකිරීමට පත්වෙලා. ඔවුන් ආණ්ඩුවෙන් ඉවත් වෙමින් ඉන්නවා. එහෙත් ඒ වෙනුවට ඔවුන් මීට පෙර වගේ රාජපක්ෂ කල්ලිය වෙත යන්නේ නැහැ. මොකද, රාජපක්ෂ විරෝධය තමයි ඔවුන්ගේ මූලික දේශපාලනය වුණේ. ඔවුන්ට ශ්‍රීල.නි.ප.ය වෙත යන්නත් බැහැ. ඒකෙ බාගයක් ආණ්ඩුවේ ඉතිරි බාගෙ මහින්ද අතේ. එවැනි තත්වයක් තුළ ඔවුනට අලුත් විකල්පයක් තෝරා ගැනීමට බල කරල තිබෙනවා. මේ තත්වය එ.ජා.ප. ආණ්ඩුවක් එපා වුණාම ශ්‍රීල.නි.ප.යට හා, ශ්‍රීල.නි.ප.ය එපා වුණාම එ.ජා.ප.යට ගිය සරල චක්‍රය වෙනස්කරල තිබෙනවා. ඒ අනුව තමයි දේශපාලන බිමේ විකල්ප දේශපාලනයක් සඳහා පැහැදිලි රික්තයක් හා වුවමනාවක් නිර්මාණය වෙමින් තිබෙන්නේ.

***නියමුවා:- හොඳයි, මේ තත්වය තුළ ජ.වි.පෙ. කාර්යභාරය කුමක්ද?***

***ටිල්වින් සිල්වා සහෝදරයා:-*** පැහැදිලිවම, නිර්මාණය වෙමින් තිබෙන මේ සුවිශේෂී දේශපාලනය තුළ විකල්ප බලවේගයක් බිහිකිරීමේ ඉඩ විවර වෙන්නේ ජ.වි.පෙ.ට. විකල්ප බලවේගයක් ගොඩනැගීමේ හැකියාව තිබෙන්නේ ජ.වි.පෙ.ටයි. මේ වනවිට වගකිවයුතු විපක්ෂයක කාර්යභාරය ඉටුකරමින් ඉන්නෙත් අපයි. මේ සියලු තත්වයන් තුළ ජනතාවගේ විශ්වාසය දිනෙන් දිනම අප වෙත ලැබෙමින් තිබෙනවා. මීට හොඳම උදාහරණය තමයි පසුගියදා පැවැත්වූ ගුරු සමුපකාර ඡන්දයේදී අපේ ලංකා ගුරුසේවා සංගමය ඉදිරිපත් කළ කණ්ඩායමට අති විශිෂ්ට ජයක් ලැබීම. ඒ වගේම අපේ මැයි දිනයත් කාගේත් අවධානය දිනාගත් එකක් වුණා. මැයි දිනයෙන් පසු රට තුළ වැඩිපුරම කථා කළේ ජ.වි.පෙ. ගැන. ඒ වගේම මේ ගංවතුර විපත වේලාවෙත් ජනතාවට සහන ලබාදීම සඳහා පොදු ජනතාව විශ්වාසය තැබුවේ ආණ්ඩුවේ ආයතන ගැන නෙවෙයි ජ.වි.පෙ. ගැනයි. ඒ වගේම ජනතා අයිතීන් සඳහා කරන සටන්වල (විශේෂයෙන් පොහොර සහනය කැපීමට එරෙහිව ගොවි සටන) පෙරමුණේ හිටියේ ජ.වි.පෙ. යි. මීට අමතරව රටේ අර්බුදය ගැන වැටහීමක් හා එයට සැබෑ විසඳුම් සහිත වැඩපිළිවෙළක් තිබෙන්නේ ජ.වි.පෙ.ට බව දැන් බොහෝ දෙනා දන්නවා. මේ තත්වය තුළ පවතින දේශපාලන රික්තය පිරවීමේ විකල්ප ජනතා බලවේගයක් ගොඩනැගීමට අපට හොඳ ඉඩක් විවර වෙලා තිබෙනවා.

***නියමුවා:- මෙහිදී ඔබ පක්ෂයට තිබෙන අභියෝග මොනවාද? පසුගිය දිනවල පක්ෂයේ අර්බුද තිබෙන බවට දිවයින ඉරිදා පුවත්වත වාර්තාවකුත් පළකරලා තිබුණා. මේ ගැන කිව හැක්කේ කුමක්ද?***

***ටිල්වින් සිල්වා සහෝදරයා:-*** ඔව්! ධනපති ක්‍රමයේ පොදු අර්බුදයත්, මේ මොහොතේ ආණ්ඩුව මුහුණ දෙන මූල්‍ය අර්බුදය හා අභ්‍යන්තර අර්බුදත්, වසර 68ක ධනපති පාලනයේ අසාර්ථකත්වයත් විසින් නිර්මාණය කර තියෙන මේ විශේෂ දේශපාලන තත්වය අපට වාසිදායක බව ධනපති පාලකයන් හා බලය අභිමිවූවන්ද දන්නවා. ඒ නිසාම මේ තත්වය තුළ අපේ පක්ෂයේ ඉදිරි ගමන නැවැත්වීමට මේ අය විවිධ දේ කරනවා. මැතිවරණ ක්‍රම වෙනස්කිරීමේ සිට අවලාද නැගීම දක්වා නොයෙක් දේ කරනවා. ඒත් මේ දේශපාලන මොහොත ජනතාවගේත් පක්ෂයෙත් සතුරන්ට වාසිදායක මොහොතක් නෙවෙයි. ඒ නිසා අපට එරෙහිව ඔවුන් ඉදිකරන බාධා වහාම පැරදවීමේ හැකියාව අපට තිබෙනවා. දිවයින පුවත්වතේ ප්‍රවෘත්තිය හා මඩ ලිපියට අප පිළිතුරු දීමත් සමඟ රටේ ජනතාව ඒ බොරු ප්‍රතික්ෂේප කරන තැනට ආවා. ජනතා විමුක්ති පෙරමුණ ප්‍රතික්ෂේප කරනවා වෙනුවට ඔවුන් අවලාද ප්‍රතික්ෂේප කළා. එම අවලාදවලට අපි ඉතාම සාර්ථකව මුහුණ දීලා ඒක පැරදුවා.

***නියමුවා:- ජ.වි.පෙ.ට එරෙහිව මෙවැනි අවලාද නැවත එන එකක් නැහැ කියලා ඔබ හිතනවද? අවලාදවලින් පක්ෂයට හානියක් ඇත්තෙම නැද්ද?***

***ටිල්වින් සිල්වා සහෝදරයා:-*** අපට විරුද්ධව අපේ පංති සතුරන් අවලාද හා මඩ ගහන්නෙම අපට හානි කරන්න තමයි. ඔවුන්ගෙ අරමුණ දැන් අප වෙත ගොඩනැගෙමින් තිබෙන ජනතා විශ්වාසය පළුදු කිරීම තමයි. දූෂිත දේශපාලකයන් කල්පනා කරනවා, ඔවුන් වගේම අපත් දූෂිත වුණොත් හොඳයි කියලා. අඩු ගානේ සමාජය එහෙම හිතනවට ඔවුන් කැමතියි. ඒත් ඉතිහාසය පුරා මහා කැපකිරීම්වලින්, ආදර්ශයන්ගෙන් ජීවිත පරිත්‍යාගයෙන් අප රටේ දිනාගත් විශ්වාසයක් තිබෙනවා. ඒක බිඳින්න කාටවත් බැහැ. ඒ නිසාම තමයි අපට ජනතාවගෙන් දුරස් කිරීමට අපට මඩ ගැහුවම මඩ ගහපු අය ජනතාවගෙන් ප්‍රතික්ෂේප වෙන්නේ.

මේ අවලාද, මඩ, කුමන්ත්‍රණ හා බාධාකිරීම් ඉවරයි කියලා අපි හිතන්නේ නැහැ. අප ලබාගන්නා ජයග්‍රහණ වැඩි වෙන්න, වැඩි වෙන්න, ධනපති ක්‍රමයත් එහි ආරක්ෂකයිනුත් අර්බුදයට යන්න, යන්න ඔවුන් අපට එරෙහිව කරන ප්‍රතිවිප්ලවකාරී කටයුතු වැඩි කරාවි. තව තව මඩ අවලාද නගාවි. ඉන් එකක් පැහැදිලි වෙනවා. ඒ, ඔවුන් දුර්වල බවත් අප ජයග්‍රහණය කරා යන බවත් ඒ නිසා අපි බාධා නොසලකා මඩ අවලාද නොසලකා ඒවා පරාජය කරමින් පෙරට යන්න සූදානම් කියන එකත් එවැනි දේවලින් අපේ ගමන නතර කළ නොහැකි බවත් අවධාරණය කරනවා.

***නියමුවා:- හොඳයි අවසාන වශයෙන් මේ රටේ ජනතාවට මේ මොහොතේ ඔබ කරන දේශපාලන අවධාරණය කුමක්ද?***

***ටිල්වින් සිල්වා සහෝදරයා:-*** ධනවාදය තුළ ධනපති ආණ්ඩුවලටත්, වත්මන් එ.ජා.ප. - ශ්‍රීල.නි.ප. හවුල් ආණ්ඩුවටත් ජනතාවගේ එකම ප්‍රශ්නයක්වත් විසඳන්න බැහැ කියන එක දැන් පරම සත්‍යයක්. ඒ නිසා දැන් ජනතාව කළ යුත්තේ, මෙතෙක් කලක් කරගෙන ආපු තට්ටුමාරු දේශපාලන ක්‍රීඩාව නතර කරලා, නව දේශපාලන ගමනකට පෙළගැසීමයි. ජනතාවගේ අයිතීන් වෙනුවෙන් සටන් කරන්න අප සූදානම්. දැනුත් සටන් කරනවා. ඒ වගේම නව සමාජ ආර්ථික ක්‍රමයක් හදන්න අපි සූදානම්. ඒ සඳහා අපට ජනතාවගේ සහාය අවශ්‍ය වෙනවා. වර්තමාන ක්‍රමයෙත් වත්මන් පාලනයෙත් අර්බුදය දකින, යහපත් රටක්, හොඳ ආර්ථිකයක් ප්‍රාර්ථනා කරන සියලු සවිඥානික බලවේගවලින් අපි ඉල්ලා සිටිනවා, තවදුරටත් ජනතාවට වල්මත් වීමට ඉඩ නොදී නව සමාජයක් නිර්මාණය කළ හැකි පාලනයක් සඳහා අවශ්‍ය ජනතා බලය ගොඩනැගීමට අප සමඟ එක්වන්න කියලා. එහි පෙරමුණ ගන්න අප සූදානම්. දැන් තිබෙන්නේ සමාජ බලවේගවල හා ජනතාවෙග් වගකීම හරියට ඉටුකිරීම පමණයි. ඒ සඳහා අප සමඟ අත්වැල් බැඳගන්නත් කියලා අප ඉල්ලනවා.

## ආණ්ඩුව ණය...

05 පිටුවෙන්

බදු බර පටවන ආණ්ඩුව, විදේශ මුදල් සොයා ගැනීමට තව තවත් ණය ගනිමින් සිටී. ඒ අතර ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් ගන්නා ණය වෙනුවෙන් රාජ්‍ය ආයතන විකුණා දැමීමේ කොන්දේසියද ඉටු කරමින් සිටී.


මේ සියල්ල සාරාංශ කළ විට එකක් පැහැදිලිය. ඒ ධනපති ක්‍රමය තුළ ලාංකේය ආර්ථිකය ගොඩ ගැනීමට කිසිදු පාලක කණ්ඩායමකට නොහැකි බවය. එසේම ණය උගුලින් රට මුදා ගැනීමට වත්මන් පාලනයටද නොහැකි බවය. ණයට කන ආර්ථිකයක් වෙනුවට නිෂ්පාදන ආර්ථිකයක් හැදීමට මොවුන්ට නොහැක. ආණ්ඩුවේ එකම අරමුණ, දවස ගෙවා ගැනීමට තරම් මුදලක් කෙසේ හෝ සොයා ගැනීමය. ජනතාව මත බදු බර පටවන්නේ ඒ අනුවය. එබැවින් දැනට පටවා ඇති අසාධාරණ වැට් බද්ද 'දූෂණ බද්දක්' නොව වත්මන් පාලනයේ බැරිකම පෙන්වන, ඔවුන්ගේ අනුකම්පා විරහිතකම පෙන්වන 'බඩ වඩා ගැනීමේ බද්ද' වේ.




විශාල මූල්‍ය අර්බුදයක් බවට පත්ව ඇති වත්මන් ආර්ථික අර්බුදයෙන් මිදීමට හෝ ණය උගුලින් රටත් අනාගත පරපුරත් ගලවා ගැනීමට සැබෑ ලෙසම වුවමනාය. අපට දැන් ඉතිරිව ඇත්තේ, මේ බදු බරට කර ගැසීම නොව, ණයට කන, බදු ගහන වත්මන් ධනවාදී ආර්ථිකය වෙනුවට සැලසුම් සහගත, නිෂ්පාදනය මත පදනම් වූ ආර්ථිකයක් සඳහා නව පාලනයක් නිර්මාණය කිරීමට පෙරමුණ ගැනීමය. ඒ සඳහා අවශ්‍ය ජන බලය ගොඩ නැගීමය. නවීන සමාජවාදී සමාජයක් වෙනුවෙන් කටයුතු කිරීමය.

## අසත්‍යයට එරෙහිව...

11 පිටුවෙන්



නිවාස අඩස්සියේ තැබීය.

ඉහත කරුණු කිහිපය යළි මතක්කර ගත යුතු වන්නේ, දැනුම තුළ සත්‍යය පෙරට ආවේ කෙතරම් දුෂ්කරතා මැදද යන්න තේරුම් ගැනීම සඳහාය. ඒ, දැනුම තුළ වන එම සත්‍යය අදත් මානව වර්ගයාට සේවය කරයි. එහෙත් ඒ බව වටහා නොගන්නා මිනිසා අසත්‍යය තුළම ජීවත් වීමට උත්සාහ දරයි. අසත්‍යයට එරෙහිව සත්‍යය කරන අරගලය තවම අවසන් නැත; වර්තමානයේද පවතී. එහෙත් සත්‍යය දිනනු ඇත. ඒ කෙසේද යන්න මීළඟට කතා කරමු.

## යුග පෙරළි...

11 පිටුවෙන්

සාර් පාලනයෙන් හා වැඩවසම්වාදයෙන් බැටකෑ ගොවීන්, කම්කරුවන්, ශිෂ්‍යයින්, සාමාන්‍ය ජනතාව මෙන්ම සාර්ගේ යුද පරාජයෙන් හෙම්බත් වූ හමුදා කොටස්ද ගොනු කරගනිමින් සංවිධානාත්මක සන්නද්ධ අරගලයක් මගින් සාර් පාලනය පෙරළා දැමීමට ලෙනින් නායකත්වය දුන් බෝල්ෂෙවික් පක්ෂයට හැකි විය. මෙය ඉතිහාසයේ සුවිශේෂී අවස්ථාවක් වූයේ වැඩවසම්වාදී රුසියාව ඔක්තෝබර් විප්ලවය සමග සමාජවාදී මඟට පිවිසීමයි.

මේ ආකාරයට ඉතිහාසය වෙනස් කළ අරගලයන් පිළිබඳ අවධානය යොමු කිරීමේදී පෙනී යන්නේ පීඩාවට පත් වූවන් විසින් තමන් පීඩාවට ලක් කරන්නට එරෙහිව සිදුකරන ලද අරගල ඔවුන්ගේ පෞද්ගලික කැමැත්තම මතම සිදුවූවක් නොව ඒ මොහොතේ පැවති සමාජමය වුවමනාව තෘප්ත කළ බවයි. මේ සමාලෝචනයත් සමඟ 'ඉතිහාසය වෙනස් කළ අරගල' ලිපි පෙළ සමාප්ත වේ.

## රට කණපිට...

12 පිටුවෙන්

### ජ.වි.පෙ. නායක අනුර දිසානායක සහෝදරයා...

ජනතා විමුක්ති පෙරමුණ දෙසට එල්ල කරනවා. පරාජයට පත්වූ කණ්ඩායමේත් බලයට ආපු කණ්ඩායමෙත් වරප්‍රසාද අහිමි වුණු කණ්ඩායම්වලත් පොදු සතුරා බවට අද පත්වෙලා තිබෙන්නේ ජනතා විමුක්ති පෙරමුණයි. ඔවුන්ගේ පොදු සතුරා බවට පත්වීම ගැන අපි සතුටු වෙනවා.

### දේශපාලන මණ්ඩල සභික ලාල්කාන්ත සහෝදරයා...

අලුතෙන් පත්වුණු ආණ්ඩුවක් ඉක්මනට ජනතාවට එපා වෙලා නැහැ. ඒත් ඡන්දය දුන් ජනතාවටත් සිවිල් සංවිධානවලටත් මේ ආණ්ඩුවට ඡන්දය දුන්නා කියන්න ලැජ්ජයි. ඒ නිසා අවස්ථාව උදා වෙමින් තිබෙන්නේ මේ සමාජ ක්‍රමය වෙනස් කරන දේශපාලනය කරන ජ.වි.පෙ.ටයි. ඒ නිසා පක්ෂ නායකයින්ට මඩ ගහනවා.

### ජ.වි.පෙ. ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා...

ජනතාව කොයි තරම් බොරු ප්‍රවෘත්ති පිළිගන්නවාද කියනවා නම් කියුබාව කුඩා ළමුන් මස් කර ටින් කරනවා යැයි ඇමරිකාව විසින් ගොඩනැගූ ප්‍රවෘත්තියකට රැවටී කියුබාවේ ළමුන් 14,000ක් ඇමරිකාවට යවන්න එරට ජනතාව කටයුතු කළා කියලා. එනිසා සාමාන්‍ය ජනතාව අල්ලේ පැලවෙන බොරු පවා විශ්වාස කරන තත්වයකට පත්වෙලා. ධනවාදය විසින් මේ සමාජයේ ගොඩනගා තිබෙන්නේම මිත්‍යාව විශ්වාස කරන ජනතාවක්. ඒ නිසා තමයි මෙම මිත්‍යාවන්ට එරෙහිව ජනතාව සමඟ සංවාදයක් අවශ්‍ය වෙලා තිබෙන්නේ. මොකද, මේ මිත්‍යාව අවසන් වන දෙයක් නොවන නිසා.

ලංකාවේ ජ.වි.පෙ. තරම් ප්‍රහාරයට ලක්වූ තවත් පක්ෂයක් නැහැ. 1965 ගොඩනගපු පක්ෂයට 1969දීම ඇත්ත පත්තරෙන් අවලාදයක් නගනවා ජනතා විමුක්ති පෙරමුණ කියන්නේ සමගි පෙරමුණට පහර දෙන්න තරුණයින් එක්රැස් කරන සී.අයි.ඒ. කෙමනක් කියලා. මේ අවලාදය කෙතරම් බලවත් වුණේද කියනවානම් 1970 ජූලි මාසයේ රෝහණ විජේවීර සහෝදරයා 'සී.අයි.ඒ. කාරයෝ' නමින් සම්මන්ත්‍රණයක් පවා පවත්වනවා. 71 අරගලයෙන් පසු සමගි පෙරමුණ ආණ්ඩුවේ ඉලංගරත්න මහත්තයා කිව්වා, ජ.වි.පෙ. බලයට ආවා නම් අවුරුදු 05ට අඩු ළමයින් සහ 55ට ඉහළ පුද්ගලයින් මරා දමනවා කියලා. කොපමණ අසත්‍යයක් වුවත් එය ජනතාව පිළිගත්තා. ඒ නිසා බොරුවක් සමාජගත කරන වෙලාවේ එයට පිළිතුරු දීම අත්‍යාවශ්‍යයි. අපිට අයිතියක් තිබෙනවා, බොරු අවලාද පැළවෙන්න කලින් ඉවත් කරන්න.

මේ තරමට අවලාද ගහපු පක්ෂයක් අදටත් දෙපයින් සිටගෙන ඉන්න එක ගැන ආඩම්බරයක් තිබෙනවා. රෝහණ විජේවීර ලාන්සර් වර්ගයේ කාර් එකක යනවා කිව්වා. ඒකට විජේවීර සහෝදරයා හොඳ උත්තරයක් දුන්නා. 'මාව කොළපොතක තියලා ඇදගෙන යන්න කියලද අපේ සාමාජිකයන්ට කියන්නේ' කියලා. අදත් අපේ සතුරෝ කියනවා ජ.වි.පෙ. සාමාජිකයො දුක් විඳිද්දී නායකයෝ සැප විඳිනවා කියලා. එහෙත් අපේ පක්ෂයේ සහෝදරවරු දන්නවා අපි මොන වගේ සැපක්ද විඳින්නේ කියලා.

අපි පෙනී ඉන්නේ සත්‍යය වෙනුවෙන් පමණයි. අපිට අවලාද නගන්නේ, පුද්ගලික තරහකට නෙවෙයි. ජනතාවගේ සහාය ලබාගෙන ජ.වි.පෙ. පෙරට ආවොත් ධනවාදයෙන් සැප විඳින මහත්වරුන්ට ඒ සැප අහිමි වෙනවා. ඒක පංති ප්‍රශ්නයක්. ඒ සැප නැතිවුණාම ඔවුන් කෝපයට පත්වෙනවා. මාඕ සේතුං වරෙක කිව්වා 'අපි අපේ සාර්ථකත්වය මනින්නේ මිතුරන්ගේ ප්‍රශංසාවලින් නොව සතුරන් නඟන කෝපාවිෂ්ඨ රළු හඬින්' කියලා. අපි අපේ වැඩේ හරියට කරන නිසා අපිට මඩ ගහනවා. අපි ධනවාදයට එරෙහිව දේශපාලනය කරන්නේ නැත්නම් ඔවුන් අපිට මොකටද ගහන්නේ? අනුර සහෝදරයාට අවලාද නගන්නේ ඔහු හරියට වැඩ කරන නිසයි. සතුරන් පක්ෂයේ අර්බුද තියෙනවා කියන්නේ අපි අතර සහෝදරත්වය වැඩි නිසයි.

අපේ සතුරෝ ජ.වි.පෙ.ට අවලාද ගහලා අපිව අවලාද තුළ හිරකරන්න හදනවා. අපි ඒ අවලාදවල හිරවෙන්නේ නැහැ. ලෙනින් රුසියානු සාහිත්‍යයේ කියමනක් උපුටා දක්වමින් මෙසේ කියනවා. 'වස්කා නැමති බළලා හොඳින් ඇහුම්කන් දෙයි. දිගටම කාගෙන යයි.' ඒ නිසා අපි අපේ සතුරන්ට කියනවා ඔබලා අපට ගහන අවලාද අපි බාරගන්නේ නැහැ. ඔබලාම ඒවා තියා ගන්න. ඒ අවලාද අතීතයේත් ආවා. අදත් එනවා. හෙටත් ඒවි. නමුත් ජ.වි.පෙ.ට පැවරුණු කාර්යය ඉතා හොඳින් කරනවා. ජයග්‍රහණය තෙක් පෙරට යනවා. බුරන බල්ලන්ට ඔහේ බුරන්න කියලා අපි අපේ ගමන යනවා.

# නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com


## 2016 මැයි දිනයේ මතක සටහන්...


















## මේ අයුක්තිය තවත් පරම්පරාවකට උරුම කර දිය යුතු නැහැ!

**ජ.වි.පෙ. නායක අනුර දිසානායක සහෝදරයා**

ජනතාව හමුවේ ඇති තෝරාගැනීම තමන් මුහුණ දෙන පීඩාවට යටත් වනවාද නැත්නම් ඊට එරෙහිව සටන් වදිනවාද යන්න බව ප්‍රකාශ කළ ජ.වි.පෙ. නායක අනුර දිසානායක සහෝදරයා, පීඩාවට යටත්වීමට අකමැති සියලු ජනතාවට තම පක්ෂය සමග අත්වැල් බැඳගන්නා ලෙසට ආරාධනා කර සිටියේය.

ඔහු මේ බව පැවසුවේ ජාත්‍යන්තර කම්කරු දිනය වෙනුවෙන් පසුගිය 01වැනි දින කොළඹ බීආර්සී පිටියේ පැවති රතු මැයි දින රැලියේදීය.

"මේ අසාධාරණය, අයුක්තිය තවත් පරම්පරාවකට උරුම කර දිය යුතු නැහැ. මේ සටන අපේ පරම්පරාව විසින් අවසන් කරනු ලබන බව සහතික ලෙස ප්‍රකාශ කරනවා. නව ආර්ථිකයක් නව සමාජයක් වෙනුවෙන් ජන බලය ගොඩනගන මේ මැයි දින වේදිකාව ඒ සටනේ පළමු පියවරයි." ඔහු අවධාරණය කළේය. මෙහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ අනුර දිසානායක සහෝදරයා තම කතාව අවසන් කරමින් මෙසේ පැවසීය.

"මේ රටේ ජාතිවාදයට එරෙහි ජාතික සමගිය ගොඩනගන සියලු දෙනාගේ සම අයිතිය පිළිගන්න එකම වේදිකාවයි තියෙන්නේ. ඒ, ජවිපෙ වේදිකාවයි. එකිනෙකා මත යැපෙන උතුරේත් දකුණේත් ජාතිවාදය මුළුමනින්ම පරාජය කළ යුතුයි. අපි කලින් කෙටි දුර ධාවන තරඟ දිනුවා. රාජපක්ෂ පාලනය ගෙදර යැව්වා. දැන් අපි ප්‍රවේශ වෙලා තියෙන්නේ



මැරතන් තරඟයකට. එය ජයග්‍රහණය කළ යුතුමයි. ලංකාවේ විශාලතම තරුණ ව්‍යාපාරය, ගොවි කම්කරු ජනතාව මේ මැයි දින පෙළපාලියට හා රැලියට පැමිණ තිබෙනවා. කිසිදු අවලාදයකට තර්ජනයකට යටත් නොවන ජනතා විමුක්ති පෙරමුණ ජනතාව ජයග්‍රහණය

**02 වැනි පිටුවට**

## අපට මේ රට හැදීමේ අරගලයක් තිබෙනවා

**ජ.වි.පෙ. ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා**

රනිල් - මෛත්‍රී - මහින්ද මේ රටේ වැඩකරන ජනතාව ශිෂ්‍ය තරුණ කාන්තා ගොවි ධීවර සියලුම ජන කොටස් රැවට්ටා ඇති බව පැවසූ ජ.වි.පෙ. ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා, එම බලවේග ඒකරාශී කරගනිමින් රට ගොඩනැගීමට ජනතා විමුක්ති පෙරමුණට හැකියාව ඇති බව අවධාරණය කළේය.

ඔහු මෙසේ පැවසුවේ රතු මැයි දින රැලිය අමතමිනි.

"අපට මේ රට හැදීමේ අරගලයක් තිබෙනවා. ලෝකයට ආදර්ශවත් රටක් ලෙස පත්වන රාජ්‍යයක් නිර්මාණය කරන්න ඕනෑ. නව ආර්ථිකයක්, නව සමාජයක් වෙනුවෙන් ජන බලය ගොඩනගන රතු මැයි රැලිය අපි හැමදෙනාම පවත්වන්නේ ඒ අරමුණ ඇතිවයි. ණය බර බදු බර වෙනුවට නිෂ්පාදන ආර්ථිකයකට ජනතාව පෙළගස්වන්න ඕනෑ. ජනතාව බද්ධ කරගත් ආර්ථිකයකින් තොරව රට ගොඩගන්න බැහැ. ඒ ආර්ථිකයේ ප්‍රතිලාභ සාධාරණව ජනතාව අතර බෙදෙන්නත් ඕනෑ. නිදහස් අධ්‍යාපනය වෙනුවෙන් 06% ඉක්මවා ගිය මුදලක් වෙන් කරන්න අවශ්‍යතාවය තිබෙනවා. නිදහස් සෞඛ්‍ය සේවාව ඇත්ත අර්ථයෙන් පුළුල් කරන්න ඕනෑ. එහෙම ආර්ථිකයක් හදන්න එ.ජා.ප.යට හෝ ශ්‍රීල.නි.ප.යට බැහැ. ධනපති දේශපාලන



පක්ෂ දෙක පහුගිය අවුරුදු 68ක් පුරා ඒ බව ඔප්පු කර තිබෙනවා. අපේ අයිතීන් සුරකින නවීන සමාජවාදී සමාජයක් ගොඩනගන්නයි අපිට අරගලයක් තිබෙන්නේ."

## මේ කෘතියේ සෑම වාක්‍යයක් අතරේම විජේවීර සහෝදරයාගේ හඬ දෝංකාර දෙනවා...

**ජ.වි.පෙ. නායක අනුර දිසානායක සහෝදරයා**

'71 අප්‍රේල් නඩු විභාගය; විජේවීරගේ හෘදය සාක්ෂිය' නැමති කෘතියේ හැම වාක්‍යයකින්ම විජේවීර සහෝදරයාගේ හඬ ඇසෙන බවත් ඒ භක්තිමත්භාවයෙන් ලාංකේය ජනතාවගේ අරගලය ජයග්‍රහණය කරා රැගෙන යන බවට සපථ කරන බවත් ජ.වි.පෙ. නායක අනුර දිසානායක සහෝදරයා ප්‍රකාශ කළේය.

අනුර සහෝදරයා මේ බව පැවසුවේ 14වැනි දින එම කෘතිය එළිදැක්වීම සඳහා ජ.වි.පෙ. 51වැනි උපන්දිනය වූ පසුගිය 14වැනි දින කොළඹ මහවැලි කේන්ද්‍රයේදී පවත්වන උත්සවයේදීය. වැඩිදුරටත් අදහස් දැක්වූ ඔහු මෙසේද ප්‍රකාශ කළේය.

"අදත් පක්ෂයට එල්ල වෙන ඒ චෝදනාවලට මුහුණ දෙන්න මනස නිරවුල්ව තබා ගැනීමට මේ කෘතියෙන් මනා පිටිවහලක් ලැබෙනවා. විජේවීර සහෝදරයා තරම් මඩ අවලාදවලට මුහුණ දුන් තවත් පුද්ගලයෙක් ඉන්නවා කියලා අපි විශ්වාස කරන්නේ නැහැ. මේ රටට අතිශය ආදරය කරන ලද මේ රටේ ජනතාවට අතිශය ප්‍රේම කරන ලද මිනිසෙක්. ඔහු කියනවා අපේ පංතිය වෙනුවෙන් ජීවිතාන්තය දක්වා වුවත් සිරගත වෙන්න මම සූදානම් කියලා. අවසාන මොහොතේත් කිසිවක් පාවලා නොදුන් මිනිසෙක් තමයි විජේවීර සහෝදරයා. ඒ රෝහණ විජේවීර සහෝදරයා තමයි එක්සත් ජාතික පක්ෂය 88-89 කාලේ අත්අඩංගුවට අරගෙන ඝාතනය කරන්නේ.

ගොඩක් අය උත්සහ කරනවා එජාපය ගැන අපිට පාඩම් කියා දෙන්න. ඒ හැමදෙනාටම අපි කියනවා. එජාපය ගැන අපිට අලුතෙන් පාඩම් කියා දෙන්න එපා. අපි ඒ පිළිබඳව ජීවිතවලින් අත්දැකීම් ලබලා තිබෙනවා. ඒ පිළිබඳව අටුවාටීකා අවශ්‍ය නැහැ. ඇතමුන් අපෙන් අහනවා රෝහණ සහෝදරයා ඝාතනය කිරීමට යුක්තිය ඉල්ලන්නේ නැත්තේ ඇයි කියලා. අපි අපරාධකරුවන්ගෙන් යුක්තිය ඉල්ලන්නේ නැහැ. ඒ වෙනුවෙන් අරගලයක් මහජනයාගේ විනිශ්චයක් අපි බලාපොරොත්තුවෙනවා. එනිසා ඒ අරගලයට නොබියව සහ ශක්තිමත්ව අපි මුහුණ දෙනවා. අපි කිසිවෙක්



අරගලය හමුවේ පලායන්න, නියාලු වෙන්න දණගහන්න සූදානම් නැහැ. මේ කෘතියෙන් නැවත නැවතත් ඒත්තු ගන්වන්නේ ඇටමිදුළු තුළට කාවද්දන්නේ උඹලා උඹලගේ අයිතීන් වෙනුවෙන් සටන් කරපල්ලා කියලයි.

1971 අරගලය පිළිබඳව ජෙයපාලන් කවියා කිවියක් ලියා තිබෙනවා. "අපගේ ගම්බිම් හරිම සරුසාරයි හැබෑමයි... කුමක් වළලා දැමුව මුත් පඳුරුගසමින් යළි යළිත් සුපිපෙයි... හැබෑමයි දළුලා වැඩෙයි." මේ පොළව අතිශය සාරවත්. කුමක් වළලා දැමුවත් යළි යළිත් දළුලා වැඩෙනවා. පඳුරු

**02 වැනි පිටුවට**


## වංචා-දූෂණ සම්බන්ධ අවනඩුව ජනතාව හමුවට ගෙන යා යුතුයි

**ජ.වි.පෙ. දේශපාලන මණ්ඩල සභික සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා**



වංචා-දූෂණවලට ඥාතිකම් කියන දේශපාලනඥයින් දේශපාලනයට පැමිණෙන්නේම වංචා-දූෂණ කිරීම සඳහා යැයි කියා සිටි ජ.වි.පෙ. දේශපාලන මණ්ඩල සභික සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා, ඒ ක්‍රමය වැළැක්වීම කෝප් කමිටුවට පමණක් කළ හැකි දෙයක් නොවන බැවින් මෙම අවනඩුව ජනතාව හමුවට ගෙනයා යුතු බවට අවධාරණය කළේය.

**02 වැනි පිටුවට**


නියමුවා ප්‍රකාශන

විමසීම්

0112785612

ආධාරය
රු.1200.00



බත්තරමුල්ල, පැලවත්ත, පන්නිපිටිය පාරේ 464/20 හි පදිංචි එම්.ටිල්වින් සිල්වා වන මා විසින් අංක 43/20, නුගගහ පෙදෙස, පිළියන්දල පාර, මහරගම පිහිටි නියමුවා ප්‍රකාශන ආයතනයේ මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.